# HARTI



# වාර්ෂික වාර්තාව

## 2019

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| සංස්ථාපනය | 2 |
| පාලක මණ්ඩලය | 4 |
| පාලක මණ්ඩලය රැස්වීම් | 6 |
| විගණන සහ කළමනාකරණ කමිටුව | 6 |
| විධායක සාරාංශය | 7 |
| කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය | 9 |
| කෘෂිසම්පත් කළමනාකරණ අංශය | 20 |
| පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය | 23 |
| අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය | 32 |
| මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය | 41 |
| සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය | 50 |
| පුස්තකාලය | 52 |
| ප්‍රකාශන ඒකකය | 55 |
| වෙනත් ක්‍රියාකාරකම් | 57 |
| 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | 60 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 61 |
| මූල්‍ය වාර්තා | 65 |
| විගණකාධිපතිගේ වාර්තාව 14(2) (සී) | 78 |
| විගණකාධිපතිගේ වාර්තාව 14(2) (සී) පිළිතුරු | 85 |

# සංස්ථාපනය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1972 අංක 05 දරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වසරේ දී ස්ථාපිත කර ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාවස්ථාපිත ආයතනයක් ලෙස එය ක්‍රියාත්මක වේ.

ප්‍රතිපත්ති කේන්ද්‍රීමය පර්යේෂණ දිරි ගැන්වීම, කෘෂිකාර්මික හා ග්‍රාමීය ක්ෂේත්‍රයන්හි පුහුණු අවශ්‍යතා සැපිරීම මෙම ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු වේ.

මෙරට කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස ආරම්භයේ සිට මේ දක්වා වසර 47ක් තිස්සේ සමාජ, ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් සිදු කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සැපයීමෙන් ලද අත්දැකීම්වලින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පොහොසත් ය.

අපගේ ආයතනයේ දැක්ම සහ මෙහෙවර වන්නේ,

**දැක්ම**

ගොවිජන හා ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම

**මෙහෙවර**

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ දක්වා ඇති කාර්යභාරය පහත පරිදි වේ.

1. ගොවිකටයුතු පර්යේෂණ පෝෂණය කිරීම හා උනන්දු කරවීම, ඒවාට සහායවීම සහ සහයෝගය දීම.
2. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, මහජන සංස්ථා සහ සෙසු ආයතන මඟින් කෙරෙන ගොවිකටයුතු පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.
3. කෘෂිකර්මය සංවර්ධනයට බලපාන ආයතනික සාධක හා සම්බන්ධ කරුණු සමීක්ෂණය කිරීම හා ඒවා ගැන පර්යේෂණ පැවැත්වීම.
4. කෘෂිකර්මය සඳහා අවශ්‍ය ඉඩම් ආර්ථිකශීලීව පරිහරණය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණ පැවැත්වීම සහ පර්යේෂණයෙහි යෙදීම.
5. කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීම.
6. ශ්‍රී ලාංකික හෝ විදේශීය ආයතන සම්බන්ධ කර ගෙන හෝ තනිවම හෝ ගොවිකටයුතු පර්යේෂණවලට අදාළ පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හෝ ඒවාට පහසුකම් සකසා දීම. ඊට අදාළ සහතික, ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ සම්මාන සහතික පිරිනැමීම.
7. ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමට අදාළ සාකච්ඡා සහ සම්මන්ත්‍රණ පැවැත්වීමත්, ඊට අදාළ වාර ප්‍රකාශන සහ සඟරා ප්‍රකාශයට පත් කිරීම.
8. කෘෂිකර්මාන්තයට අදාළ කලාපීය ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ආසියානු කලාපයේ රටවල් සමඟ සහයෝගයෙන් ගොවිජන ව්‍යූහයට සම්බන්ධ ගැටලුවලට අදාළ පර්යේෂණ සිදු කිරීම සහ කෘෂිකාර්මික ගැටලුවලට අදාළ තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

**ඉලක්ක**

1. සමාජ, ආර්ථික පර්යේෂණ හා කෘෂිකාර්මික ගැටලු පිළිබඳ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.
2. රජයේ සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ව්‍යාපාරික සහ පර්යේෂණ ප්‍රජාව අතර සමීප සම්බන්ධීකරණය සිදු කිරීම.
3. දැනුම ජනනය හා කාලීනව බෙදාහැරීම තුළින් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම.
4. ජාතික ප්‍රතිපත්ති, ගැටලු සම්බන්ධයෙන් ස්වාධීනව තක්සේරු ඇගයීම් වාර්තා සම්පාදනය කරමින් ජනතාව දැනුවත් කිරීම.
5. කාර්ය මණ්ඩලයේ හැකියාවන් සහ ආයතනයේ දැනුම පදනම පුළුල් කිරීම සඳහා ආයෝජන කිරීම තුළින් සමාජ - ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ හැකියාවන් පුළුල් කිරීම.
6. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධනයට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම.

# පාලක මණ්ඩලය – 2019

| | |
|---|---|
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පාලක මණ්ඩල සභාපති |
| නීල් බණ්ඩාර හපුහින්න මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පාලක මණ්ඩල සභාපති<br>(2019 නොවැම්බර් 28 සිට) |
| කරුණාදාස උඩගේ මහතා | අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)<br>(2019 ජනවාරි සිට) හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| කීර්ති බී. කොටගම මහතා | අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)<br>(2019 පෙබ. සිට සැප්. දක්වා)<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී) (වැ.බ)<br>2019 ඔක්තොම්බර්<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| ආචාර්ය පී.ඩබ්. අලහකෝන් මිය | පාලක මණ්ඩල සාමාජිකා<br>අතිරේක ලේකම් (ගොවිජන සංවර්ධන)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය (2019 මැයි සිට) |
| ර්.ඒ.ආර්. රේණුකා මිය | පාලක මණ්ඩල සාමාජිකා,අතිරේක ලේකම් (සංවර්ධන)<br>ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>(2019 සැප්තැම්බර් සිට) |
| එම්.ආර්.වී.ආර්. මීපුර මහතා | පාලක මණ්ඩල සාමාජික, අධ්‍යක්ෂ,<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,<br>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය (2019 ජනවාරි සිට) |
| වසන්ත ධර්මසේන මහතා | පාලක මණ්ඩල සාමාජික, අධ්‍යක්ෂ,<br>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>(2019 පෙබරවාරි සිට) |
| යූ.ජී. රත්නසිරි මහතා | පාලක මණ්ඩල සාමාජික, අතිරේක ලේකම්<br>(ආර්ථික කටයුතු)<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>(2019 මාර්තු සිට) |
| කේ. පියරත්න මිය | පාලක මණ්ඩල සාමාජිකා, අතිරේක ලේකම්<br>(ප්‍රතිසංවිධාන), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය<br>(මාර්තු) |
| එන්.ජී. පණ්ඩිතරත්න මහතා | පාලක මණ්ඩල සාමාජික, අතිරේක ලේකම් (පාලන)<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය<br>(2019 ජූනි සිට ඔක්තොම්බර් දක්වා) |

| | |
|---|---|
| අරුණි එස්. රණසිංහ මිය | පාලක මණ්ඩල සාමාජිකා, අතිරේක ලේකම් (පාලන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>(2019 මාර්තු සිට ඔක්තොම්බර් දක්වා) |
| බී.එල්.ඩී. බාලසූරිය මිය | පාලක මණ්ඩල සාමාජිකා , අධ්‍යාපන අධ්‍යක්ෂ<br>(කෘෂි හා පාරිසරික අධ්‍යාපන ශාඛාව)<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>(2019 මාර්තු සිට ඔක්තොම්බර් දක්වා) |
| එච්.එන්.එන්. ගුණසේකර මිය | පාලක මණ්ඩල සාමාජිකා, අතිරේක ලේකම් (පාලන)<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය<br>(2019 මාර්තු සිට අප්‍රේල්) |
| එච්.ජී.ජේ.පී. විජේසිරිවර්ධන මිය | පාලක මණ්ඩල සාමාජිකා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් I<br>(පාලන) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය<br>(2019 ජූලි සිට ඔක්තොබර් දක්වා) |
| එස්. සේනානායක මහතා | පාලක මණ්ඩල සාමාජික, අතිරේක ලේකම්<br>(සංවර්ධන හා සැලසුම්)<br>ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය<br>(2019 මාර්තු සිට ඔක්තොම්බර් දක්වා) |
| ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා | පාලක මණ්ඩල සාමාජික, අතිරේක අධ්‍යක්ෂ<br>ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා මහ බැංකුව<br>(2019 මාර්තු සිට ඔක්තොම්බර්) |
| ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් මහතා | පාලක මණ්ඩල සාමාජික, කොමසාරිස් ජෙනරාල්<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| ආර්.එම්.සී.එම්. හේරත් මිය | පාලක මණ්ඩල සාමාජික, ඉඩම් කොමසාරිස් ජෙනරාල්<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා | පාලක මණ්ඩල සාමාජික , කොමසාරිස් ජෙනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| (ඉංජිනේරු) එස්. මෝහනරාජා මහතා | පාලක මණ්ඩල සාමාජික, වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| එස්.එල්. නසීර් මහතා | පාලක මණ්ඩල සාමාජික, සමූපකාර සංවර්ධන<br>කොමසාරිස්. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>(2019 ජනවාරි සිට මැයි දක්වා) |
| සුවින්ද එස්. සිංගප්පුලි මහතා | පාලක මණ්ඩල සාමාජික, සමූපකාර සංවර්ධන<br>කොමසාරිස් සහ සමූපකාර<br>සමිති රෙජිස්ට්‍රාර්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>(2019 ජූනි සිට ඔක්තොම්බර් දක්වා) |
| ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | පාලක මණ්ඩල සාමාජික, ආහාර හා කෘෂිකර්ම<br>සංවිධානයේ සහය නියෝජිත (වැඩසටහන්) |
| බී.ආර්.සී. බණ්ඩාර මහතා | පාලක මණ්ඩල සාමාජික, ලේකම්, පාලක මණ්ඩලය |

## පාලක මණ්ඩල රැස්වීම් - 2019

| රැස්වීම පැවැත්වූ දිනය | සහභාගී වූ සාමාජිකයින් ගණන |
|---|---|
| 1. **2019 ජනවාරි 03** | 07 |
| 2. **2019 පෙබරවාරි 21** | 06 |
| 3. **2019 මාර්තු 28** | 14 |
| 4. **2019 අප්‍රියෙල් 30** | 09 |
| 5. **2019 මැයි 23** | 12 |
| 6. **2019 ජුනි 20** | 11 |
| 7. **2019 ජූලි 25** | 12 |
| 8. **2019 අගෝස්තු 22** | 15 |
| 9. **2019 සැප්තැම්බර් 19** | 17 |
| 10. **2019 ඔක්තොම්බර් 24** | 11 |

## විගණන හා කළමනාකරණ කමිටුව

| | | | | |
|---|---|---|---|---|
| | වසන්ත ධර්මසේන මහතා | (සභාපති) | - | අධ්‍යක්ෂ<br>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 1. | එස්.එල්. නසීර් මහතා | (සාමාජික) | - | සමූපකාර සංවර්ධන කොමසාරිස්<br>සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>(2019 පෙබරවාරි/ජුනි) |
| 2. | සුවින්ද එස්. සිංගප්පුලි මහතා | (සාමාජික) | - | සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (2019 ඔක්තොම්බර්) |
| 3. | ඩබ්.එම්.එම්.බී වීරසේකර මහතා<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | (සාමාජික) | - | කොමසාරිස් ජනරාල් |
| 4. | යූ.එස්.එල්. කුමාර | (නිරීක්ෂක) | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 5. | එස්.ඒ.ඩී.එන්. පෙරේරා<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව | (නිරීක්ෂක) | - | විගණන අධිකාරී |

## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

<u>රැස්වීම පැවැත්වූ දින</u>

2019 පෙබරවාරි 28
2019 ජුනි 06
2019 ඔක්තොම්බර් 11

# විධායක සාරංශය

කෘෂිකර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය අසතුටුදායක වුවත්, ජනගහනයෙන් සියයට 70කට ආසන්න පිරිසකගේ ජීවනෝපාය ඍජුව හෝ වක්‍රව කෘෂිකර්මාන්තය මත පදනම් වී ඇති හෙයින් රටේ සමාජ ආර්ථික පසුබිමෙහි ප්‍රමුඛ ස්ථානයක් කෘෂිකර්මාන්තයට හිමි වේ. පළිබෝධ නාශක භාවිතය අවම කිරීම, නිෂ්පාදනය ඉහළ නංවමින් කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, ඉඩම් පරිහරණයට අදාළ ගැටලු, කෘෂිකර්මාන්තයට දේශගුණික විපර්යාස බලපෑම්, කෘෂිකාර්මික යෙදවුම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධනය අතර සම්බන්ධීකරණයේ ඌනතාව ගොවිජන අංශය අද මුහුණ දෙන අභියෝග අතර වේ. ජාතික ආහාර සුරක්ෂිතතාවයට ප්‍රමුඛතාවය ලබා දී තිබෙන විට ඉහත අභියෝග කඩිනමින් විසඳිය යුතුය.

ගොවිජන පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් පර්යේෂණ 19ක් සහ පුහුණු වැඩසටහන් 7ක් මෙම වසරේ ආරම්භ කර ඇත. පර්යේෂණ අංශ පහක් විසින් එකී පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සිදු කරන ලදී.

කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය විසින් කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල ආයෝජන පිළිබඳ පර්යේෂණයක් සිදු කළ අතර වී වගාවේදී පළිබෝධනාශක භාවිතය අඩු කිරීම සඳහා ඇති අවකාශයන් අවදානම් කළමණාකරණය අවධාරණය කිරීම තුළින් හඳුනා ගැනීම පිළිබඳව තවත් පර්යේෂණයක් ද මේ වසරේ සිදු කර තිබේ.

ඊට අමතරව, හෙළ බොජුන්හල් සහ කාන්තා ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අධ්‍යයනයක් සිදු කළ අතර සුරක්ෂිත ආහාර සහ එම නිෂ්පාදන ප්‍රවර්ධනය කරන කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියක් වන යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP-Good Agriculture Practises) පිළිබඳ තවත් ඇගයීම් පර්යේෂණයක් අවසන් කරන ලදි.

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය පිළිබඳ අගයදාම විශ්ලේෂණයක් සහ පසුගිය දශක දෙක තුළ වී නිෂ්පාදනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් ද සිදු කරන ලදී. පලතුරු සහ එළවළු පරිභෝජන රටාවන් පිළිබඳ පර්යේෂණයකින් ද වැදගත් සොයාගැනීම් අනාවරණය වී තිබේ.

මේ අතර කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ **ඉඩම් බෙදාදීමේ අභිමතාර්ථ හා වත්මන් භාවිතාවන් අතර අනුකූලතාව පිළිබඳ අධ්‍යයනයක් සිදු** කරන ලදී. කල්තියා හඳුනා ගැනීමෙන් පළිබෝධ සහ රෝග මගින් බෝගවලට සිදුවන හානි අවම කිරීම පිළිබඳ ක්‍රියාකාරී පර්යේෂණයක් ද සිදු කෙරෙමින් පවතී.

ඒ අතර, පරිසර හා ජල සම්පත් කළමනාකරණ අංශය විසින් දේශගුණික විපර්යාසයන්ට අනුවර්තී ප්‍රතිචාරයක් ලෙස ආරක්ෂිත බෝගවගාව යටතේ එළවළු වගා කිරීමේ වැදගත්කම පිළිබඳ පර්යේෂණ දෙකක් සිදු කරන ලදී. සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම තක්සේරු කිරීම සහ ඉඩම් ඵලදායිතාවයට සම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමයන්හි බලපෑම පිළිබඳ පර්යේෂණයක් මෙන් ම ශ්‍රී ලංකාවේ නැගෙනහිර බෑවුම ආශ්‍රිත ජල කළමනාකරණය හා පාලන ගැටලු පිළිබඳ පර්යේෂණයක් ද සිදු වෙමින් පවතී.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය විසින් ශ්‍රී ලංකාවේ ගුණාත්මක බීජ අර්තාපල් නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණයක් සිදු කළ අතර ශ්‍රී ලංකාවේ කාලගුණ දර්ශක රක්‍ෂණ යෝජනා ක්‍රමයේ (WII-Weather Insurance Index) කාර්යසාධනය තක්සේරු කිරීම පිළිබඳ සිදු කළ පර්යේෂණයක් මගින් වැදගත් සොයාගැනීම් අනාවරණය විය. තවත් පර්යේෂණයක දී කෘෂිකාර්මික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් මුහුණ දෙන අභියෝග හා දුෂ්කරතා ගවේෂණය කරන ලදී. ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීමේ දී ගොවීන් විසින් සලකා බලන කරුණු පිළිබඳ පර්යේෂණයක් සහ ශ්‍රී ලංකාවේ වී / සහල් අගය දාමය සහ අතරමැදි කන්නයේ දී අතිරේක බෝග වගාව සම්බන්ධ ගැටලු යන පර්යේෂණ දෙක ද ප්‍රගතියක් ලබා ඇති පර්යේෂණ කිහිපයකි.

ශ්‍රී ලංකාවේ පොලිතින් තහනම පිළිබඳ පර්යේෂණයක් සිදු කරමින් මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය, ශ්‍රී ලංකාවේ පොලිතින් බෑග් සහ ලන්ච් ෂීට් තහනමෙහි ඉදිරි ගමන පිළිබඳ තක්සේරුවක් සිදු කර තිබේ. තවත් පර්යේෂණයක දී, සෞඛ්‍යාරක්ෂිත ජල පරිභෝජනයේ ආරක්ෂිත ප්‍රභවයක් ලෙස වැසි ජලය ප්‍රවර්ධනය කිරීමේ විභවය පරීක්ෂා කරන ලදී. ගෙවතු පොල් වගාව වෙනම පර්යේෂණයක කේන්ද්‍රය විය.

මෙම වසරේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වූයේ කාන්තා සවිබල ගැන්වීම, නායකත්වය, සමාජ බලමුළු ගැන්වීම සහ කඩිනම් ග්‍රාමීය ඇගයීම (RRA-Rapid Rural Appraisel ) සහ සහභාගීත්ව ග්‍රාමීය ඇගයීම (PRA- Participatory Rural Aprraisel) කෙරෙහිය.

බාහිර අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති අතර වූ 'ශ්‍රී ලංකාවේ තෝරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි බෝග සඳහා අගය දාමය ශක්තිමත් කිරීම සඳහා වන මූලික අධ්‍යයනය' නමැති පර්යේෂණය අවසන් කර ඇත. මීට අමතරව, කෘෂිකාර්මික වෙළඳපළ මිල තොරතුරු සේවය (AMIS- **Agriculture Market Information Service** ), ජංගම දුරකථන, සතිපතා සහ මාසික දැන්වීම් මගින් මිල දත්ත එක්රැස් කර බෙදා හරින ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක වේ.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රධාන පරමාර්ථයට අනුකූලව යමින් ගොවිජන ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා සැපිරීම හා ප්‍රතිපත්ති මූලික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම පිණිස වූ ආයතනයේ වැඩසැලැස්ම 2019 වර්ෂයේදී සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. 2019 වාර්ෂික වාර්තාව මගින් වර්ෂය තුළ ආයතනයේ වර්ධනයට මෙන්ම ශ්‍රී ලංකාවේ ගොවිජන අංශයේ දියුණුව සඳහා ද සිදු කළ කාර්යයන් හා ශාස්ත්‍රීය කර්තව්‍යයන් සාරාංශ ගත කරයි.**

**කීර්ති බී. කොටගම**
**අධ්‍යක්ෂ**

# 01

# කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය

## අවසන් කළ අධ්‍යයන

### 1. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන ආයෝජනයන් පිළිබඳ විමසුම

පර්යේෂණ කණ්ඩායම :

| | |
|---|---|
| ආර්.ඩී. විජේසිංහ මිය | - සම්බන්ධීකරණ නිලධාරී |
| අයි.පී.පී.එම්. විජේසිංහ මහතා | - සම පර්යේෂක |
| ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර මිය | - සම පර්යේෂක |

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

ශ්‍රී ලංකා රජය විසින් වර්ෂයකට වියදම් කරන සම්පූර්ණ ප්‍රාග්ධන වියදමෙන් සියයට 7-8කට ආසන්න ප්‍රමාණයක් (පොහොර සහනාධාර සඳහා යොදවන මුදල ද ඇතුළත්ව) කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා වැය කරයි (රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020). මේ අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කරනුයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා වේ.

එසේ වුවද, රජය විසින් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා වසරකට රුපියල් බිලියන 200 කට අධික ප්‍රමාණයක් (මුළු ආනයන වියදමෙන් 9%ක් පමණ) වැය කරයි. තවද, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ බොහොමයක් අංශයන්හි ඵලදායිතාවය, විභව අස්වැන්නට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අවම අගයක පවතී.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තෝරා ගත් ආයතන තුනක පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් විමසුමකට ලක් කිරීම මඟින් රාජ්‍ය ආයෝජනයන් ක්ෂේත්‍රයේ සංවර්ධනයට දක්වන දායකත්වය කුමක්ද යන්න අවබෝධ කර ගැනීම සහ එමඟින් එම පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් හි කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

**සොයා ගැනීම්**

පර්යේෂණ අධ්‍යයන ගණන, පර්යේෂණ වියදම් සහ පුහුණු වැඩසටහන් ගණන අනුව ආයතන තුන විවිධ රටාවන් පෙන්වා ඇත. එක් ආයතනයක් ඉහළ නැඹුරුවක් පෙන්නුම් කරන අතර තවත් එකක් උච්චාවචනය වන රටාවක් පෙන්වයි. ආයතන තුනෙහි පර්යේෂණ ප්‍රධාන නිමවුමේ ස්වරූපය ද වෙනස් ය. එනම්, ප්‍රතිපත්ති නිර්දේශයන් සහිත පර්යේෂණ වාර්තා, තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීම, උපදේශනය සැපයීම සඳහා ව්‍යාපාර ඒකක පිහිටුවීම සහ නිෂ්පාදන පිරිවැය අඩු කරන නව බීජ ප්‍රභේද සංවර්ධනය කරන ව්‍යාපෘති වශයෙනි. පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදන මට්ටම අතර පර්යේෂකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර ද්වි පාර්ශ්වික සන්නිවේදනයක් නොමැතිවීම පර්යේෂණ ප්‍රතිලාභ ගොවි ජනතාව වෙත ළඟා නොවීමට මූලිකම හේතුව ලෙස හඳුනාගන්නා ලදී.

**නිර්දේශ**

1. ජාතික සහ ක්ෂේත්‍ර අවශ්‍යතා මත පදනම්ව පර්යේෂණ මැදිහත්වීම් තුළින් විසඳීම සඳහා වඩාත්ම වැදගත් පර්යේෂණයන් හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් පර්යේෂණ ප්‍රමුඛතාකරණය කිරීම

2. පර්යේෂණ ආයතන සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදන ආයතන අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම

3. පර්යේෂණ සහ ව්‍යාප්ති සේවය අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම

4. පර්යේෂණ නිමැවුම් රටේ සංවර්ධනයට දායක කර ගැනීම තහවුරු වීමට ජාතික මට්ටමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම

5. පර්යේෂණ ව්‍යාපෘතින්හි ප්‍රගති සමාලෝචනය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා වඩාත් ඵලදායි ක්‍රමයක් හඳුන්වා දීම

ද පර්යේෂණ ප්‍රජාව දිරිමත් කිරීම සඳහා දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීම

7. ක්ෂේත්‍රයේ ආයතන අතර පර්යේෂණ ද්විකරණයවීම වැළැක්වීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ඇති කිරීම

## 2. වී වගාවේදී පළිබෝධනාශක භාවිතය අඩු කිරීම සඳහා ඇති අවකාශයන් අවදානම් කළමණාකරණය අවධාරණය කිරීම තුළින් හඳුනා ගැනීම පිළිබඳ ව අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| ඒ.කේ.ඒ. දිසානායක මෙනවිය | - සම්බන්ධීකරණ නිලධාරී |
| ආචාර්ය ඩබ්.ඒ.ආර්. වික්‍රමසිංහ මහතා | - සම පර්යේෂක |
| එම්.ඩී.ඩී. පෙරේරා මිය | - සම පර්යේෂක |
| යූ.ඩී.ආර්. උදාරි මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය හා අරමුණු**

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක භාවිතය හේතුවෙන් පාරිසරික හා සෞඛ්‍යමය ගැටලු රැසක් උද්ගත වී ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තුළ පළිබෝධනාශක භාවිතය අවම කිරීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. මෙවන් වටපිටාවක් තුළ මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුළ දැනට පවතින පළිබෝධනාශක භාවිතය අවම කිරීම සඳහා ඇති අවකාශයන් තාක්ෂණික ක්‍රමවේද, අවදානම පිළිබඳ ගොවීන් සතු ආකල්පයන් හා අනෙකුත් සමාජ ආර්ථික සාධක ඇසුරෙන් හඳුනා ගැනීමයි. එලෙසම මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ශ්‍රී ලංකාවේ තිරසාර කෘෂිකර්මාන්තය සංවර්ධනයේ දී ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා සහාය වනු ඇත.

**සොයා ගැනීම්**

ශ්‍රී ලංකාවේ සියලු දේශගුණික කලාප සහ වාරිමාර්ග ක්‍රම යටතේ වී වගාවේ දී බහුලව භාවිතා වන පළිබෝධනාශක කාණ්ඩය 'වල්නාශක' වේ. වී ගොවීන්ගෙන් 87.9%ක් වල් නාශක යෙදීම පුරුද්දක් වශයෙන් සිදු කළහ. වී ගොවීන්ගෙන් 73.9 %ක් කෘමිනාශක යෙදුවේ සැලකිය යුතු මට්ටමක පළිබෝධකයින් හෝ පළිබෝධ ගහන සිටින බව තහවුරු කර ගත් පසුවය.

නිශ්චිත සමානතා විශ්ලේෂණයට අනුව, දිවයිනේ සමස්ත අවදානම් වාරිකය 0.0176ක් බව අනාවරණය විය. එයින් ගම්‍ය වන්නේ ශ්‍රී ලංකාවේ වී ගොවීන් අවදානම් සහගත ලෙස හැසිරෙන බවයි. ගොවි අවදානම් සංජානනය විශ්ලේෂණය කිරීමෙන් හෙළි වූයේ පළිබෝධනාශක භාවිතා කරන විට ගොවීන් ඉහළ සෞඛ්‍ය අවදානමක් (70.9%) සහ පාරිසරික අවදානම්වලට (66.4%) නිරාවරණය වන බවයි. එබැවින් වී ගොවීන්ගෙන් බහුතරයක් පළිබෝධනාශක හේතුවෙන් ඇති වන සෞඛ්‍ය හා පාරිසරික අවදානම පිළිබඳව දැන සිටියහ.

**නිර්දේශ :**

1. පළිබෝධ කළමනාකරණ ක්‍රියාවලියේදී ආර්ථික දේහලීය මට්ටම් සැකසීමේදී, පළිබෝධ කළමනාකරණයේ අවදානම් මානය සහ ගොවීන්ගේ අවදානම් සහගත හැසිරීම සලකා බැලිය යුතු අතර ඒවා ගොවීන්ගේ කළමනාකරණ අරමුණුවලට අනුකූල විය යුතුය.

2. වී ගොවීන්ගෙන් බහුතරයක් ඒකාබද්ධ පළිබෝධ පාලනය වැනි විෂය ක්ෂේත්‍ර පිළිබඳ ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී නොමැති අතර එම පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. එබැවින් වී ගොවීන්ගේ අවදානම් සහගත හැසිරීම සැලකිල්ලට ගනිමින් ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

3. ශ්‍රී ලංකාවේ වී වගාවේ දී බහුලව භාවිතා කරන පළිබෝධනාශක කාණ්ඩය වල්නාශක වේ. එබැවින් විවිධ වූ වී වගා පද්ධතිවල දී වල් පැළෑටිවල ආර්ථික බලපෑම හඳුනා ගැනීම සඳහා වැඩිදුර පර්යේෂණ කිරීම නිර්දේශ කෙරේ.



## 3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් හෙළ බොජුන්හල් සහ එහි කාන්තාවන් පිළිබඳ වත්මන් ප්‍රගතිය ඇගයීමේ අධ්‍යනය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| එම්.ඩී. සුසිලා ලුර්දු මිය | - සම්බන්ධීකරණ නිලධාරී |
| එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මිය | - සහාය පර්යේෂක |
| බී.ඒ.ඩී.සී. බමුණුආරච්චි මිය | - සහාය පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශයේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකය මඟින් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහනෙ හි ප්‍රධාන අරමුණ වන්නේ, 'හෙළ බොජුන්හල් වැඩසටහන' සඳහා කාන්තාවන් සම්බන්ධ කර ගනිමින් ඔවුන් ව්‍යවසායිකාවන් ලෙස පුහුණු කර තිරසර ව්‍යවසායක කාර්යයන් සඳහා යොමු කිරීම හරහා ඔවුන්ගේ පවුලේ ආදායම ඉහළ නැංවීමයි. එසේම රසකාරක, වර්ණකාරකයන්ගෙන් තොර දේශීය ආහාර පරිභෝජන රටාවකට ජනතාව නැඹුරු කරවීමත් ඒ හරහා දේශීය ආහාර ප්‍රවර්ධනය ඇති කිරීමත් අපේක්ෂිත අනෙකුත් අරමුණු වේ.

2004 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කෙරෙන මෙම හෙළ බොජුන්හල් වැඩසටහන පිළිබඳ වත්මන් ක්‍රියාකාරීත්වය, එහි ප්‍රධාන අරමුණ ඉටු වීම පිළිබඳව ඇති ප්‍රගතිය සහ වැඩසටහන තවදුරටත් සාර්ථක වීමට සුදුසු දිශානතීන් හඳුනා ගැනීමේ පුළුල් අරමුණින් 2018/2019 වර්ෂයේ දී මෙම වැඩසටහන විධිමත් ඇගයීමකට ලක් කරන ලදි.

**සොයා ගැනීම්**

හෙළ බොජුන්හල්වලට සම්බන්ධ වූ කාන්තාවන්ගෙන් 98%කට තම පවුලේ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට හෙළ බොජුන්හළ ඉවහල් වී ඇත. එම ආර්ථිකමය ප්‍රවර්ධනය, පවුල තුළ සමාජීය ප්‍රවර්ධනය ඉහළ නැංවීමට ද ප්‍රබල අනුබලයක් සපයා ඇත. පාරිභෝගික නැඹුරුවට අනුව අනෙකුත් ආහාර අලෙවිසැල්වලට නොගොස් හෙළ බොජුන්හල් වෙත පැමිණීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ, දේශීය ආහාර වර්ග සාධාරණ මිලක් යටතේ ලබා ගැනීමේ හැකියාව බොජුහල්වල පැවතීම බව 78%කගේ අදහස විය.

**නිර්දේශ**

1. හෙළ බොජුන්හල්වලට සම්බන්ධ වන ව්‍යවසායිකාවන් ලෙස පුහුණුවට එක්වන කාන්තාවන් අදාළ කාල සීමාව ඇවෑමෙන් අනිවාර්යයෙන් ඉවත් කර නව කණ්ඩායම් බඳවා ගැනීමට ක්‍රියා කිරීම සහ පුහුණුව ලබා ඉවත් වන කාන්තාවන්ව සාමූහික ව්‍යවසායකත්ව ප්‍රවේශයන්ට හා හැකියාව සහිත කාන්තාවන්ට තනි ව්‍යවසායකත්ව ප්‍රවේශයකට යොමු කර ඊට අදාළ මඟ පෙන්වීම සහ උපදේශනය ලබා දීම මඟින් නව ව්‍යවසායක කාර්යයන් බිහි කිරීමට සහය සැපයීම.

2. ආකල්ප වර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පවතින පුහුණු අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ව්‍යවසායකත්ව පුහුණුව සාර්ථක ලෙස නිම කළ බවට සහතික පතක් ලබා දීම හා එම කාන්තාවන්ගේ සවිස්තර නාමාවලියක් කාන්තා කෘෂිකර්ම ව්‍යාපෘති ඒකකය තුළ පවත්වා ගැනීම.

3. නව හෙළ බොජුන්හල් ඉදිකිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පමණක් නොව ඊට පරිබාහිර අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් භාවිතයට නොගන්නා එසේම මෙවැනි වැඩසටහනකට සුදුසු භූමි මේ සඳහා භාවිතා කිරීමේ අවස්ථාව සලසා දීම සහ ගොඩනැඟිල්ල විධිමත් කිරීම යෝජනා කෙරේ.








## 4. ශ්‍රී ලංකාවේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP- Good Agricultural Practises) : තත්ත්වය, අභියෝග සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම

**පර්යේෂණ කණ්ඩායම :**

බී.ඒ.ඩී.සී. බමුණුආරච්චි මිය - සම්බන්ධීකරණ නිලධාරි
එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මිය - සහාය පර්යේෂක
එම්.ඩී. සුසිලා ලූර්දු මිය - සහාය පර්යේෂක

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**අරමුණු සහ විෂයපථය**

ආහාරවල තත්ත්වය සහ ආරක්ෂණය පිළිබඳ කතිකාව වර්තමානයේදී ශ්‍රී ලංකාව තුළ මෙන්ම මුළු ලෝකයේ ද ප්‍රධාන මාතෘකාවක් වන අතර 2016 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් ශ්‍රී ලංකාවේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) මේ සඳහා ඉතා ඵලදායි වැඩසටහනක් ලෙස හඳුනාගැනේ. එනමුත් එම වැඩසටහනේ ව්‍යාප්තිය ඉතා අඩුමට්ටම පවතින බව පැහැදිලි කරුණක් වන අතර ඒ සඳහා බලපාන හේතු සාධක සහ මෙම වැඩසටහනේ යහසාධක හඳුනාගැනීම මෙම අධ්‍යයනය මඟින් බලාපොරොත්තු වේ. මීට අදාළ නියැදියට දිස්ත්‍රික්ක 6කින් (ගම්පහ, කළුතර, බදුල්ල, හම්බන්තොට සහ මාතලේ) වැඩසටහනට සම්බන්ධ වී ඇති සුළු ගොවි මහතුන් 85 දෙනෙක් ඇතුළත් වූහ.

**සොයා ගැනීම් සහ නිර්දේශ**

අධ්‍යයනයේ සොයා ගැනීම්වලට අනුව මෙය ඉතාමත් කාලෝචිත හා අර්ථාන්විත වැඩසටහනක් ලෙස හඳුනාගත හැකි නමුත් වර්තමානයේ එහි නියැළෙන්නන්හට එමඟින් ලැබෙන වරප්‍රසාද පිළිබඳ සෑහිමකට පත් නොවන බව සඳහන් කළ යුතුය. මීට අමතරව එම ගොවින් අපනයන වෙළඳපළ සඳහා නිෂ්පාදන ඉදිරිපත් කිරීමේදී විවිධ ගැටලුවලට මුහුණ දෙන අතර අපනයනකරුවන් සොයා ගැනීමේ ගැටලුවට ප්‍රධාන වශයෙන් මුහුණ දෙයි. මීට අමතරව අපනයනයේ දී අඛණ්ඩ ඉල්ලුමක් නොමැතිවීම, ස්ථාවර මිලක් නොලැබීම සහ ඉහළ නිෂ්පාදන පිරිවැය යන ගැටලුවලට ද මුහුණ දේ. GAP සහතිකය ලබා ගැනීම තුළ ඇති සුවිශේෂත්වය සඳහා නිසි පිළිගැනීමක් සෙසු පොදු ජනතාව අතර නොමැතිවීම මෙම වැඩසටහනේ ප්‍රගමනයට විශාල බාධාවකි. මෙම වැඩසටහන සඳහා ලැබී ඇති ප්‍රචාරණය ඉතාමත් අවම මට්ටමක පවතින බව බහුතර ගොවි මහතුන්ගේ මතය වන අතර ඒ තුළ GAP නිෂ්පාදන සඳහා ඉල්ලුමක් වෙළඳපොළ තුළ නොමැතිවීම නොවැළැක්විය හැකි තත්ත්වයක් ලෙස සඳහන් කළ හැක. තව ද මෙම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා විශේෂ අලෙවිසැල් සුලභව නොමැතිවීම තවත් ගැටලුවකි.

එබැවින් ඉතාමත් පුළුල් ප්‍රචාරණයක් ලබා දීමෙන් GAP සහතිකයේ ඇති වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි. මීට අමතරව ගොවීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ගොවීන් ව්‍යාපාරික ගොවීන් බවට පත් කිරීම සඳහා ක්‍රමවේදයක් සැලසුම් කිරීම මඟින් ලාභදායි ව්‍යාපාරයක් ලෙස GAP වැඩසටහන සඳහා නිෂ්පාදන සැකසීම සහ ඉදිරිපත් කිරීමට නැඹුරුවක් ගොවීන් තුළ ඇති කළ හැක. තව ද, වෙළඳපළ අවස්ථා ලබාගැනීම සඳහා ගොවින්ට සහයෝගය ලබා දෙන අතරම විදේශ වෙළඳපොළ අවස්ථා උදාකරදීමට මුල් අදියරවලදී රජය මඟින් කටයුතු සැලසීම සිදු කළ යුත්තකි. ඒ සඳහා නිෂ්පාදන අපනයනය සඳහා වූ රජයේ ක්‍රියාකාරි සැලැස්ම තවදුරටත් ඉදිරියට ගෙන යාම මඟින් අපනයන විභවතා වැඩිකළ යුතුය. වැඩසටහන් හා සම්බන්ධ වූ මූලික අවස්ථාවල දී යෙදවුම් ලබා දීම මඟින් පෞද්ගලික අංශය වැඩසටහන සඳහා සම්බන්ධ කළ යුතු අතරම ගිවිසුම්ගත ක්‍රමවේදයක් තුළින් නිමැවුම විදේශීය වෙළඳපළ සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසාගත හැක. තවද, වගා හානි අවස්ථාවල දී විශේෂයෙන් GAP ගොවීන් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීම මඟින් මෙම වැඩසටහන සඳහා ගොවීන් ආකර්ෂණය කරගැනීමට අවස්ථාව

සැලසෙන අතර අවම වශයෙන් ප්‍රධාන වගා ප්‍රදේශවල ශීතාගාර පහසුකම්, එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම සිදුකළ යුතුය. තවදුරටත් ජංගම රථ මඟින් GAP නිෂ්පාදන අලෙවි කිරීම සහ රෝහල් සඳහා GAP එළවළු සහ පලතුරු යොදා ගැනීම මඟින් එම නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් ඇතිකරගත හැක. එමෙන්ම රජය මඟින් සාධාරණ සහතික මිලක් GAP නිෂ්පාදන සඳහා ලබා දීමට කටයුතු කළ යුතු බව මෙම අධ්‍යයනයෙන් නිර්දේශ කෙරේ.





## 5. ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| එම්.ඩී. සුසිලා ලූර්දු මිය | - සම පර්යේෂක |
| බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල**

**විෂයපථය සහ අරමුණු**

කිරි කර්මාන්තය සංවර්ධනය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයේ ආදායම් උත්පාදනය හා රැකියා උත්පාදනය කිරීමේ හැකියාව මෙන්ම ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වැදගත් අංගයකි. එසේ වුවද ශ්‍රී ලංකා කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේදී මුහුණ පෑමට සිදු වන බාධක කිහිපයක් හඳුනා ගන්නා ලදී. නිෂ්පාදකයින්ගේ සිට සකසන්නන් දක්වා හෝ පාරිභෝගික මට්ටම දක්වා කිරි සහ කිරි නිෂ්පාදනවල වටිනාකම් දාමය විශ්ලේෂණය කිරීම සහ දාමයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

**සොයා ගැනීම් :**

කිරි ගොවිතැන සඳහා තරුණ තරුණියන් සම්බන්ධ වීම අවම මට්ටමක පවතින අතර දැනට එම කර්මාන්තයෙහි නිරත වී සිටින බහුතරයකගේ ප්‍රධාන රැකියාව එය වේ. ඉඩම් යනු සීමිත සාධකයක් වන අතර එය නිෂ්පාදනයට ද බාධා කරයි.ගොවීන් වැඩි වශයෙන් සතුන්ට වැඩි වියදමකින් සාන්ද්‍රණය ලබා දෙන්නේ සාන්ද්‍රිත ආහාර නොමැතිව අස්වැන්න වැඩි කළ නොහැකි බව විශ්වාස කරන බැවිනි. කිරිවලින් වැඩි කොටසක් සැකසෙන්නේ විධිමත් එකතුකරන්නන් විසින් බව අධ්‍යයනයෙන් හෙළි වේ. කිරි භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන සැකසීම ලාභදායී වේ.

**නිර්දේශ**

1. ගව රංචුවක සිටින කිරි ගවයින් සංඛ්‍යාව ඉහළ දැමිය යුතුය.

2. ඉහළ ආදායමක් ලබා ගැනීම සඳහා කිරි දෙන සතුන් කිරි දෙන චක්‍රය තුළ නිසි ලෙස කළමනාකරණය කළ යුතුය.

3. නිවැරදි පරිමාණයෙන් සත්ත්ව ආහාර ලබා දීම හා අවශ්‍ය ජලය සැපයීම පිළිබඳව ගොවීන් දැනුවත් කළ යුතුය. සාන්ද්‍රිත ආහාර පිරිවැය සාධාරණ ලාභ ආන්තිකයක් සඳහා සකස් කළ යුතුය.







## සිදු කරමින් පවතින අධ්‍යයන

### 1. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයට රජයේ ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| එම්.ඩී.ඩී. පෙරේරා මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| ආචාර්ය ඩබ්.ඒ.ආර්. වික්‍රමසිංහ මහතා | - සහාය පර්යේෂක |
| ඒ.කේ.ඒ. දිසානායක මෙය | - සම පර්යේෂක |
| යූ.ඩී.ආර්. උදාරි මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

නිදහසින් පසු බලයට පැමිණි සෑම රජයක්ම රටේ වී නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගත්තේය. සහල් ඇතුළු ආහාර බෝගවල ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සහ විවෘත වෙළඳපොළේ මිල ස්ථාවර කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එබැවින් සහල්වල ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පසුගිය දශක දෙක තුළ ක්‍රියාත්මක කරන ලද රජයේ ප්‍රතිපත්ති ඇගයීමට මෙම අධ්‍යයනය මඟින් පියවර ගැනේ.

**වත්මන් ප්‍රගතිය:**

දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය අවසන් කර ඇත. පර්යේෂණ වාර්තාව ලිවීම සිදු කරමින් පවතී.

### 2. ශ්‍රී ලංකාවේ එළවළු සහ පලතුරු පරිභෝජන රටා සහ ඒ කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| යූ.ඩී.ආර්. උදාරි මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| ඒ.කේ.ඒ. දිසානායක මෙය | - සහාය පර්යේෂක |
| එම්.ඩී.ඩී. පෙරේරා මිය | - සහාය පර්යේෂක |
| ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. වික්‍රමසිංහ මහතා | - සහාය පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය හා අරමුණු :**

එළවළු සහ පලතුරු පරිභෝජනය ක්ෂුද්‍ර පෝෂක ඌනතාවයන් අවම කිරීමට ඇති වඩාත්ම ලාභදායි පියවරක් වන අතර ප්‍රමාණවත් නොවන එළවළු සහ පලතුරු පරිභෝජනය, බෝ නොවන රෝග වැළඳීමේ අවදානම වැඩි කරයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව, දෛනික ඒක පුද්ගල එළවළු සහ පලතුරු අවශ්‍යතාවය ග්‍රෑම් 400ක් වුව ද ශ්‍රී ලංකාවේ දෛනික ඒක පුද්ගල එළවළු සහ පලතුරු පරිභෝජනය නිර්දේශිත මට්ටමට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතියි. එමනිසා නිරෝගී ප්‍රජාවක් බිහි කිරීමේ අභිමතාර්ථ සපුරා ගැනීමේ දී, දෛනික ඒක පුද්ගල එළවළු සහ පලතුරු පරිභෝජනය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වන අතර දැනට පවතින පරිභෝජන රටාවන් සහ ප්‍රමාණයන් පිළිබඳ දැනුම වැදගත් වේ. එබැවින් එළවළු සහ පලතුරු පරිභෝජන ප්‍රමාණ සහ මිල දී ගැනීමේ රටාවන්, පරිභෝජනය සඳහා බලපාන සාධක සහ පරිභෝජනය ඉහළ නැංවීමට ඇති බාධක සහ විභවතාවයන් හඳුනා ගැනීමට මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කරයි. එම දැනුම ප්‍රජාව තුළ සෞඛ්‍ය සම්පන්න ආහාර සහ පෝෂණ රටාවන් ප්‍රවර්ධනය සඳහා ඉවහල් වනු ඇත.

**ප්‍රධාන අරමුණ:**

ගෘහ ඒකකවල එළවළු සහ පලතුරු පරිභෝජන රටාව සහ ඒ කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම තුළින් දෛනික ඒක පුද්ගල එළවළු සහ පලතුරු පරිභෝජනය නිර්දේශිත මට්ටම කරා ළඟා කර ගැනීමට අවශ්‍ය උපාය මාර්ග සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

**වර්තමාන ප්‍රගතිය:**

නාගරික, ග්‍රාමීය සහ වතු යන අංශ නියෝජනය කරමින් තෝරා ගත් ගෘහ ඒකක 450ක් යොදා ගනිමින් දිස්ත්‍රික්ක 14ක, දත්ත රැස් කිරීම සිදුකෙරිණ. දත්ත විශ්ලේෂණය සහ වාර්තාව සකස් කිරීම සිදුකරමින් පවතියි. මෙම අධ්‍යයනය 2019 වසරේ මාර්තු මස ආරම්භ වූ අතර 2020 වර්ෂයේ සැප්තැම්බර් මස අවසන් කිරීමට අපේක්ෂිත ය.

# 02

## කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශය

### අවසන් කළ අධ්‍යයන

1. **ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීමේ අභිමතාර්ථ හා වත්මන් භාවිතාවන් අතර අනුකූලතාව**

**පර්යේෂණ කණ්ඩායම** :

| | | |
|---|---|---|
| | ආර්.එම්.ඩී.එච්. රත්නායක මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| | ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන මිය | - සම පර්යේෂක |
| | ඩී.එම්.ඒ.සී. දිසානායක මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

1935 ඉඩම් සංවර්ධන ආඥා පනත (LDO – Land Development Ordinance) මත පදනම්ව ක්‍රියාත්මක කරන ලද ඉඩම් බැහැර කිරීමේ වැඩසටහන් තුළින් ශ්‍රී ලංකාවේ ඉඩම් නොමැති බොහෝ දෙනෙකුට ප්‍රතිලාභ අත්කර දී තිබේ. මෙම ඉඩම් නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දී ඇතත්, වර්තමානය වන විට එම ඉඩම් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගන්නේද යන්න සැක සහිතය. මෙම අධ්‍යයනයෙන් 2012 සිට 2018 දක්වා අනුරාධපුර, කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්කවල බෙදා හරින ලද රජයේ ඉඩම්වල වර්තමාන ඉඩම් පරිහරණ රටාව ගවේෂණය කිරීමට කටයුතු කරන ලදි.

**සොයා ගැනීම් :**

මුල් දීමනාපත්‍ර හිමි ඉඩම්ලාභීන්ගෙන් බහුතරයක් ඉඩම් කොටස් තමන් යටතේ රඳවා ගනිමින් භාවිතා කරන අතර තම දරුවන්, ඥාතීන් හෝ ඥාතීන් නොවන වෙනත් පිරිසක් ඉතිරි කොටස් ප්‍රයෝජනයට ගනිති. ඉඩම් පරිහරණය නේවාසික, කෘෂිකාර්මික හා පුරන් ලෙස වර්ගීකරණය කර ඇත. නේවාසික පදිංචිය සඳහා ඉඩම් ලබා දීම අතින් ඉඩම් ආඥා පනතෙහි ප්‍රධාන පරමාර්ථය බොහෝ දුරට සාක්ෂාත් කර ගෙන ඇති බව එහි දී සොයා ගන්නා ලදි.

අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි කෘෂිකාර්මික ඉඩම්වල පොල්, කජු, අඹ, දෙහි, දොඩම් සහ කෙසෙල් වැනි බහු වාර්ෂික භෝග වගා කර ඇති අතර වී, උඳු, රටකජු, මෑ, තල, පිපිඤ්ඤා, පතෝල වැනි බෝග සුළු පරිමාණයෙන් වගා කර ඇත. අඩු ඉඩම් ප්‍රමාණයක් කුඩා ව්‍යාපාර සහ ස්වයං රැකියා ක්‍රියාකාරකම් වැනි වෙනත් ආදායම් උත්පාදනය කරන ව්‍යාපාර සඳහා භාවිතා කර ඇත.

**නිර්දේශ** :

1. ඵලදායී ඉඩම් පරිහරණයක් සඳහා කෘෂිකාර්මික ඉඩම් බෙදා දීමේ දී ඒවායේ ඉඩම් යෝග්‍යතාව තීරණය කර ඒ අනුව ඉඩම් බෙදා දීම සිදු කළ යුතුය.
2. ඵලදායී ඉඩම් පරිහරණය පිළිබඳ සහ දීමනාපත්‍රලාභීන් මුහුණ දෙන ගැටලු පිළිබඳ පසු විපරම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතුය.

3. ඉඩම් පරිහරණය පිළිබඳ ඉඩම් සංවර්ධන ආඥා පනතේ අන්තර්ගත රෙගුලාසි සහ අනුප්‍රාප්තිකයන් නම් කිරීමේ වැදගත්කම පිළිබඳ දිමනාපත්‍රලාභීන් තුළ දැනුවත්භාවය ඇති කළ යුතුය.

**සිදු කරමින් පවතින අධ්‍යයන**

## 2. ආහාර බෝගවල රෝග පළිබෝධ පාලනය පිළිබඳ තොරතුරු ජංගම දුරකථන යෙදවුම ඔස්සේ සන්නිවේදනය කිරීමේ ව්‍යාපෘතිය

**පර්යේෂණ කණ්ඩායම** :

| | |
|---|---|
| එම්.බී.එෆ්. රිෆානා මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| පී.ආර්. වීරක්කොඩි මිය | - සම පර්යේෂක |
| ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන මිය | - සම පර්යේෂක |
| ඩී.එම්.ඒ.සී. දිසානායක මහතා | - සම පර්යේෂක |
| විරාජිත් කුරුප්පු මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

රෝග-පළිබෝධ පාලනය සම්බන්ධයෙන් තහවුරු කළ තත් කාලීන තොරතුරු ගොවීන් වෙත ගලා නොයෑමේ ගැටලුවට විසඳුමක් ලෙස ඕස්ට්‍රේලියාවේ වෙස්ටර්න් සිඩ්නි සරසවිය (Western Sydney University), කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හාපුහුණු කිරීමේ ආයතනය අතර සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස මෙය ක්‍රියාත්මක විය.

කෘෂිකාර්මික බෝගවල පළිබෝධ සහ රෝග (P&D) පාලනය හා කළමනාකරණය ඉහළ අස්වැන්නක් ලබාගැනීම සහ ගොවි ආදායම ඉහළ නැංවීම කෙරෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සාම්ප්‍රදායික ක්‍රම හැරුණු විට ශ්‍රී ලංකාවේ ගොවීන්ට පළිබෝධ සහ රෝග වැළැක්වීම සඳහා නිවැරදි හා අවබෝධ කරගත හැකි තොරතුරු ලබා ගැනීමට පවතිනුයේ සීමිත ප්‍රවේශයක් වන අතර විශේෂයෙන් පළිබෝධ පැතිරීමේ දී ඒවා වැළැක්වීමට පියවර ගත යුතුය.

එවැනි සන්නිවේදන අඩුපාඩු නිසා දැඩි බෝග හානි සිදුවිය හැකිය. එබැවින් මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වූයේ රෝග-පළිබෝධ පාලනය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ගොවීන් වෙත ලබාදීම තුළින් ආහාර බෝග වගාවන් හි රෝග පළිබෝධ සාර්ථක ලෙස පාලනය කිරීම සඳහා ගොවීන්ට සහය වෙමින් කෘෂි ව්‍යාප්ති සේවාව ශක්තිමත් කිරීමයි.

මෙම පරිශීලක කේන්ද්‍රීය ජංගම දුරකථන යෙදවුම විශේෂිත මොඩියුල හයකින් සමන්විත වේ. ඉන් පළමුවැන්න තුළ, ගොවි මහතා හඳුනාගැනීමේ තොරතුරු ද, දෙවැන්න තුළ වගා කල හැකි ඉඩම් හා වගා කරන බෝග පිළිබඳ තොරතුරු ද ඇතුළත් වේ. බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා අනුගමනය කළ යුතු වගා පිළිවෙත් තෙවැනි මොඩියුලය තුළ ගැබ් වේ. මෙම යෙදවුමේ විශේෂත්වය වන්නේ රෝග-පලිබෝධ නිරීක්ෂණ හා ඒවා පාලනය සම්බන්ධයෙන් ගොවියා/ගොවිලිය හා කෘෂිකර්ම උපදේශක අතර ද්වි-මාර්ගික තත්ත්වය කාලීන සන්නිවේදනය සඳහා සකස් කර ඇති මොඩියුලය යි. බෝග විශේෂිත ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණ පිළිවෙත් හා වගා කාලසටහනට අනුගත වගා පිළිවෙත් පිළිබඳ නිතිපතා දැනුවත්කිරීම් අවසන් මොඩියුලවල අන්තර්ගත වේ.

**වර්තමාන ප්‍රගතිය**

අධ්‍යයන නියැදිය පොළොන්නරුව, කුරුණෑගල සහ මාතර දිස්ත්‍රික්කවලින් තෝරාගත් වී ගොවීන් 180 දෙනෙකුගෙන් සමන්විත වූ අතර මූලික සමීක්ෂණය අවසන් කර ඇත. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතුපර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා වෙස්ටර්න් සිඩ්නි විශ්වවිද්‍යාලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි බහු විෂයික පර්යේෂණ කණ්ඩායමක් එක්ව මෙම ජංගම යෙදුම වන "ලේඩිබර්ඩ්" සංවර්ධනය කිරීම සඳහා එක්ව කටයුතු කරමින් සිටිති.

ලොකු ළූනු සඳහා මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ගොවීන් 120 දෙනෙකුගේ නියැදියක් සමඟ මෙම ජංගම යෙදුම තවදුරටත් වැඩි දියුණු කෙරෙමින් පවතින අතර 2020 යල කන්නයට පෙර භාවිතයට යොදා ගැනීම සිදු කෙරේ.





# 03

## පාරිසරික හා ජලසම්පත් කළමනාකරණ අංශය

### අවසන් කළ අධ්‍යයන

### 1. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තෝරාගත් බෝග වගා පද්ධතීන්ට අදාළ ගොවීන්ගේ දේශගුණික විපර්යාසවල බලපෑමට ගොදුරුවීමේ අවධානම පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| ජී.ජී.ද.එල්.ඩබ්. සමරසිංහ මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - සම පර්යේෂක |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම පර්යේෂක |
| ටී.පී. මුණවීරගේ මිය | - සම පර්යේෂක |
| ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර මිය | - සම පර්යේෂක |
| එම්.පී.එන්.එම්. ඩයස් මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

දේශගුණික විපර්යාසයන්හි තීව්‍ර බලපෑම් අවම කිරීම සඳහා අනුවර්තන ක්‍රමෝපායයන් සැලසුම් කිරීමේ දී ප්‍රයෝජනවත් වන්නා වූ වැදගත් මෙවලමකි අදාළ ජන ප්‍රජාවගේ අවධානම තක්සේරු කිරීම.

මෙරට ආහාර නිෂ්පාදන බඳුන ලෙස සැලකෙන වියළි කලාපයේ ශ්‍රම බලකායෙන් වැඩි ප්‍රතිශතයක් කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටිති. මෙම අධ්‍යයනය මඟින් අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තෝරාගත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන පද්ධතීන් හා සම්බන්ධ ගොවි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්හි බලපෑමට ගොදුරුවීමේ සාපේක්ෂ අවදානම තක්සේරු කිරීමයි.

**සොයා ගැනීම්**

ගෘහමූලිකයාගේ අධ්‍යාපන මට්ටම, තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව, ගොවීන්ගේ අවධානම අවම කිරීමට උපකාරී වේ. යම් ක්ෂේත්‍ර බෝගයක් වගා කරන භූමි ප්‍රමාණය වැඩිවීම සහ පූර්ණ කාලීන ගොවියෙකු වීම යන සාධක ගොවීන්ගේ දේශගුණික විපර්යාසයන්ට ඇති අවධානම වැඩි කරනු ලබයි.

බෝග වගා කරනු ලබන ප්‍රදේශය අනුව දේශගුණික විපර්යාසයන්ට ඇති අවධානම විශාල වශයෙන් වෙනස් වන අතර අධ්‍යයනය සිදු කරන ලද දිස්ත්‍රික්ක අතරින් වැඩිම අවධානමක් ඇති දිස්ත්‍රික්කය හම්බන්තොට වන අතර මීළඟට පිළිවෙළින් අනුරාධපුර හා මොණරාගල දිස්ත්‍රික්ක දැක්විය හැකිය.

භූගෝලීය පිහිටීම හා සමාජ, ආර්ථික විචල්‍යයන්ගේ ඇති වෙනස්කම් හැර අධ්‍යයනය කරන ලද විවිධ බෝග නිෂ්පාදන පද්ධතීන්හි දේශගුණික විපර්යාසයන්ට ඇති අවධානම වැඩි කරවන අනෙකුත් සාධක බොහෝ දුරට සමාන වේ.

**නිර්දේශ**

1. වාරිමාර්ග යටිතල පහසුකම්, අතිරේක ජල සම්පාදන පහසුකම් සහ ගොවීන්ට වාරිමාර්ග ජලය ලබා ගැනීමේ හැකියාව හා කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ජල කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා වැඩියෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

2. දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීමට මෙන්ම ගොවිතැන් කටයුතුවල ලාභදායීතාවය ඉහළ නැංවීමට වාරිමාර්ග කාර්යක්ෂමතාව සහ ජල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් ජල සම්පාදන ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කළ යුතුය.

3. දේශගුණික විපර්යාස සහ දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් කෙරෙහි අඩු සංවේදීතාවයක් ඇති ජීවනෝපාය විකල්පයන් හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම යෝජනා කෙරේ.

4. දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට ලක්වීමේ අවධානම අඩු කිරීම සඳහා සහ ඒවාට අනුහුරුවීමේ හැකියාව වැඩි කිරීම සඳහා කාලගුණික හා දේශගුණික පරාමිතීන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා දීම, කෘෂි යෙදවුම් සඳහා වන ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම සහ නවතම සහ වැඩි දියුණු කරන ලද තාක්ෂණයන් පිළිබඳව ගොවීන්ට පුහුණු වීම් ලබා දීම සිදු කළ යුතුය.

## 2. දේශගුණික විපර්යාසයන්ට අනුවර්ති ප්‍රතිචාරයක් ලෙස ආරක්ෂිත බෝග වගාව යටතේ එළවළු වගාව

පර්යේෂණ කණ්ඩායම :

| | |
|---|---|
| එම්.පී.එන්.එම්. ඩයස් මිය | - සම්බන්ධීකරණ නිලධාරිනි |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම පර්යේෂක |
| ටී.පී. මුණවීරගේ මිය | - සම පර්යේෂක |

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

වගාකන්න අනුව එළවළු නිෂ්පාදනය එළවළු වගාවේ ප්‍රධානම ගැටලුවක් වන අතර ප්‍රධාන කන්නවල දී නිෂ්පාදනය ඉහළ යන අතර අවාරයේ දී නිෂ්පාදනය අඩු වේ. වසර පුරා අඛණ්ඩව පවතින ඉල්ලුම සපුරාලීම සඳහා එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීම අවශ්‍ය වන අතර ලංකාවේ එළවළු නිෂ්පාදනය ඉහළම ප්‍රදේශයක් වන වියළි කලාපය තුළ ඒ සඳහා විශාල හැකියාවක් පවතී.

වියළි කලාපයේ කෘෂිකර්මාන්තය සඳහා පවතින ප්‍රධාන ගැටලු වන අහිතකර දේශගුණික තත්ත්වයන්ගේ බලපෑම අවම කර ගනිමින් ජලය ඇතුළු අනෙකුත් සීමිත සම්පත් කාර්යක්ෂමව භාවිතා කරමින් එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අනුවර්ති ක්‍රමයක් ලෙස ආරක්ෂිත බෝග වගාව හඳුනාගෙන ඇත.

එබැවින් සීමිත සම්පත් හා ආන්තික දේශගුණික තත්ත්වයන් යටතේ වසර පුරා එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීමට වියළි කලාපය තුළ ආරක්ෂිත බෝග වගාව යොදා ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

**සොයා ගැනීම් :**

වියළි කලාපීය එළවළු ගොවීන් විසින් බහුලව භාවිතා කරන ආරක්ෂිත ගෘහ ආකාරය 'වැසි ආවරණ' වේ. ආරක්ෂිත බෝගවගාව පිළිබඳ තාක්ෂණික දැනුමක් නොමැති වීම, ආරක්ෂිත බෝග වගා පද්ධති ඉදි කිරීම සඳහා මුදල් නොමැතිවීම වියළි කලාපීය එළවළු ගොවීන්ට ඇති ප්‍රධාන බාධාවන් ලෙස අනාවරණය විය.

නිර්දේශ**:**

1. වියළි කලාපය සඳහා සුදුසු ආරක්ෂිත බෝග වගා පද්ධති හඳුනා ගැනීම සඳහා පර්යේෂණ සැලසුම් කළ යුතුය.

2. ක්ෂුද්‍ර වාරිමාර්ග ශිල්පීය ක්‍රම භාවිතා කිරීම, පාරිසරික සාධක පාලනය කිරීම සඳහා අඩු වියදම් ක්‍රමවේදයන් භාවිතා කිරීම සහ ඉදිකිරීම් පිරිවැය අඩු කිරීම ආරක්ෂිත ගෘහයන් සැලසුම් කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක වේ.

3. ආරක්ෂිත බෝග වගා තාක්ෂණයන් පිළිබඳව වන පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය.

**සිදු කරමින් පවතින අධ්‍යයන**

## 1. මධ්‍ය කඳුකරයේ නැගෙනහිර බෑවුම ආශ්‍රිත ජල කළමනාකරණය සහ පාලන ගැටලු පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| ජී.ජී.ද.එල්.ඩබ්.සමරසිංහ මිය | - සම පර්යේෂක |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම පර්යේෂක |
| ටී.පී. මුණවීරගේ මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු** :

විවිධ පාර්ශ්වකරුවන් අතර ජලය බෙදා හැරීම හා ජල භාවිතය නියාමනය කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් නොමැතිවීම සහ ජල සම්පත භාවිතය පිළිබඳ ඇතිවන ආරවුල් විසඳීම සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් නොමැතිවීම මධ්‍ය කඳුකරයේ දේශගුණික විපර්යාසයන්ට පාත්‍රවන නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල එවැනි ආරවුල් උත්සන්න වීමට බලපා ඇති ප්‍රධාන හේතූන් වෙයි. තවද, විවිධ පාර්ශ්වකරුවන් අතර සාධාරණ ලෙස ජලය බෙදා හැරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම මෙන්ම ජල ගැටුම් නිරාකරණය සඳහා ආයතනික විධිවිධානවල අවශ්‍යතාවය පර්යේෂණ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත.

එබැවින් මෙම අධ්‍යයනයෙන් මධ්‍ය කඳුකරයේ දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට පාත්‍රවන නැගෙනහිර බෑවුම්වල ජල කළමනාකරණ ගැටලු විමර්ශනය කරනු ලබන අතර විවිධ පාර්ශ්වකරුවන් හා කණ්ඩායම් අතර ජලය ක්‍රමවත්ව බෙදාහැරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් යෝජනා කරනු ඇත. විවිධ අවශ්‍යතා ඇති විවිධ ජල

පරිභෝජන කණ්ඩායම් හඳුනා ගැනීම මෙන්ම විවිධ බෝග නිෂ්පාදන පද්ධතිවල ඉඩම් ප්‍රමාණය පුළුල් වීම/හැකිළීම හඳුනා ගැනීම ද අපේක්ෂා කෙරේ. තවද, අවාසිදායක ජල පරිභෝජන කණ්ඩායම්/කණ්ඩායම්වල ජීවනෝපායයන් සහ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවයට ජල හිඟය නිසා සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම සහ විවිධ පාර්ශ්වකරුවන් සඳහා පිළිගත හැකි ජල කළමනාකරණ යාන්ත්‍රණයක් යෝජනා කිරීම වෙනත් අරමුණු වේ.

## 2. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ඉඩම්වල ඵලදායීතාවය කෙරෙහි සම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමයන්හි (තට්ටු මාරු සහ කට්ටි මාරු) බලපෑම පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| ටී.පී. මුණවීරගේ මිය | - සම්බන්ධීකරණ නිලධාරි |
| ජී.ජී.ද.එල්.ඩබ්.සමරසිංහ මිය | - සම පර්යේෂක |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

*තට්ටුමාරු සහ කට්ටිමාරු* යනු පහතරට හා මැදරට තෙත් කලාපයේ කුඹුරුවල භාවිතා වන කලාපයන්ටම ආවේණික වූ ඉඩම් භුක්ති ක්‍රමයකි. මෙම ක්‍රම දෙක පිළිබඳව අධ්‍යයනයන් ඉතා සීමිත සංඛ්‍යාවක් පවතින අතර එම පද්ධතීන්හි වටිනාකම් පිළිබද ප්‍රබල අදහස් මෙන්ම පරස්පර විරෝධී අදහස් ද ඒ තුළ ඉදිරිපත් කර තිබේ. තට්ටුමාරු - කට්ටිමාරු ක්‍රමයේ ස්වභාවය හා බලපෑම් බොහෝ දුරට එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට වෙනස් වේ. එබැවින්, මෙම අධ්‍යයනයේ අවධානය යොමු වී ඇත්තේ, ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ කුඹුරු ඉඩම්වල ඵලදායිතාවය සඳහා තට්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් බුක්ති ක්‍රමයෙහි ඇති බලපෑම විමසා බැලීම සහ ඒ නිසා ඇති වී ඇති ගැටලු අවම කරගැනීම සඳහා සුදුසු විසඳුම් සොයා බැලීමයි.

මෙම අධ්‍යයන අරමුණු අතර තට්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් බුක්ති ක්‍රමයේ ආවේණික ලක්ෂණ හඳුනාගැනීම සහ මෙම ඉඩම් පරිහරණ රටාව නිසා කෘෂිකාර්මික ඵලදායිතාවයට ඇති වී ඇති බලපෑම අධ්‍යයනය කිරීම ද සිදුවේ. පවත්නා කෘෂිකාර්මික / ගොවිජන ක්‍රමය තුළ මෙම භුක්ති ක්‍රමය කෙරෙහි ගොවීන්ගේ ආකල්ප ගවේෂණය කරනු ලබන අතර මෙකී විශේෂිත ඉඩම් බුක්ති ක්‍රමයට අදාළ ඵලදායිතා ගැටලුව විසඳීම සඳහා පිළියම් ද අධ්‍යයනය තුළින් යෝජනා කෙරේ.

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තට්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් බුක්ති ක්‍රමය පවතින ප්‍රධාන දිස්ත්‍රික්ක වන රත්නපුර, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක තුන තෝරා ගන්නා ලදි.

**වර්තමාන ප්‍රගතිය :**

2018/2019 මහ හා 2019 යල කන්න තුළ තට්ටුමාරු සහ කට්ටිමාරු ක්‍රමයට වී වගා කරන ලද තෝරාගත් ගොවි පවුල් 150ක් පිළිබඳ ප්‍රශ්නාවලි සමීක්ෂණයක් පවත්වන ලදි.







**3. ගොවි සංවිධානවලට සුළු වාරිමාර්ග පුනරුත්ථාපන (MIR- Minor Irrigation Rehabilitation) කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම තක්සේරු කිරීම: ශ්‍රී ලංකාවේ තිරසාර සුළු වාරිමාර්ග සංවර්ධනය සඳහා වන බලපෑම් විශ්ලේෂණය**

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| එම්. ඒ. සී. එස්. බණ්ඩාර මහතා | - සම්බන්ධීකාරක |
| එම්.ටී. පද්මජානි මිය | - සම පර්යේෂක |
| ඩබ්ලිව්.එච්.ඒ. ශාන්ත මහතා | - සම පර්යේෂක |
| ජී.ජී. ද. එල්.ඩබ්ලිව්. සමරසිංහ මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු**

රටේ වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති තක්සේරු කිරීම සඳහා විවිධ පර්යේෂණ සිදු කර ඇති අතර ග්‍රාමීය ප්‍රජාවන් සඳහා වන රාජ්‍ය මැදිහත්වීමේ ස්වභාවය වාරිමාර්ග ආයතන විසින් සම්පූර්ණයෙන් වටහාගෙන නොමැති බව බොහෝමයක් පර්යේෂණ පෙන්වා දී ඇත. මෙම අසමත් වීම නිසා ග්‍රාමීය වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන්ට අනපේක්ෂිත ගැටලු රාශියකට මුහුණපෑමට සිදු වී ඇත. නවීකරණය කරන ලද ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවල දී, ගම්වාසීන්ගෙන් බහුතරයක් විශ්වාස කරනුයේ වාරිමාර්ග පද්ධති රජය සතු වන අතර පද්ධති ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව සහතික කිරීම එහි වගකීම බවයි. එවැනි වාතාවරණයක් තුළ ගොවීන් තමන් වාරිමාර්ග පද්ධතියේ හිමිකරුවන් ලෙස කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කිරීම දුෂ්කර වන අතර ප්‍රජාවක් ලෙස මෙම පද්ධති රැක බලා ගැනීම ද අවම වී ඇත.

මෙම පසුබිම සමඟ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග පද්ධතියේ හිමිකාරිත්වය පිළිබඳ යම් හැඟීමක් පරිශීලක ගොවීන්ට ඇති කිරීම සඳහා තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමවේදයෙන් බැහැරව ගොවි සංවිධානවලට සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවලින් කොටසක් ලබා දීමට කටයුතු කර ඇත.
මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ගොවි සංවිධානවලට සුළු වාරි මාර්ග පුනරුත්ථාපනය කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ බලපෑම තක්සේරු කිරීම සහ ගොවි සංවිධානවලට කොන්ත්‍රාත්තු ලබා දීමෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එහි මූලික අරමුණු සාක්ෂාත් කර ගත්තේද යන්න පරීක්ෂා කිරීමයි.
පුනරුත්ථාපන යෝජනා ක්‍රමවල දිස්ත්‍රික්කයේ ජනගහනය මත පදනම්ව නියැදිය සමානුපාතිකව වෙන් කරන ලදි. ඒ අනුව, බදුල්ල, අනුරාධපුර, කුරුණෑගල, නුවරඑළිය, වවුනියා දිස්ත්‍රික්කවලින් අධ්‍යාපනය සඳහා ගොවි සංවිධාන 43ක් තෝරා ගන්නා ලදී.

**වත්මන් ප්‍රගතිය:**

ක්ෂේත්‍ර දත්ත එක්රැස් කිරීම සම්පූර්ණ කර ඇති අතර දත්ත කේතීකරණය, සංස්කරණය සහ විශ්ලේෂණය සිදු කරමින් පවතී.

## 4. ශ්‍රී ලංකාවේ දේශීයව වැදගත් කෘෂිකාර්මික උරුමයන්: හඳුනා ගැනීම, උපයෝගීතාවය සහ සංරක්ෂණය

**පර්යේෂණ කණ්ඩායම :**

ජේ.ඒ.යූ.පී. ජයසිංහ මෙනවිය - සම්බන්ධීකරණ නිලධාරිනි
ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර මිය - සම පර්යේෂක
ආර්.ඩී. විජේසිංහ මිය - සම පර්යේෂක

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික උරුම පද්ධති ලෙස සැලකිය හැකි දේශීය වශයෙන් විකාශනය වූ ගොවිතැන, ගොවිපළ කළමනාකරණ ක්‍රමවේදයන් සහ පද්ධති පිළිබඳ දැනුමෙන් පොහොසත් කෘෂිකාර්මික ඉතිහාසයක් ලංකාවට ඇත.

කෙසේ වෙතත්, වාණිජ කෘෂිකර්මාන්තයේ ශීඝ්‍ර විකසනයත් සමඟ මෙම කෘෂිකාර්මික පද්ධතීන්ගේ විද්‍යාත්මක පදනම සහ එම දැනුම වත්මන් කෘෂිකර්මාන්තයේ ස්ථිරසාර බව ඉහළ නංවා ගැනීමට යොදා ගැනීමේ හැකියාව හඳුනා ගැනීමටත් පෙරම නැති වී යාමේ අවධානමට පත් ව ඇත. මෙවන් තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවේ මෙම

පද්ධති නිර්වචනය කිරීමට,හඳුනා ගැනීමට එකතු කිරීමට හා සංරක්ෂණය කිරීමට ජාතික ප්‍රතිපත්තියක් හා යාන්ත්‍රණයක් අවශ්‍යය.

එබැවින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකට අනුව, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ තිරසාරභාවය කෙරෙහි කෘෂිකාර්මික උරුම පද්ධතිවල බලපෑම පරීක්ෂා කිරීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. එමඟින් ශ්‍රී ලංකාවේ දේශීයව වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති හඳුනා ගැනීම,ඒවායේ යෝග්‍යතාවය සොයා බැලීම සහ සංරක්ෂණය අරමුණු කර ගනී.

**බාහිර අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති**

1. **එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීම' ප්‍රවේශය (Save and Grow Approach) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම ගොඩනැංවීම- තිරසාර හා දේශගුණික විපර්යාස ප්‍රතිරෝධන ක්‍රමෝපායන් වී වගා පද්ධතීන්ට අනුගත කිරීම පිළිබඳ කලාපීය උපාය මාර්ග හඳුන්වාදීමේ ව්‍යාපෘතිය**

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| ඩබ්ලිව්.එච්.ඒ. ශාන්ත මහතා | - සම්බන්ධීකාරක |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම පර්යේෂක |
| ජී.ජී. ද.එල්.ඩබ්ලිව්. සමරසිංහ මිය | - සම පර්යේෂක |
| ටී. පී. මුණවීරගේ මිය | - සම පර්යේෂක |
| ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර මිය | - සම පර්යේෂක |
| ජේ.ඒ.යූ.පී. ජයසිංහ මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය** : එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)

**විෂයපථය සහ අරමුණු** :

බෝග නිෂ්පාදනය තිරසාර ලෙස තීව්‍රකරණය කිරීමේ 'සම්පත් සුරකිමින් වගා කිරීම' ප්‍රවේශය ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. එහි අරමුණ කිසියම් පරිසර පද්ධතියකට දැරිය හැකි ධාරිතාවය තුළ ඒකක නිෂ්පාදන යෙදවුමකින් ලබා ගත හැකි උපරිම ඵලදායිතාවය ළඟා කර ගැනීම එහි ප්‍රධාන අරමුණ වේ. තවද කුඩා ඉඩම් හිමියන්ගේ ගොවිපළ පද්ධතීන්වල බෝග නිෂ්පාදනය තිරසාර හා දේශගුණික සුහුරු තීව්‍රකරණය සහ විවිධාංගීකරණය හරහා වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලැබේ.

මූලිකව මෙම ව්‍යාපෘතිය මඟින් බඩ ඉරිඟු පදනම් කරගත් බෝග නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය සඳහා මෙම ප්‍රවේශය භාවිතා කිරීම සඳහා අප්‍රිකාවේ සැම්බියාවේ කටයුතු සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ වී බෝගය පදනම් කරගත් බෝග නිෂ්පාදනය තීව්‍ර කිරීම එහි අරමුණ විය.

මෙම ව්‍යාපෘතියෙහි ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සේවා සපයන්නා ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කටයුතු කළ අතර, විවිධ රජයේ ආයතනවල හවුල්කාරිත්වයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් අධ්‍යයන ස්ථානවල ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලදී. පහත්බිම් වී වගා ක්ෂේත්‍රය හා උස්බිම් බඩඉරිඟු සහ අතිරේක බෝග වගා ක්ෂේත්‍රයට විවිධ ශශ්‍ය විද්‍යාත්මක තාක්ෂණයන්

හඳුන්වා දීම සහ ඒවායෙහි කාර්යසාධනය තක්සේරු කිරීම සිදු කරන අතරම පුහුණුකිරීම් හා ආදර්ශන හරහා ගොවි ප්‍රජාව අතර නව තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම ද මෙහි අරමුණු අතර විය.

**සොයා ගැනීම්**

මනා ජල කළමනාකරණ ක්‍රමයක් ලෙස හඳුන්වා දුන් 'ඒකාන්තර තෙත් සහ වියළි ක්‍රමය', සුළු වාරි පද්ධතිවල ජලය සුරැකීම සඳහා ඉතා ප්‍රතිඵලදායක වන අතර වී අස්වැන්නෙහි සැලකිය යුතු වර්ධනයක් ද අත්පත් කර ගෙන තිබේ. වී වගාවේ පත්‍ර වර්ණ දර්ශකය මත පදනම් ව නයිට්‍රජන් පොහොර යෙදීමෙන් බෝග අස්වැන්න අඩාළ නොකර නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවයෙන් සියයට 20කට වඩා වැඩි ප්‍රමාණයක් අඩු කර ගත හැකිය.

පැරෂූට් ක්‍රමයට අනුව වී වගා කිරීම මඟින් ගොවි ප්‍රජාවට බීජ වී අවශ්‍යතාවය හා ජල අවශ්‍යතාවය මෙන්ම වල් මර්දනය සඳහා වන පිරිවැය අඩු කර ගැනීමට හැකි වූ අතර, අවසානයේ බෝග අස්වැන්න වැඩි කර ගැනීමට හැකි වීම වැනි වාසි රැසක් ලැබුණි. බීජ සිටුවීමේ යන්ත්‍රය ('ෆිටරෙලි' සීඩර්) ආධාරයෙන් බඩඉරිඟු බීජ ස්ථාපිත කිරීම සඳහා ශ්‍රම අවශ්‍යතාවය සැලකිය යුතු ලෙස අඩු කළ හැකි අතර මෙම යන්ත්‍රය මඟින් විසින් බීජ ගැඹුරින් රෝපණය කිරීම හේතුවෙන් මොණරුන් සහ අනෙකුත් පක්ෂීන් හා සතුන් විසින් බීජ අහුලා ගැනීම වැළැක්වෙන බවද අනාවරණ විය.

## 2. ශ්‍රී ලංකාවේ තෝරාගත් බෝග වගාවන් සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම භාවිතයෙහි ජල හා බලශක්ති පාදක ඇගයීම

**පර්යේෂණ කණ්ඩායම** :

| | |
|---|---|
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා මහතා | - සම්බන්ධීකාරක |
| ආර්.ඒ.සී.ජේ. පෙරේරා මහතා | - සම පර්යේෂක |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම පර්යේෂක |
| එම්.ටී පද්මජානි මිය | - සම පර්යේෂක |
| ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ගෝලීය දේශගුණික හවුල්කාරීත්ව අරමුදල (GCPF)

විෂයපථය සහ අරමුණු :

ගොවීන් විසින් සාම්ප්‍රදායික ජල සම්පාදන ක්‍රම (පිටාර ජලසම්පාදනය, තීරු ජල සම්පාදනය වැනි ජල සම්පාදන ක්‍රම) විවිධ බෝග වගා පද්ධතීන් සඳහා මෙන් ම විවිධ භූගෝලීය ප්‍රදේශවල දී පුළුල් ලෙස භාවිතා කරනු ලැබේ. ජලය හා ශ්‍රමය කාර්යක්ෂමව භාවිතා කිරීමේ ක්‍රමයක් ලෙස ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම (විසිරුම් හා බිංදු ජල සම්පාදන ක්‍රම) මුලින්ම හඳුන්වා දෙන ලදී. ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම හරහා රජයේ ආයතනවල බෝග විවිධාංගීකරණ උපාය මාර්ගවලට වඩාත් හොඳ පිටිවහලක් ලැබිණි.

විවිධ බෝග සහ විවිධ භූගෝලීය ප්‍රදේශ සඳහා මෙම තාක්ෂණය භාවිතයේ දී සත්‍ය ජල හා බලශක්ති ඉතිරිකිරීම් විමර්ශනය කිරීම, විගණනය කිරීම හා ලේඛනගත කිරීම වඩාත් විධිමත්ව ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ඉවහල් වේ.

එබැවින් මෙම අධ්‍යයනයේ දී විශේෂිත බෝග වර්ග සඳහා තෝරාගත් ගොවි ප්‍රජාවන් විසින් භාවිතා කරනු ලබන ප්‍රධාන ජල සම්පාදන ක්‍රම අධ්‍යයනය කරනු ලබයි. විවිධ භූගෝලීය ප්‍රදේශවල විවිධ ජල සම්පාදන ක්‍රම යටතේ තෝරාගත් බෝග වගා කිරීම සඳහා ගොවීන් භාවිතා කරන ජල පරිමාවන් පිළිබඳව ද විමර්ශනය කරනු ලබන අතර විවිධ ජල සම්පාදන ක්‍රම යටතේ තෝරාගත් බෝග නිෂ්පාදනය සඳහා ජල සම්පාදනයේ දී බලශක්ති

පරිභෝජනයේ ඇති වෙනස්කම් ද විමර්ශනය කරයි. අධ්‍යයනය 2019 සැප්තැම්බර් මාසයේ ආරම්භ කළ අතර 2020 ජනවාරි මාසයේ අවසන් කිරීමට නියමිතය.

### 3. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවල බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| එම්. ඒ. සී. එස්. බණ්ඩාර මහතා | - සම්බන්ධීකාරක |
| ඩබ්ලිව්.එච්.ඒ. ශාන්ත මහතා | - සම පර්යේෂක |
| එම්.ටී. පද්මජානි මිය | - සම පර්යේෂක |
| ජී.ජී. ඩී.එල්.ඩබ්ලිව්. සමරසිංහ මිය | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)

**විෂයපථය සහ අරමුණු :**

සහල් ස්වයංපෝෂිතභාවය සහ ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජය සිය පොහොර සහනාධාර වැඩසටහන සංශෝධනය කිරීමට සැලසුම් කර ඇත. එබැවින් සහනාධාර සැපයීම වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විවිධ සහනාධාර ක්‍රමවල බලපෑම මෙන්ම ගොවීන්ගේ සහනාධාර මනාපයන් සහ වර්තමාන සහනාධාර වැඩසටහනට ප්‍රවේශවීමේ දී මුහුණ දෙන අභියෝග පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

එබැවින් අධ්‍යයනයේ පරමාර්ථය, වී වගාකරුවන් අතර ගෘහස්ථ මට්ටමේ සමීක්ෂණයක් පැවැත්වීම හා තිරසාර කෘෂිකාර්මික භාවිතයන් හා ඒවා භාවිතා කිරීම පිළිබඳ තොරතුරු ලබා ගැනීම මෙන්ම පොහොර සහනාධාර ප්‍රතිපත්ති සහ එහි බලපෑම පිළිබඳ තොරතුරු සෙවීම ය.

මෙම සමීක්ෂණය අනුරාධපුර දිස්ත්‍රික්කයේ 'සම්පත් සුරකිමින් වගා කිරීමේ' ව්‍යාපෘතිය යටතේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර පෙර සහයෝගීතාවයක් මත ගොඩනැඟේ. එම ව්‍යාපෘතිය යටතේ 2018 ඔක්තෝබර් සහ 2019 පෙබරවාරි මාසවල දී එම දිස්ත්‍රික්කයේම ගොවි සංවිධානය 110ක ගොවි පවුල් 1100ක් සඳහා ගෘහ සමීක්ෂණයක් සිදු කරන ලදී. එම සමීක්ෂණයෙන් එකතු කරන ලද දත්ත කට්ටලය වර්තමාන අධ්‍යයනයට පදනම ලෙස භාවිතා වේ.

වර්තමාන අධ්‍යයනය මගින් විවිධ පරිචයන් අනුගමනය කිරීමේ ප්‍රවේශයන් සහ සුභසාධන ප්‍රතිඵල කෙරෙහි ඒවායේ බලපෑම තක්සේරු කිරීමට සහ ගෘහස්ථ සුභසාධනය හා එහි ඵලදායිතාවට මෙන්ම ගොවීන්ගේ මනාපයන් සඳහා විවිධ පොහොර සහනාධාර ක්‍රමවල බලපෑම විශ්ලේෂණය කරනු ඇත.

සමීක්ෂණ දත්ත එක්රැස් කිරීමේ දෙවන වටය 2020 සැප්තැම්බර් මස අග ආරම්භ කර ඔක්තෝබර් මස අග දක්වා පැවැත්වීමට නියමිතය. එම සමීක්ෂණ නියැදිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් 1100ක නියැදියකි. පොහොර සහනාධාර මනාපයන් හා සම්බන්ධ අමතර ප්‍රශ්න කිහිපයක් එකතු කරමින් 'සම්පත් සුරකිමින් වගා කිරීමේ' ව්‍යාපෘතිය (Save & Grow Project) පිළිබඳ පෙර සමීක්ෂණය නැවත සිදු කරනු ඇත. එය සහනාධාර ක්‍රියාත්මක කිරීමේ ක්‍රම සංසන්දනය කිරීමට සහ බලපෑම් විශ්ලේෂණය මෙන්ම හේතු අනුමාන කිරීම් වැඩි දියුණු කළ හැකි ආර්ථිකමිතික ශිල්පීය ක්‍රම උපයෝගී කර ගැනීමට ද උපකාරී වනු ඇත.

# 04

# අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

## අවසන් කළ අධ්‍යයන

## 1. ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අර්තාපල් බීජ නිෂ්පාදනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයේ දිශානතියන් සලකා බැලීමේ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| අයි.වී.කුරුප්පු මයා | - සම්බන්ධීකරණ නිලධාරී |
| ඒ.ආර්.ඩබ්.එම්.එම්.ඩී.අමරකෝන් මිය | - සම පර්යේෂක |
| එස්.පී.ප්‍රනාන්දු මයා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය:** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු:**

අර්තාපල් , ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝගයක් ලෙස සැලකෙන අතර, බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ගොවි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස මෙය වඩාත් වැදගත් වේ. ආනයනික අර්තාපල් බීජ මිල ඉතා ඉහළ බැවින් ද, දේශීයව නිෂ්පාදනය කරනු ලබන බීජ ප්‍රමාණවත් සැපයුමක් නොමැති බැවින් ද අර්තාපල් වගාවට ආර්ථික වශයෙන් අවාසිදායක තත්ත්වයක් උද්ගත වී ඇත. එබැවින්, වර්තමානයේ දී බීජ නිෂ්පාදනයෙන් 80%ක්ම ස්වයං බීජ ලෙස ගොවීන් විසින්ම නිෂ්පාදනය කරනු ලබන අතර එහිදී බීජවල නිසි ප්‍රමිතිය සහ ගුණාත්මකභාවය පිළිබඳව ගැටලු මතු වී ඇත. මේ ගැටලුව මග හරවා ගැනීමේ වැඩි විභවතාවයක් රාජ්‍ය සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වය හරහා ගුණාත්මක බීජ අර්තාපල් නිෂ්පාදනයට යොමු වීම තුළින් සාක්ෂාත් කර ගත හැකි ය. අර්තාපල් නිෂ්පාදන අංශය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ හවුල්කාරීත්වය ප්‍රචලිත කිරීමට සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ප්‍රතිපත්තිවලට එම ක්‍රියාදාමය යොමු කළ යුතු බවට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය ද පෙන්වා දී ඇත.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක බීජ අර්තාපල් අවම පිරිවැයකින් නිෂ්පාදනය කිරීම උදෙසා රාජ්‍ය හා පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයට බලපානු ලබන කරුණු කාරණා සොයා බැලීමයි.

**විශේෂිත අරමුණු වනුයේ,**

1. දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බීජ අර්තාපල් නිෂ්පාදන ක්‍රියාවලියේ සහ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයේ ව්‍යුහය-හැසිරීම-කාර්යය සාධනය පිළිබඳව අධ්‍යනය කිරීම.

2. ශ්‍රී ලංකාව තුළ ගුණාත්මකභාවයෙන් ඉහළ බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා ඵලදායි රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාර ගොඩනැගීම වස් උපායමාර්ගික මාර්ගෝපදේශන යෝජනාවලියක් සකස් කිරීම.

**සොයාගැනීම් :**

ශ්‍රී ලංකාවේ වාර්ෂික අර්තාපල් අවශ්‍යතාවයෙන් දළ වශයෙන් දේශීය නිෂ්පාදනය කරනු ලබන්නේ සියයට 35ක් පමණි. 2013 සිට ශ්‍රී ලංකාව රටවල් හයකින් බීජ අර්තාපල් ආනයනය කර තිබේ. ගොවීන් විසින් අවිධිමත් ලෙස නිෂ්පාදනය කිරීම, රජයේ හා පෞද්ගලික ගොවිපළ විධිමත් ලෙස නිෂ්පාදනය කිරීම සහ ආනයනය කිරීම මගින් දේශීය බීජ අවශ්‍යතාවය සපුරා ගනු ලබයි. බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 1,000 - 2,000 අතර ප්‍රමාණයක් රජයේ ගොවිපළවල නිපදවන අතර තවත් මෙට්‍රික් ටොන් 1,000 - 1500ක් ආනයනය කරනු ලැබේ. වාණිජ බීජ අලෙවිකරුවන් ලෙස කටයුතු කළ ගොවීන්ගෙන් කිසිවෙකුත් 2003 අංක 22 දරණ බීජ පනත යටතේ ලියාපදිංචි වී නොමැති බව අධ්‍යයනයෙන් හෙළි විය.

**නිර්දේශ:**

1. ශ්‍රී ලංකාව බීජ පනත ශක්තිමත් කළ යුතු අතර ආරම්භක පියවර ලෙස බීජ ක්ෂේත්‍රයේ රාජ්‍ය -පෞද්ගලික හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම සඳහා පැහැදිලි ප්‍රවේශයක් හා උපායමාර්ගික මාර්ගෝපදේශ තිබිය යුතුය.

2. G0 නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශය විසින් සිදු කළ යුතුය.

3. G1 බීජ අර්තාපල් නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පුද්ගලික අංශයට දේශීය නිෂ්පාදනයට පිවිසිය හැකිය. ගොඩනැගීම - ක්‍රියාත්මක කිරීම - මාරු කිරීම (Build-Operate-Transfer) මේ සඳහා සුදුසුම ආකෘතියයි.

4. Aeroponic ක්‍රමය යටතේ පොලිතින් ගෘහවල G1 බීජ අර්තාපල් නිෂ්පාදනය ශක්තිමත් කිරීම සඳහා පෞද්ගලික ආයතනය වගා බිම් භාවිතා කළ යුතුය.

5. වාණිජමය අරමුණු සඳහා එක් ප්‍රභේදයක් (ග්‍රැනෝලා) පමණක් ගුණනය කිරීමට ශ්‍රී ලංකාවට බලය ඇති බැවින් බීජ අර්තාපල් ආනයනය ක්‍රමවත්ව සිදු කළ යුතුය.

## 2. ශ්‍රී ලංකාවේ 'දර්ශක මත පදනම් වූ කාලගුණ වගා රක්ෂණ (Weather Insurance Index) යෝජනා ක්‍රමයේ' ක්‍රියාකාරිත්වය

**පර්යේෂණ කණ්ඩායම:**

| | |
|---|---|
| ආර්.වයි.ඩී.එම්.ආර්.එන්.කේ. රඹුක්වැල්ල මිය | - සම්බන්ධීකරණ නිලධාරී |
| ආර්.පී. විදානපතිරණ මිය | - සම පර්යේෂක |
| පී.ඒ.ජේ. චම්පිකා මිය | - සම පර්යේෂක |
| ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය:** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

දශක පහකට වැඩි කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයේ පවතින විවිධ දුර්වලතා හේතුවෙන් එය ගොවි ප්‍රජාව අතර ජනප්‍රිය නොවේ. එබැවින් ස්වාභාවික විපත් හා සම්බන්ධ අවදානම්වලින් ගොවීන් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී බෝග රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම කාලෝචිත ය. දර්ශක මත පදනම් වූ කාලගුණ වගා රක්ෂණ (Weather Insurance Index) යනු කෘෂිකර්මාන්තයේ කාලගුණය හා සම්බන්ධ අවධානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ නව ක්‍රමයක් වශයෙන් හඳුනා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ වී ගොවිතැන සඳහා කාලගුණ දර්ශක රක්‍ෂණ (WII) යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය සැලසුම් කර ඇත. මෙහි දී ආයතනික වශයෙන් මෙන් ම ගොවීන්ගේ දෘෂ්ටි කෝණයෙන් ද මෙම කාලගුණ වගා රක්ෂණ යෝජනා ක්‍රමයේ වර්තමාන තත්ත්වය, වාසි හා අවාසි තත්ත්වයන් ද විමර්ශනය කරන ලදී.

**සොයාගැනීම් :**

දර්ශක මත පදනම් වූ කාලගුණ වගා රක්‍ෂණ (WII) යෝජනා ක්‍රමයට අදාළව ගොවීන්ගේ සහභාගීත්ව අනුපාතය සියයට 0.5ට වඩා අඩු වන අතර එයින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ වී ගොවීන් අතර එකී යෝජනා ක්‍රමය තවමත් ජනප්‍රිය නොවන බවයි. ක්ෂුද්‍ර දේශගුණික විචල්‍යතා, විශාල ආරම්භක පිරිවැය, කාලගුණ මධ්‍යස්ථානවල හිඟතාවය, ගුණාත්මකභාවය හා යාවත්කාලීන කාලගුණ දත්ත නොමැතිකම සහ අදාළ ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිකම සහ දත්ත හුවමාරු කර ගැනීමේ යාන්ත්‍රණයක් නොමැතිවීම මෙහිදී සොයා ගත් ප්‍රධාන කරුණු වශයෙන් හැඳින්විය හැකිය.

නිර්දේශ

1. **කාලගුණ දර්ශක රක්ෂණ (WII)** යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජා පාදක සහභාගීත්ව යාන්ත්‍රණයක් තිබිය යුතුය.

2. මූලික අවදානම් අවම කිරීම සඳහා, තත් කාලීන වර්ෂාපතන දත්ත ලබා ගැනීම සඳහා ස්වයංක්‍රීය උපකරණ මගින් වර්ෂාපතන දත්ත එක්රැස් කිරීමේ ජාලය යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු අතර නිෂ්පාදන සැලසුම් වැඩිදියුණු කළ යුතුය.

3. යටිතල පහසුකම් හා සේවා සැපයීම සඳහා **කාලගුණ දර්ශක රක්ෂණ (WII)** යෝජනා ක්‍රමයට රජයේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

4. ගොවි සංවිධාන හරහා ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණුවීම් අවශ්‍ය වේ. **කාලගුණ දර්ශක රක්ෂණ (WII)** යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා ජනමාධ්‍ය, පෝස්ටර් සහ පත්‍රිකා හරහා ශක්තිමත් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් අවශ්‍ය වේ.

5. ජංගම දුරකථන තාක්‍ෂණය භාවිතා කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම ඉතා වැදගත් වේ. ගොවීන් බඳවා ගැනීම්, වාරික එකතු කිරීම, හිමිකම් පියවීම සහ වෙනත් නිත්‍ය සන්නිවේදනයන් වන දර්ශකය ක්‍රියා කරන ආකාරය, දර්ශකයේ ප්‍රගතිය, හිමිකම් ගෙවිය යුතු වූ විට දුරකථනයෙන් ලබා දිය හැකිය.

6. වැඩිදියුණු කළ, ජාතික වශයෙන් විශ්වසනීය හා ජාත්‍යන්තරව සැසඳිය හැකි කෘෂිකාර්මික හා කාලගුණ දත්ත, කාලගුණ මධ්‍යස්ථාන හොඳින් කළමනාකරණය කළ යුතු අතර ප්‍රජා පාදක සහ ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන ස්ථාපනය කළ යුතුය.

දන විවිධ ප්‍රභවයන්ගෙන් ලබා ගත හැකි කාලගුණ තොරතුරු ජාතික මධ්‍යගත දත්ත පදනමක් සමඟ ඒකාබද්ධ කිරීම ඉතා වැදගත් වේ. ගොවීන් සඳහා වඩා හොඳ රක්ෂණ ක්‍රමවේදයන් සැපයීමට එය රජයේ සහ පෞද්ගලික රක්ෂණ සමාගම්වලට උපකාරී වනු ඇත.

8. විවිධ ප්‍රභවයන්ගෙන් ලබා ගත හැකි කාලගුණ තොරතුරු ජාතික මධ්‍යගත දත්ත පදනමක් සමඟ ඒකාබද්ධ කිරීම ඉතා වැදගත් වේ. ගොවීන් සඳහා වඩා හොඳ රක්ෂණ ක්‍රමවේදයන් සැපයීමට එය රජයේ සහ පෞද්ගලික රක්ෂණ සමාගම්වලට උපකාරී වනු ඇත.

9. කාලගුණ මධ්‍යස්ථාන වලින් වර්ග කිලෝමීටර අරය අඩු කිරීම සඳහා කාලගුණ මධ්‍යස්ථාන ඝනත්වය වැඩි කළ යුතුය. අදාළ කාලගුණ මධ්‍යස්ථාන වලින් අරය වර්ග කිලෝමීටර් 15 සිට 5 දක්වා අඩු කිරීම වඩා හොඳය. එය තත්වය නිවැරදිව නිරූපණය කරන අතර එය මූලික අවදානම අවම කිරීමට උපකාරී වේ.

10. සාර්ථක දර්ශක රක්ෂණ නිෂ්පාදන සඳහා ප්‍රධාන සාධකය වනුයේ නිරවද්‍ය හා කාලෝචිත කාලගුණ දත්ත වේ. නව තාක්‍ෂණික නවෝත්පාදන සහ වෙනත් දුරස්ථ සංවේදක ක්‍රමවේදයන් භාවිතා කිරීමේ හැකියාව සහ **කාලගුණ දර්ශක රක්ෂණ (WII)** සඳහා හඳුන්වා දුන් චන්ද්‍රිකා නිරූපණ පදනම් කරගත් දත්ත සහ පරිගණක ආකෘති සැලකිල්ලට ගත යුතුය.

## 3. ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ අභියෝග : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව

පර්යේෂණ කණ්ඩායම : අයි.කේ. එදිරිසිංහ මෙනවිය - සම්බන්ධීකරණ නිලධාරිනී

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු** :

අපේක්ෂිත අරමුණු සාර්ථකව සාක්ෂාත් කර ගැනීමට සහ නියමිත වේලාවට ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය ඉතා වැදගත් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මුහුණ දී ඇති අභියෝග හඳුනා ගැනීම සහ ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

**සොයා ගැනීම්:**

සැලසුම්, මූල්‍යකරණය, මානව සම්පත්, මූල්‍ය කළමනාකරණය, කාල කළමනාකරණය, ප්‍රතිපත්ති, රීති හා රෙගුලාසිවල අඛණ්ඩතාව, ප්‍රවාහන පහසුකම්, ලියකියවිලි, අධීක්ෂණ හා පසු විපරම් ක්‍රියාකාරකම්, නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, සම්බන්ධීකරණය වැනි ක්ෂේත්‍රවල අභියෝග බොහෝ දුරට පවතින බව සොයා ගන්නා ලදී. තවද ජාතික, පළාත් සහ දිස්ත්‍රික් සැලසුම් තුළ, විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය සහ දේශපාලන නියෝජනය සහ නිලධාරීන් අතර සම්බන්ධීකරණ ක්‍රියාවලීන් තුළ ද අභියෝග ඇති බව අධ්‍යයනයෙන් අනාවරණ විය.

**නිර්දේශ**

ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණය සඳහා අධ්‍යයනය පහත සඳහන් ප්‍රධාන නිර්දේශ යෝජනා කරයි.

1. හැකි සෑම අවස්ථාවකදීම අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසා සැලසුම් කිරීම
2. ප්‍රධාන වශයෙන් නියමිත වේලාවට ප්‍රමාණවත් ලෙස අරමුදල් සැපයීම
3. ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නඩත්තු කිරීමට පියවර ගැනීම
4. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දින දර්ශනයේ නියම වේලාවට ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීම
5. ප්‍රතිපත්තිවල නොගැලපීම් හඳුනාගෙන නිවැරදි කිරීම සඳහා විවිධ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීම සතුටුදායක මට්ටමින් සැපයුම් පහසුකම් සැපයීම සඳහා සුදුසු උපාය මාර්ග සකස් කිරීම
6. සුමට හා විධිමත් අධීක්ෂණ හා පසු විපරම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
7. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන අංගය ශක්තිමත් කිරීම.

## සිදු කරමින් පවතින අධ්‍යයන

### 1. ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදකයන්ගේ තීරණ ගැනීම සඳහා බලපාන සාධක

පර්යේෂණ කණ්ඩායම

| | |
|---|---|
| අයි.පී.පී. විජේසිංහ මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| ආචාර්ය ඩබ්.ඒ.ආර්. වික්‍රමසිංහ මහතා | - සම පර්යේෂක |
| ආචාර්ය ඊ.එම්.සී. ප්‍රියංකර මහතා | - සම පර්යේෂක |
| විරාජිත් කුරුප්පු මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල**

**විෂයපථය සහ අරමුණු :**

ශ්‍රී ලංකාවේ එළවළු වෙළඳපොළ තුළ මිල උච්චාවචනය වීම පොදු ලක්ෂණයක් වන අතර එය නිෂ්පාදකයාගේ මෙන්ම පාරිභෝගිකයාගේ සුබසාධන මට්ටම් පහළ දැමීමට හේතු වේ. සමහර මාසවලදී පවතින අධිසැපයුම සහ ප්‍රමාණවත් නොවන සැපයුම හේතුවෙන් වෙළඳපොළ අස්ථාවරත්වයක් දැකිය හැක. මෙම සන්දර්භය තුළ නිවැරදි ආර්ථික තීරණ ගැනීමට නිවැරදි තොරතුරු පැවතීම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මෙම ඉල්ලුම සහ සැපයුමේ පවතින නොගැළපීම මිල අස්ථාවරත්වයට හේතු වන අතර ගොවීන්ට තම වියදම ආවරණය කරගත හැකි මිලක් වත් නොලැබෙන අවස්ථා ද ඇත. යෙදවුම් හා නිමවුම් වෙළඳපොළ තුළ පවතින තොරතුරු අසමමිතිකභාවය නිසා බෝග තෝරා ගැනීම නිවැරදි නොවිය හැක.

මේ අනුව, අධ්‍යනය මඟින් එළවළු නිෂ්පාදන අංශයේ පවතින තොරතුරු අසමමිතිකභාවය හඳුනාගැනීම සහ එම තොරතුරු අසමමිතිකභාවය අඩු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීම තුළින් ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදන අංශයේ සම්පත් භාවිතාකිරීමේ කාර්යක්ෂමභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපායමාර්ග සකස් කිරීමට උත්සහ දරනු ලබයි.

අලෙවිකරණය අරමුණු කරගත් එළවළු නිෂ්පාදකයන් 480 දෙනෙකු සමඟ කළ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් අනුරාධපුරය, කුරුණෑගල, පුත්තලම, මහනුවර, නුවරඑළිය, බදුල්ල, රත්නපුරය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවලින් ප්‍රාථමික දත්ත එක්රැස් කරන ලදී.

**වර්තමාන ප්‍රගතිය**

ප්‍රාථමික දත්ත රැස් කිරීම අවසන් කර ඇත. දත්ත විශ්ලේෂණය සහ වාර්තාව ලිවීම සිදු කරමින් පවතී.

### 2. ශ්‍රී ලංකාවේ වී/සහල් අගයදාමය පිළිබඳ විශ්ලේෂණය : ප්‍රධාන සහල් සැකසුම් දිස්ත්‍රික්කය, පොළොන්නරුව

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| ඩබ්ලිව්.ඒ.එන්. විජේසූරිය මහතා | - සම්බන්ධීකාරක |
| ඩබ්.එච්.ඩී ප්‍රියදර්ශන මහතා | - සම පර්යේෂක |
| විරාජිත් කුරුප්පු මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

මෙරට ආහාර සුරක්ෂිතාවය සහ ග්‍රාමීය ආර්ථිකය තුළ වී/සහල් නිෂ්පාදන කර්මාන්තයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වී අස්වනු නෙළන සමයේ දී ගොවිපළ මිල ගණන් දැඩි ලෙස විචලනයට ලක්වීම සහ අවාරයේ දී සිදුවන සහල් මිල උච්චාවචනයන් තුළින් සුළු පරිමාණ වී ගොවීන් මෙන්ම අඩු ආදායම්ලාභී පාරිභෝගිකයින් ද අපහසුතාතවයට පත් වේ. මෙම මිල විචලනයන් අවම කිරීම සඳහා රජය මඟින් කාලීනව විවිධ මැදිහත්වීම්

සිදුකරනු ලබයි. මෙම ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී වී/ සහල් අගයදාමය පිළිබඳව විශ්ලේෂණය කොට එයට සම්බන්ධ විවිධ පාර්ශවයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යයනය කිරීම තුළින් ලබාගන්නා නව දැනුම බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඒ තුළින් වී/සහල් අගයදාමය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පහසු වනු ඇත.

මෙරට ප්‍රධානතම වී නිපදවන සහ සහල් සැකසීමේ කලාපය වන පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන ලද අතර මෙහි දී ගොවීන්, සහල් මෝල් හිමියන්, එකතුකරන්නන් සහ අතුරු නිෂ්පාදන කර්මාන්තයේ යෙදී සිටින්නන් අධ්‍යයනයට භාජනය විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිට ප්‍රධාන පාරිභෝගික ප්‍රදේශයන් දක්වා මුළු වී/සහල් අගයදාමය අධ්‍යයනයනයට ලක් කිරීම අධ්‍යයනයේ මූලික අරමුණු විය. එමෙන්ම සහල් සහ ආශ්‍රිත අතුරු නිෂ්පාදනවල නිරත පාර්ශව තුළ පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් සහ අභියෝග හඳුනාගැනීම සුවිශේෂී ලෙස අරමුණු විය.

**වර්තමාන ප්‍රගතිය :**

ක්ෂේත්‍ර සමීක්ෂණය තුළින් දත්ත රැස් කිරීමේ කටයුතු අවසන් කොට ඇති අතර අදාළ දත්ත විශ්ලේෂණය කරමින් පවතී.

## 3. අතරමැදි කන්නයේ අතිරේක ආහාර බෝග වගා කිරීමේ ගැටලු පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම:**

ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා - සම්බන්ධීකරණ නිලධාරී
ආචාර්ය ඊ.ඒ.සී. ප්‍රියංකර මහතා - සම පර්යේෂක

**මූල්‍ය ප්‍රභවය:** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

පසුගිය දශක හතර තුළ අතිරේක ආහාර බෝගයන් හි ජාතික නිෂ්පාදනයේ තියුණු පහත වැටීමත් සමඟ අතිරේක ආහාර බෝගයන්හි ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත (උදා: 2018 දී රුපියල් මිලියන 41,734). එබැවින් අතිරේක ආහාර බෝගයන්හි නිෂ්පාදනය ඉහළ නැංවීම වර්තමානයේ ආර්ථික හා ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන කරුණකි. අතිරේක කන්නයක් වගා කිරීමෙන් බෝගයේ තීව්‍රතාවය වැඩි කිරීම මෙම ප්‍රයත්නයේ පිළිගත හැකි විසඳුමක් ලෙස හඳුනාගෙන ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව තුන්වන කන්නයේ දී අතිරේක ආහාර බෝග ව්‍යාප්ත කිරීමට බලපාන ගැටලු පිළිබඳව සොයා බැලීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මෙම අධ්‍යයනය ආරම්භ කළේය. තවද, තුන්වන කන්නයේ දී අතිරේක ආහාර බෝග වගා කිරීමේදී ගොවීන් මුහුණ දෙන ගැටලු සහ බාධක හඳුනාගෙන තෙවන වාරයේ දී අතිරේක ආහාර බෝග වගාවට බාධා කරන කෘෂි විද්‍යාත්මක, පාරිසරික හා ආයතනික ගැටලු සමාලෝචනය කෙරේ.

තුන්වන කන්නයේ දී අතිරේක ආහාර බෝග වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යයනය සඳහා හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තෝරා ගන්නා ලදී. ප්‍රාථමික හා ද්විතීයික දත්ත එකතු කරන ලදී.

ගොවීන්ගෙන් ප්‍රාථමික දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම සඳහා ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී. හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ගොවීන් 150 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා 15ක් පවත්වන ලදී.

**වර්තමාන ප්‍රගතිය**

වාර්තාව ලිවීම සිදු කරමින් පවතී.

## 4. කෘෂිකාර්මික මිල තොරතුරු ක්‍රමය (Agriculture Market Information System)

කෘෂිකාර්මික මිල තොරතුරු ක්‍රමය (AMIS) යනු මිල තොරතුරු (තොග, සිල්ලර හා ගොවිපළ මිල) එකතු කරන ව්‍යාපෘතියකි. තොග සහ සිල්ලර මිල තොරතුරු වෙළඳපොළ ස්ථාන නවයකින් (පිටකොටුව, වැල්ලවත්ත, කිරුලපන, නුගේගොඩ, නාරාහේන්පිට, දෙමටගොඩ, තොටළඟ, කඩවත සහ කිරිබත්ගොඩ) එකතු කරනු ලැබේ. නිෂ්පාදක මිල ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් එකතු කරනු ලැබේ. දිවයිනේ ස්ථාන 28ක ක්ෂේත්‍ර නිලධාරීන් 28 දෙනෙකු සහ කොළඹ වෙළඳපළවලින් තොරතුරු රැස්කිරීම සඳහා අනියම් විමර්ශකයින් 11 දෙනෙකු යොදවා ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන අටකින් එළවළුවල දෛනික තොග මිල ගණන් සපයන 6666 නමින් මොබිටෙල් ඇමතුම් සේවාවක් ඇත. මෙම මිල ගණන් සතිපතා සහ මාසික දැන්වීම් මගින් බෙදා හරිනු ලැබේ.

**බාහිර අරමුදල් මත සිදු කළ අධ්‍යයන**

**සිදුකර අවසන් අධ්‍යයන**

### 1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පාරිභෝගික තෘප්තිමත්භාවය මැනීම සඳහා සිදු කරනු ලබන සමීක්ෂණය

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| අයි.වී.කුරුප්පු මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| අයි.පී.පී.එම්. විජේසිංහ මහතා | - සම පර්යේෂක |

**අරමුදල් ප්‍රභවය :** ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

**විෂය පථය සහ අරමුණු**

2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ආඥා පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස බිහි වූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 100%ක් රාජ්‍ය බැංකුවක් ලෙස ස්ථාපනය කරන ලදී. රටේ ආර්ථික සංවර්ධනය කෙරෙහි දායක වන්නාවූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මෙන්ම කෘෂි, පශු සම්පත් සහ ධීවර කර්මාන්තයන් පසුපස යෝධ ශක්තියක් වීම සඳහාම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි මූල්‍ය ක්‍රමෝපායන් සකස්ව ඇත. රට වටා පිහිටුවා ඇති බැංකු ජාල පරිමාණය හා ප්‍රමාණය සමඟ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මෙහෙයුම් වඩ වඩාත් අභියෝගාත්මක වෙමින් පවතී.


රට පුරා සිය ශාඛා ක්‍රමවත්ව හා කාලීනව ඇගයීම සඳහා කඩිනම් සමීක්ෂණයක් පවත්වන ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කළමනාකාරිත්වය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා ඇත. සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ අනාගත සංවර්ධනය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛාවල මිනුම් සලකුණු කිරීමයි. විශේෂිත අරමුණු වනුයේ,

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛාවල කාර්ය සාධනය සහ පාරිභෝගික සේවය සඳහා දැනුම හා කාලීන චිත්‍රයක් ලබා ගැනීම.
2. බැංකු මෙහෙයුම් සහ පාරිභෝගික සේවය වැඩිදියුණු කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමෝපායන් සහ කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම.

දිවයින පුරා ශාඛා 60ක් ඇගයීමට ලක් කරන ලදී. ව්‍යුහාත්මක ප්‍රශ්නාවලියක් හරහා ප්‍රාථමික දත්ත එක්රැස් කරන ලදී. ප්‍රශ්නාවලිය හරහා පෙනුම, නිපුණතාවය, සංවේදනය, අපේක්ෂාවන්, ඵලදායිතාවය, නීත්‍යානුකූලභාවය, උපදේශන උපයෝගිතාවය සහ ණය ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැනි අංශ ඇගයීමට ලක්කරන ලදී.

**වත්මන් ප්‍රගතිය**

අධ්‍යනය අවසන් කර ඇත. අවසන් වාර්තාවෙන් අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

## 2. ශ්‍රී ලංකාවේ තෝරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි බෝග සඳහා අගය දාමය ශක්තිමත් කිරීම සඳහා වූ පාදක අධ්‍යයනය

| | | | |
|---|---|---|---|
| **පර්යේෂණ කණ්ඩායම** | **:** | ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| | | ආර්.පී. විදානපතිරණ මිය | - සම පර්යේෂිකා |
| | | ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා | - සම පර්යේෂක |
| | | ආර්.එන්.කේ. රඹුක්වැල්ල මිය | - සම පර්යේෂිකා |

**මූල්‍ය ප්‍රභවය :** ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)

**විෂයපථය සහ අරමුණු :**

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ හා චීන South South Coorperation (SSC) හි සහයෝගී ව්‍යාපෘතියක් වන මෙහි අරමුණ වූයේ අන්නාසි, කෙසෙල් සහ අඹ යන පලතුරුවල අගය දාමයන්හි කාර්යක්ෂමතාව සහ තරගකාරිත්වය වැඩි දියුණු කිරීමයි. එතුළින් අගය දාම ක්‍රියාකාරීකයින්ගේ ආදායම වැඩි කර පලතුරු වතු සහ පලතුරු සැකසුම් සඳහා මධ්‍යම සිට මහා පරිමාණ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හැකි විය.

ස්වාධීනව තක්සේරු කරන ලද තොරතුරු පදනමක් සැපයීම සඳහා රටේ තෝරාගත් භූගෝලීය කලාපයන්හි නිශ්චිතව දක්වා ඇති ව්‍යාපෘතිය මගින් ඉලක්ක කර ඇති සියලුම පාර්ශ්වකරුවන් ද ඇතුළුව මූලික අධ්‍යයනයක් කිරීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට පවරන ලදී.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ කෙසෙල්, අඹ සහ අන්නාසි පිළිබඳ නිශ්චිත ඉලක්කගත භූගෝලීය පිහිටීමක් සහිතව සවිස්තරාත්මක අගය දාම විශ්ලේෂණයක් සිදු කිරීමයි.

**සොයා ගැනීම් :**

1. ඉහළම ශුද්ධ ආන්තිකය උපයා ගන්නේ සිල්ලර වෙළෙන්දා විසින් වන ඊළඟට වැඩිම ලාභය තොග වෙළෙන්දා විසින් උපයා ගනු ලැබේ. පලතුරු අනුව පිරිවැය සංරචක වෙනස් වේ (උදා: කෙසෙල් සඳහා ඉහළම සංඝටකය ශ්‍රමය වන අතර අන්නාසි සඳහා එය රෝපණ වියදම විය).

2. වල් නාශක හා ඛනිජ පොහොරවලට ප්‍රවේශ වීමේ දුෂ්කරතාව, වියළි කාලවලදී ජල හිඟය සහ අඹ නිෂ්පාදනයේ වැඩි දියුණු කළ කෘෂි විද්‍යාත්මක භාවිතයන් සඳහා සීමිත ප්‍රවේශය අඹ නිෂ්පාදනයේ ප්‍රධාන බාධක ලෙස හඳුනා ගනු ලැබිණි.

3. පලතුරුවල ඉහළ අපද්‍රව්‍ය මට්ටම්, අපනයන ඇනවුම් සපුරාලීම පිණිස අගය එකතු කළ නිෂ්පාදන (අන්නාසි හා අඹ) සකස් කිරීම සඳහා අමුද්‍රව්‍ය ප්‍රමාණවත් නොවීම සහ සැකසුම් හා සිසිල් ගබඩා පහසුකම් නොමැතිකම වැනි අභියෝගයන්ය පලතුරු සකසන්නන් සහ අපනයනකරුවන් මුහුණ දෙයි.

**නිර්දේශ**

1. පාර්ශ්වකරුවන්ට විවිධ මාධ්‍යයන් හරහා පහසුවෙන් යාවත්කාලීන වෙළඳපළ තොරතුරු ප්‍රවේශ කිරීමෙන් වෙළඳපළ ඒකාබද්ධතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ හැකිය. නිසි ප්‍රවාහන හා ඇසුරුම් පද්ධති දිරිගැන්වීම මඟින් අධික නාස්තියක් සමඟ ඉහළ ගනුදෙනු පිරිවැය අඩු කළ හැකිය.

2. මෙම පලතුරුවල වර්තමාන වෙළඳපොළ පදනම පුළුල් කිරීම සඳහා මධ්‍යම හා දිගු කාලීන උපායමාර්ගික දැක්මක් හා සැලැස්මක් ඇති කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික සංවාදය ශක්තිමත් කිරීම.

3. කුඩා ගොවීන්ට විශාල නිෂ්පාදකයින් හා සකසනයන් සමඟ සම්බන්ධ වී පුළුල් ව්‍යාප්තියට ප්‍රවේශ වීම සඳහා සැපයුම් දාමය සංවර්ධනය කර ශක්තිමත් කළ යුතුය.

4. අස්වනු නෙළීම හා පසු අස්වනු ගැටලු විසඳීම සඳහා නිසි ලෙස ඇසුරුම් කිරීමේ ක්‍රමවේදයන්, ශ්‍රේණිගත කිරීම සහ ප්‍රමිතිකරණය සහ ඇසුරුම් නිවාස මෙහෙයුම් පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ගැනුම්කරුවන් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, නව වැඩිදියුණු කළ කෘෂි හා කළමනාකරණ භාවිතයන් පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමෙ වැනි පියවර අනුගමනය කිරීම.

# 05

## මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්වල පරමාර්ථය වන්නේ ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන කටයුතුවලට සම්බන්ධ පුද්ගලයින්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම සහ එමගින් ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවේ සමාජ, ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහි පුහුණු වැඩසටහන්වල සේවාදායකයින් ක්ෂේත්‍ර නිලධාරීන්, රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල ඉහළ නිලධාරීන්, ග්‍රාමීය අංශයේ සංවර්ධන කටයුතුවල නිරත වන නිලධාරීන් සහ ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව ඇතුළු පුළුල් පරාසයකට අයත් වේ.

මෙම අංශය විසින් 2019 වර්ෂය තුළ රට පුරා පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

### 1. ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ වැඩසටහන

**පුහුණු කණ්ඩායම:**

| | |
|---|---|
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - සම්පත්දායක |
| එස්.පී. ප්‍රනාන්දු මහතා | - සම්පත්දායක |
| බී.ඩී.එම්.ආර්.බී. දිසානායක මහතා | - සම්පත්දායක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

ජාතික කෘෂිකාර්මික සංවර්ධනයට සෘජුව දායක වීමට ඇති හැකියාව සහ පුළුල් නෛතික පදනමක් තිබියදීත් බොහෝ ගොවි සංවිධාන එහි පූර්ණ ශක්තියෙන් ක්‍රියාත්මක නොවේ. මෙම ඉලක්කය ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධාන සහ ගොවීන් අතර දුර්වල සම්බන්ධීකරණය ප්‍රධාන බාධකයක් වී තිබේ.

ගොවිජනතාවගේ දැනුම, හැකියාව හා ආකල්පවල වර්ධනයටත්, අත්‍යවශ්‍ය සේවාවක් ලබා ගැනීමටත් ගොවි සංවිධාන විශාල සේවාවක් ඉටු කළ ද ගොවි සංවිධාන හා ගොවිජනතාව අතර ගොඩනැගී ඇත්තේ ඉතාම අවාසිදායක සම්බන්ධතාවකි. එබැවින් ජාතික කෘෂිකාර්මික සංවර්ධනය තුළ සැබෑ කොටස්කරුවන් බවට මෙම පිරිස පත් කිරීම උදෙසා ඔවුන් තුළ සැඟවී ඇති සංවිධාන ශක්තිය පුබුදුවාලිය යුතුවා මෙන්ම ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට යෝග්‍ය පරිදි ඔවුන්ගේ කුසලතා හා හැකියා වර්ධනය කළ යුතුව ඇත.

මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ ඔවුන්ගේ ආයතනික කුසලතා වැඩි දියුණු කිරීමෙන් එම යෝජනාව සාක්ෂාත් කර ගැනීම සඳහා ය. ගොවි නායකයින්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම සහ ගොවිජන සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රියාකාරී හවුල්කරුවන් බවට පත් කිරීම තුළින් ගොවි සංවිධාන ශක්තිමත් කිරීම ද මෙහි අරමුණ විය.

මෙම වැඩසටහන අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය, පරංගියවාඩිය, හොරොව්පතාන, රත්මල්ගහවැව, පලුගස්වැව, මුරියකඩවල, ශිවාලකුලම, යකල්ල, කැකිරාව, ඇලයාපත්තුව, තන්තිරිමලේ, රන්නෝරාව, නොච්චියාගම,පෙමාදුව, ගම්මිරිගස්වැව, මැදවච්චිය, මිහින්තලේ, ඉපලෝගම, නාගම්පහ, ආඩියාගල, තිරප්පනේ යන ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන ආවරණය වන ලෙස පවත්වන ලදී. කාන්තා ගොවි නායකයින් 1880ක් පමණ පුහුණු කරන ලදී. අනුරාධපුරයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය සහ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල ගොවිජන සංවර්ධන නිලධාරීහු මෙම වැඩසටහනට සහාය වූහ.





## 2. නිරෝගී පරපුරක් සඳහා කෘෂිකර්මාන්තය

පුහුණු කණ්ඩායම

| | |
|---|---|
| එස්.පී. ප්‍රනාන්දු මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සම්පත්දායක |
| ජී.වී.එන්. අයෝමි මිය | - සහකාර සම්බන්ධීකරණ නිලධාරී |
| එච්.එල්.එල්. සාලින්ද මහතා | - සම්බන්ධීකරණ සහායක |

පළාත් සහ අන්තර් පළාත් සභා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයා

**මූල්‍ය ප්‍රභවය:** ඒකාබද්ධ අරමුදල

කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය වැඩිවීම අද බරපතල සෞඛ්‍ය හා පාරිසරික උපද්‍රවයකට තුඩු දී තිබේ. නිදන්ගත වකුගඩු රෝග සහ වෙනත් හඳුනා නොගත් රෝග රටේ බොහෝ ප්‍රදේශවල වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතින අතර එමඟින් විශාල සමාජ හා ආර්ථික ගැටලු ඇති වේ.

මෙම එක්දින දැනුවත් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වූයේ කෘෂි රසායනික භාවිතය, මානව සෞඛ්‍යයට කෘෂි රසායනික ද්‍රව්‍යවල බලපෑම සහ වකුගඩු රෝගයේ මුල් රෝග ලක්ෂණ පිළිබඳව දැනුවත් කිරීම සහ කෘෂිකර්මාන්තයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගනිමින් සෞඛ්‍ය සම්පන්න පරම්පරාවක් ඇති කිරීම සඳහා ගොවි සංවිධානය ශක්තිමත් කිරීමයි.

මෙම වැඩසටහන රඹෑව, පූනෑව, ඇතාකඩ, මැදවච්චිය, කල්ලන්චිය, කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, පදවිය, ගලෙන් බිඳුණුවැව, හොරොව්පතාන, රත්මල්ගහවැව, කොන්වැව, පරංගියාවාඩිය, ඇලයාපත්තුව, නොච්චියාගම, රනෝරාව, ගම්මිරිස්ගස්වැව, පෙමාදුව, මිහින්තලේ සහ තන්තිරිමලේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ආවරණය වන පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවත්වන ලදී.ගොවි නායකයින් 1803 දෙනෙකු පුහුණු කරන ලදී. අනුරාධපුරයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය සහ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල ගොවිජන සංවර්ධන නිලධාරීහු මෙම වැඩසටහනට සහාය වූහ.





## 3. ගොවි කාන්තාවන් සවිබල ගැන්වීම

**පුහුණු කණ්ඩායම:**

| | |
|---|---|
| එස්.පී. ප්‍රනාන්දු මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සම්පත්දායක |
| එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - සම්පත්දායක |
| එච්.එල්.එල්. සාලින්ද මහතා | - සම්බන්ධීකරණ සහායක |

පළාත් සහ අන්තර් පළාත් සභා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයා

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

ගොවි ප්‍රජාව සමෘද්ධිමත් එකක් බවට පත් කිරීම සඳහා ගොවි කාන්තාවන් සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකේ.

කෙසේ වෙතත්, දුර්වල නායකත්වය සහ කළමනාකරණ කුසලතා මෙන්ම තවත් බොහෝ ගැටලු හේතුවෙන් මෙය ප්‍රමාද වී ඇත. එබැවින් මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ ඔවුන්ගේ ආයතනික හා කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සඳහා ය. තීරණ ගැනීමේදී ඔවුන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම සහ කාන්තා ගොවි සංවිධාන සංවිධානයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පවුල් ප්‍රජාවට ශක්තිමත් කිරීම අනෙකුත් අරමුණු අතර විය.

මෙම වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කයේ මඩහපොල, ගනේවත්ත, මහානන්නේරිය, ඇහැටුවැව, කුඹුක්ගැටේ, මොරගොල්ලාගම, දොඩංගස්ලන්ද, ගල්ගමුව, කරදගොල්ල, පොතුහැර, ඉබ්බාගමුව, මහාරාච්චිමුල්ල, වැල්ලව, පොල්ගහවෙල, රඹෑ, කොටවෙහෙර,මාවතගම, නිකවැරටිය, මහව, රාජාංගනය යන ගොවිජන මධ්‍යස්ථාන ආවරණය වන ලෙස සිදු කර තිබේ. කාන්තා ගොවි නායකයින් 2028 දෙනෙකු පුහුණු කරන ලදී. කුරුණෑගල ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය සහ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල ගොවිජන සංවර්ධන නිලධාරීහු මෙම වැඩසටහනට සහභාගී වූහ.

## 4. කෘෂි ව්‍යාපාර හා අලෙවිකරණ ව්‍යාප්තිකරණය භාවිතා කිරීම පිළිබද වැඩමුළුව

**පුහුණු කණ්ඩායම:**

| | |
|---|---|
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - සම්පත්දායක |
| ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | - සම්පත්දායක |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සම්පත්දායක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සුළු පරිමාණ යැපුම් ගොවිතැන් උප අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මේ අනුව පසුගිය ශතවර්ෂයේ අග භාගයේ සිට සෑම තරාතිරමකම ව්‍යාපාර පදනම් කරගත් ව්‍යාපාර සෑම මට්ටමකින්ම වර්ධනය විය.

යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර හා කළමනාකරණ පීඨයේ අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා කෘෂි ව්‍යාපාර සහ අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දළ විශ්ලේෂණයක් සැපයීම සඳහා මෙම වැඩසටහන සකස් කරන ලදී.

දෙදින වැඩමුළුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී පවත්වන ලද අතර යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂි ව්‍යාපාර හා කළමනාකරණ පීඨයේ සිසුන් 88 දෙනෙක් සහභාගී වූහ.




## 5. ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය සඳහා සහභාගීත්ව ක්‍රමවේද (ප්‍රජා සහභාගීත්ව ගැමි විමසුම /කඩිනම් ගැමි විමසුම)

**පුහුණු කණ්ඩායම :**

| | |
|---|---|
| එස්.එම්.ඒ සමරකෝන් | - සම්බන්ධීකරණ නිලධාරී |
| ආර්.එල්.එන් ජයතිස්ස | - සම්පත්දායක |
| එච්.එම්.ජේ.කේ හේරත් | - සම්පත්දායක |
| එස්.පී ප්‍රනාන්දු | - සම්පත්දායක |
| වී.කුරුප්පු | - සම්පත්දායක |
| ඩී.එම්.ඒ.සී දිසානායක | - සම්පත්දායක |
| එච්.එල්.එල් සාලින්ද | - සම්බන්ධීකරණ සහායක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

කඩිනම් ග්‍රාමීය ඇගයීමේ හා ප්‍රජා සහභාගීත්ව ගැමි විමසුම යනු අඩු වියදමකින්, කඩිනමින් ග්‍රාමීය තත්ත්වයන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම සඳහා භාවිතා කරන සාපේක්ෂව නව තාක්ෂණික ක්‍රම වේ. ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ ඇගයීම ඇතුළු සංවර්ධන ව්‍යාපෘතිවල විවිධ අදියරයන් සම්පූර්ණ කිරීම සඳහා මෙම ක්‍රම සාර්ථකව භාවිතා වේ. ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්කරණය සහ සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම පිණිස ප්‍රජා සහභාගීත්ව ගැමි විමසුම /කඩිනම් ගැමි විමසුම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම, කුසලතා සහ හැකියාව වැඩි දියුණු කිරීම මෙහි අරමුණයි.

මෙම පුහුණු වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වූයේ ජනතා සහභාගීත්වයේ වටිනාකම පිළිබඳව සහභාගීවූවන් ව දැනුවත් කිරීමයි. ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්කරණය සහ සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ප්‍රජා සහභාගීත්ව ගැමි විමසුම /කඩිනම් ගැමි විමසුම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම ද මෙහි අරමුණයි.

2019 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා වැඩසටහන් දෙකක් පවත්වන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂය විශේෂඥයින් සහ කෘෂිකර්ම උපදේශකවරුන් 60දෙනෙකු සහ කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහායකයින් පුහුණු කරන ලදි.

## 6. සමාජ සජීවිකරණය (ව්‍යාප්තිකරණ ක්‍රමවේදය)

**පුහුණු කණ්ඩායම:**

| | |
|---|---|
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | - සම්පත්දායක |
| එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - සම්පත්දායක |
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - සම්පත්දායක |
| එස්.පී. ප්‍රනාන්දු මහතා | - සම්පත්දායක |
| වී. කුරුප්පු මහතා | - සම්පත්දායක |
| බී.ඩී.එම්.ආර්.බී. දිසානායක මහතා | - සම්පත්දායක |
| එච්.එල්.එල් සාලින්ද මහතා | - සම්බන්ධීකරණ සහායක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

ඕනෑම සංවර්ධන ව්‍යාපාරයක් සඳහා ඉහළ ප්‍රජා සහභාගීත්වයක් ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ප්‍රධාන වේ. පුහුණු වැඩසටහන ප්‍රධාන වශයෙන් සැලසුම් කර ඇත්තේ ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන කටයුතුවල නියැළී සිටින ව්‍යාප්ති නිලධාරීන් සඳහා සමාජ සජීවීකරණය සහ ව්‍යාප්ති ක්‍රමවේදය පිළිබඳ සහභාගිවන්නන්ගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ය.

එවැනි වැඩසටහන් දෙකක් 2019 දී පවත්වන ලදී. මෙම වැඩසටහන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් සඳහා පවත්වන ලද අතර ගොවිජන සංවර්ධන නිලධාරීන් 93 දෙනෙකු, සංවර්ධන නිලධාරීන් සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහායකයින් 93 දෙනෙක් සහභාගී වූහ.

### අවසන් කළ අධ්‍යයන

### 1. ශ්‍රී ලංකාවේ පොලිතීන් බෑග් සහ ලන්ච් ෂීට් තහනම: බලපෑම්, අභියෝග සහ විකල්පයන්

**පර්යේෂණ කණ්ඩායම:**

| | |
|---|---|
| එස්.පී. ප්‍රනාන්දු මහතා | - සම්බන්ධීකරණ නිලධාරී |
| ජී.වී.එන්. අයෝමි මිය | - සම පර්යේෂක |
| අයි.වී.කුරුප්පු මහතා | - සම පර්යේෂක |
| පි.සී.ජේ. ද සිල්වා මහතා | - සම පර්යේෂක |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සම පර්යේෂක |
| එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - සම පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය:** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු:**

පොලිතින් අපද්‍රව්‍ය පරිසරයට සිදුකරන අහිතකර බලපෑම සැලකිල්ලට ගනිමින් 2017 සැප්තැම්බර් මස සිට පොලිතින්, "සිලි මළු" සහ ලන්ච්ෂීට් සම්පූර්ණයෙන් තහනම් කිරීමට රජය ක්‍රියා කළේය. විකල්පයන් නොමැතිකම හේතුවෙන් තමුන් දැඩි ලෙස අපහසුතාවයට පත්ව ඇති බවට එක් කොටසක් අදහස් ඉදිරිපත් කරන විට කර්මාන්තයේ නිරතව සිටි අයගේ ජීවනෝපායට ද දැඩි බලපෑමක් කර ඇති බවට ද තවත්

පිරිසකගෙන් චෝදනා එල්ල විය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පොලිතීන් බෑග් සහ ලන්ච් ෂීට් තහනම හේතුවෙන් මතුව ඇති වර්තමාන තත්ත්වය අධ්‍යයනය සහ ඒ සඳහා ගත හැකි පිළියම් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. විවිධ අයුරින් පොලිතීන් හා ප්ලාස්ටික් කර්මාන්තයට සම්බන්ධ පිරිස් 1400 දෙනෙකු මෙම

අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට භාජනය කළ අතර බස්නාහිර පළාත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යයනය සිදු කළේය.

**සොයා ගැනීම්**

පොලිතීන් භාවිතය සම්බන්ධයෙන් වූ මෙම පනත මඟින්ම පොලිතීන් අධික භාවිතයකට දිරි දෙයි. තහනමෙන් පසු හඳුන්වා දුන් ප්‍රමිතියෙන් අඩු පොලිතීන් හේතුවෙන් ජනතාව අතර පොලිතින් භාවිතය වැඩි වීම මඟින් පෙනී යනුයේ පොලිතීන් හා ප්ලාස්ටික් තහනම පිළිබඳ මහජනතාව විශාල වශයෙන් වැරදි අවබෝධයක් ලබා ඇති බවයි. එක් ශ්‍රී ලාංකිකයෙකු විසින් සාමාන්‍යයෙන් වසරකට කිලෝ ග්‍රෑම් 11ක් පමණ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය කරනු ලබන බව අධ්‍යයනය අනාවරණය කරයි. මෙම දත්තයන්, අපද්‍රව්‍යයන් මඟින් ඇති විය හැකි පාරිසරික බලපෑමේ විශාලත්වය පමණක් නොව, ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්තය සඳහා බහුල වශයෙන් අමුද්‍රව්‍ය පවතින බවද පෙන්වා දෙයි.

**නිර්දේශ**

1. පොලිතීන් නිෂ්පාදනයට හා භාවිතය සම්බන්ධයෙන් පවත්නා නීතිමය පනත් සංශෝධනය කිරීම.
2. ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා දැනටමත් ලොව වෙනත් රටවල ක්‍රියාත්මක කර ඇති ශ්‍රී ලංකාව තුළ ද භාවිතා කිරීමට හැකි ක්‍රමවේදයක් ලෙස “Polluter pays by way of extended producer responsibility” ක්‍රමවේදය හැඳින්විය හැකිය. මෙම ප්‍රවේශයේදී නිෂ්පාදකයා විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම පොලිතින් ප්ලාස්ටික් සහ ඇසුරුම් පරිසර හිතකාමී ලෙස බැහැර කරලීමට නිෂ්පාදකයා විසින් කටයුතු කළ යුතුය. එනම් තම නිෂ්පාදිතයෙන් ජනනය වන අපද්‍රව්‍ය නැවත යථා තත්ත්වයට පත් කර, කළමනාකරණය කරන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට නිෂ්පාදකයින් විසින්ම පියවර ගත යුතුය.
3. පරිසර හිතකාමී පොලිතීන් විකල්පයන් හඳුන්වා දීමට නිෂ්පාදකයින් දිරි ගැන්වීම

## 2. සුරක්ෂිත ජල ප්‍රභවයක් ලෙස උතුරු මැද පළාත තුළ වැසි ජලය භාවිතය ඉහළ නැංවීමේ විභවතාවය සොයා බැලීම

**පර්යේෂණ කණ්ඩායම:**

| | |
|---|---|
| ජී.වී.එන්. අයෝමි මිය | - සම්බන්ධීකරණ නිලධාරි |
| පි.සී.ජේ. ද සිල්වා මහතා | - සහාය පර්යේෂක |
| එස්.පී. ප්‍රනාන්දු මහතා | - සහාය පර්යේෂක |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සහාය පර්යේෂක |
| එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - සහාය පර්යේෂක |

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

පානීය ජල ගැටලුව සහ හඳුනා නොගත් වකුගඩු රෝගය උතුරු මැද පළාත තුළ ඇති ප්‍රධානතම ගැටලු ලෙස හැඳින්විය හැකිය. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය සහ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය සහ දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසත් තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වනුයේ පානීය ජල ගැටලු සහ හඳුනා නොගත් වකුගඩු රෝගයෙන් පීඩාවට පත් උතුරු මැද පළාත තුළ ජීවත් වන ජනතාවට සුරක්ෂිත ජල ප්‍රභවයක් ලෙස වැසි ජලය භාවිතය ඉහළ නැංවීමේ විභවතාවය සොයා බැලීමයි.

අධ්‍යයන ප්‍රදේශ තුළ පානීය අවශ්‍යතාව සඳහා භාවිතා කරන වැසි ජල ටැංකි සහ වෙනත් ජල ප්‍රභව තුළ ප්‍රමිතිය සොයා බැලීම, වැසි ජලය පානය සඳහා ජනතාව යොමු කිරීමේ ක්‍රමෝපායන් හඳුනා ගැනීම ආදිය අනෙකුත් අරමුණු අතර වේ.

**සොයා ගැනීම් :**

කාලගුණ දත්ත මත පදනම්ව, මහ හා යල සමයේ වර්ෂාපතනය අවම බැවින් වැසි සමයේදී වැසි ජලය එක්රැස් කිරීම මෙම පළාතට අත්‍යවශ්‍ය වේ. වැසි ජලය පරිභෝජනය කිරීම තුළින් පළාතේ ජනතාවට වැඩි කාලයක් ඉතිරි වීම, ආර්ථික වශයෙන් ලාබදායීබව හා සෞඛ්‍ය සම්පන්න බව සොයා ගන්නා ලදී. ගබඩා ටැංකියේ ප්‍රමාණය පවුලේ විශාලත්වය මත රඳා පවතින අතර ටැංකි සවිකිරීමේ ආරම්භක පිරිවැය බොහෝ කුටුම්භ සඳහා ඉහළ මට්ටමක පැවතුණි.

**නිර්දේශ:**

1. මෙම පහසුකම ලබා ගත නොහැකි අය දිරිමත් කිරීම සඳහා රජයේ ආධාරයක් හෝ ණය පහසුකම් යෝජනා ක්‍රමයක් සකස් කළ යුතුය. ටැංකි ඉදිකිරීම සඳහා අඩු වියදම් විකල්ප ද්‍රව්‍යයක් භාවිතා කිරීමෙන් පද්ධතියේ ආරම්භක පිරිවැය අඩු කළ හැකිය

2. ජල පෝෂක ප්‍රදේශය සහ පළමු නළ පද්ධතිය නිසි ලෙස නඩත්තු කිරීම සහ ටැංකි පද්ධතිය නිසි ලෙස නඩත්තු කිරීම මගින් වහල ජල පෝෂක ප්‍රදේශය වැඩිදියුණු කළ හැකි නම් කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකිය. මීට අමතරව, ටැංකි ඉදිකිරීම සඳහා අඩු වියදම් විකල්ප ද්‍රව්‍යයක් භාවිතා කිරීමෙන් පද්ධතියේ ආරම්භක පිරිවැය අඩු කළ හැකිය.

3. වැසි ජල ටැංකි භාවිතා කරන්නන් විසින් නියමිත කාලවල දී වැසි ජලය රැස් කිරීම සඳහා සහ නඩත්තුව පිළිබඳ හොඳ අවබෝධයකින් සිටිය යුතු ය. වැසි ජල ටැංකි හිමියන් නියමිත කාලවල දී වැසි ජලය රැස් කිරීම පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය ද පර්යේෂණ කණ්ඩායම මඟින් හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා වැසි ජල ටැංකි හිමියන් සහ ප්‍රාදේශීය කෘෂි නිලධාරි අතර ජාල සම්බන්ධයක් අවශ්‍යතාවය හඳුනා ගෙන තිබේ.

4. වැසි ජල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ.

5. වැසි ජලය එක්රැස් කිරීමේ කාලය පිළිබඳව වැසි ජල ටැංකි භාවිතා කරන්නන් දැනුවත් කිරීම සඳහා යෙදුමක් හෝ සන්නිවේදන පද්ධතියක් (කෙටි පණිවුඩ අනතුරු ඇඟවීමේ පද්ධතියක්) ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන කාර්යාල හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් සංවර්ධනය කළ හැකිය.

## සිදු කරමින් පවතින අධ්‍යයන

### 01. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා (පොල් මද ආශ්‍රිත නිෂ්පාදන) ගෙවතු තුළ පොල් වගාවේ බලපෑම සොයා බැලීම

**පර්යේෂණ කණ්ඩායම:**

| | |
|---|---|
| ජී.වී.එන්. අයෝමි මිය | - සම්බන්ධීකරණ නිලධාරි |
| පී.සී.ජේ. ද සිල්වා මහතා | - සහාය පර්යේෂක |
| එස්.ජී. ප්‍රනාන්දු මහතා | - සහාය පර්යේෂක |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - සහාය පර්යේෂක |
| විරාජිත් කුරුප්පු මහතා | - සහාය පර්යේෂක |

**මූල්‍ය ප්‍රතිපාදන :** භාණ්ඩාගාර අරමුදල

**විෂයපථය සහ අරමුණු :**

ගෘහස්ත පොල්ගෙඩි නිෂ්පාදනය ගෙවතු මට්ටමින් ඉහළ නැංවීම හා වගාවට බලපා ඇති ගැටලු හඳුනා ගැනීම මගින් ජාතික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක වීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. එහි ඇති වැදගත්කම හේතුවෙන් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන තුළින් ද දැනට පවතින වාර්ෂික පොල් නිෂ්පාදනය වන පොල් ගෙඩි මිලියන 2800ක ප්‍රමාණය මිලියන 800කින් පමණ වැඩි කිරීම ඉලක්ක කර තිබේ.

මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි ගෙවත්තේ විභවතාවය සොයා බැලීමයි.

**අධ්‍යනයේ වත්මන් තත්ත්වය**

ප්‍රතිපත්ති සම්පාදකයින්, පොල්වතු හිමියන් පොල් මද හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල නියැළෙන්නන් පරිභෝගික ජනතාව, ගෙවතු හිමියන් මෙම ඉලක්ක ගත කණ්ඩායම් වේ. මෙම අධ්‍යයනය ගම්පහ, කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික්ක තුළ සිදු කරන ලදී. ගෙවතු 384ක් පමණ මෙම අධ්‍යයනය සඳහා යොදාගත් අතර ශ්‍රී ලංකාවේ පොල් සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි සියලුම පොල් හා පොල් නිෂ්පාදන ආශ්‍රිත නියැළෙන්නන් මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් අතර පර්යේෂණ වාර්තාව සකසමින් පවතී.

# 06

## සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අරමුණු අනුව කෘෂි අංශයේ තොරතුරු රැස්කිරීම, ඒවා යාවත්කාලීන කිරීම, විශ්ලේෂණය සහ බෙදා හැරීම සඳහා ගන්නා ලද ඒකාබද්ධ උත්සාහයක් අනුව සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය ස්ථාපනය කර ඇත. මෙම අංශය, ආයතනය විසින් කරනු ලබන සමාජ - ආර්ථික සමීක්ෂණවල දත්ත ගබඩා කිරීම සහ විශ්ලේෂණයට අමතරව ආයතනයේ අභිමතාර්ථ වෙනුවෙන් පහත සඳහන් ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහාය වනු ඇත.

මෙම අංශය දත්ත සංවර්ධන හා දත්ත සැකසුම් ලෙස ඒකක දෙකකින් සමන්විත ය. පසු කාලීනව, පරිගණක සහ පරිගණක ජාලකරණ යටිතල පහසුකම් සැපයීම සඳහා පරිගණක තාක්ෂණ ඒකකයක් ද ස්ථාපනය කරන ලදි.

**දත්ත සංවර්ධන අංශය**

කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රවල තොරතුරු එක්රැස් කිරීම, ගබඩා කිරීම සහ සේවා සැපයීමේ නියෝජිත ආයතනයක් ලෙස කෘෂිකාර්මික දත්ත බැංකුව, දත්ත සංවර්ධන ඒකකය තුළ ස්ථාපිත කර ඇත. එය විශේෂයෙන් සැලසුම් කර ඇත්තේ රජයේ නිලධාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින් සහ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සඳහා පුළුල් සංඛ්‍යාලේඛන මූලාශ්‍රයක කාර්යභාරය ඉටු කිරීම සහ තොරතුරු ප්‍රයෝජනවත් ආකාරයකින් බෙදා හැරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයෙන් ආහාර ද්‍රව්‍ය මිල ගණන් එකතු කරන ලදී. වර්ෂය තුළ පහත සඳහන් තොරතුරු එක්රැස් කරන ලදී.

- ආනයන - 2017, 2018
- අපනයන - 2017
- සිල්ලර මිල ගණන් - 2018
- නිෂ්පාදක මිල - 2018
- තොග මිල - 2018
- බිම් ප්‍රමාණය - 2018
- නිෂ්පාදනය - 2018
- නිෂ්පාදන පිරිවැය - 2017 යල

පරිගණකගත දත්ත සමුදාය වර්ෂය තුළ පහත දැක්වෙන දර්ශක සමඟ යාවත්කාලීන කරන ලදී.

- වී පිළිබඳ සංඛ්‍යාලේඛන – බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය
- නිෂ්පාදක මිල – 2018
- සිල්ලර මිල - 2017 & 2018
- යල හා මහ කන්නයන්හි බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය සහ 2018 වර්ෂයේ සමස්තය

ඉහත දර්ශකයන්ට අයත් වාර්තා 106,154 ක් සමඟ දත්ත සමුදාය යාවත්කාලීන කරන ලදී.

**ඉල්ලුම මත දත්ත සැපයීම**

කෘෂිකාර්මික තොරතුරු සඳහා ඉල්ලීම් 143 ක් අභ්‍යන්තර හා බාහිර භාවිතා කරන්නන්ගෙන් කරන ලදී: 100 ක් අභ්‍යන්තර වූ අතර 43 ක් බාහිර ඉල්ලීම් විය.

**දත්ත රැස් කිරීම සඳහා පරිශීලනය කළ පොත්**

1. **ආර්ථික හා සමාජ විද්‍යාත්මක දත්ත - මහ බැංකුව 2018**
2. සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාන සාරාංශය -2018
3. වී සහ අනෙකුත් බෝග වගාවන් සඳහා යෙදවුම් වියදම - 2017 යල
4. රේගු දෙපාර්තමේන්තුවේ බාහිර වෙළඳ සංඛ්‍යාලේඛන – 2017/2018

**දත්ත සැකසුම් ඒකකය**

කෘෂිකාර්මික දත්ත සමුදාය හා නියැදි සමීක්ෂණවලින් ලැබෙන දත්ත හැසිරවීම සඳහා දත්ත සැකසුම් ඒකකය පිහිටුවන ලදී. දත්ත සංවර්ධන ඒකකයෙන් දත්ත කේතනය කර සත්‍යාපනය කළ පසු දත්ත සැකසුම් ඒකකය මඟින් තාක්ෂණික සහාය ලබා දේ. වර්ෂය තුළ දත්ත සමුදාය තුළ කෘෂිකාර්මික තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ඒකකය සිය සේවාවන් සපයන ලදී.

**පරිගණක තාක්ෂණික ඒකකය**

පරිගණක පද්ධති, ජාල සහ ඒවා සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම වෙනුවෙන් මෙම ඒකකය ස්ථාපනය කර ඇත. පරිගණක වල නඩත්තු හා අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා වෙනම ස්ථානයක් ඇත
වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරී ලෙස නිරත විය.

1. සියලුම මිලදී ගැනීම්වල දි පිරිවිතර සකස් කිරීම
2. තාක්ෂණික ඇගයීම් කමිටුවට සහභාගි වීම
3. පරිගණක මෘදුකාංග සහ තාක්ෂණික දෝෂවලට අයත් කටයුතු සිදු කිරීම.

# 07

# පුස්තකාලය

පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ගේ සහ සංවිධානවල ප්‍රයෝජනය සඳහා කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ. වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ විමර්ශන අවශ්‍යතා වෙනුවෙන් ග්‍රන්ථ 634ක්, ද විමර්ශන කෘති 17ක් සහ වාර ප්‍රකාශන 50ක් ද නිකුත් කර තිබේ. වර්ෂය තුළ පුස්තකාලයට පැමිණි පරිශීලකයින්ගේ සංඛ්‍යාව 260කි.

#### පොත්,සඟරා සහ වාර ප්‍රකාශන අත්පත් කර ගැනීම

වර්ෂය තුළ ග්‍රන්ථ 114ක් පුස්තකාල එකතුවට අත්පත් කර ගෙන ඇත. ඉන් 37ක් සෘජු මිල දී ගැනීම් වන අතර ග්‍රන්ථ 77ක් ප්‍රකාශන හුවමාරු වැඩසටහන යටතේ ලැබුණු ඒවා වේ. දේශීය සහ විදේශීය ආයතනවලින් විශාල වාර සඟරා, පුවත් හසුන්, වාර්ෂික වාර්තා ප්‍රමාණයක් හුවමාරු හෝ පරිත්‍යාග වශයෙන් ලැබී තිබේ. ආයතනය විසින් වර්ෂය තුළ විදේශීය සඟරා නාම 08කට (කලාප 96ක් ඇතුළත්) සහ දේශීය සඟරා නාම 02කට දායකත්වය ලබා ගන්නා ලදී.

#### පුස්තකාල සේවා

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි තොරතුරු සහ ප්‍රලේඛන සේවාවන් වන සාහිත්‍ය ගවේෂණය, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සහ ඡායා පිටපත් සේවාවන් සපයන ලදී.

පුස්තකාලය තුළ නවීන වයිෆයි පහසුකම ලබා ගැනීමත් සමඟ අන්තර්ජාල පාදක තොරතුරු පහසුකම් සඳහා වූ ප්‍රවේශය පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තව දුරටත් පුළුල් කරන ලදී. පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයින් සඳහා විවිධ විෂයන් යටතේ පවත්වාගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩ අනුක්‍රමණිකගත කොට ඇත.

#### අන්තර් පුස්තකාල සහයෝගීතාවය (ILC)

යම්කිසි පුස්තකාල ද්‍රව්‍යක් අප පුස්තකාලයේ හෝ වෙනත් විශේෂ පුස්තකාලයක නොමැති විට අන්තර් පුස්තකාල සහයෝගීතා ක්‍රමය මඟින් පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ පහසුකම අප පුස්තකාලය සතුව පවතී. එය ආයතනික මට්ටමින් සිදු විය යුතු අතර අන්තර් පුස්තකාල සහයෝගීතාව සඳහා ඉල්ලුම් කරන පුස්තකාල මුලින්ම එකඟතාවයකට/ නීති පද්ධතියකට යටත්ව අත්සන් කොට පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගත හැක. තවද, අපගේ පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා විද්‍යුත් ලිපි මඟින් විශ්වවිද්‍යාල අතර විද්‍යුත් ලිපි විද්‍යුත් ලියකියවිලි හුවමාරු කර ගැනීම ද සිදු කරනු ලබයි. 2018 වර්ෂයේ ජාතික ඒකාබද්ධ සූචිය යාවත් කාලීන කිරීම සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පුස්තකාල දත්ත ගබඩාව තුළින් සපයන ලදී.

#### ආයතන ප්‍රකාශන සංඛ්‍යාකගතකරණය (Digitization of Institute Publication)

ජාතික විද්‍යා පදනම මඟින් ආරම්භ කරන ලද ආයතන ප්‍රකාශන සංඛ්‍යාකරණය ව්‍යාපෘතිය මගින් අප ආයතනයේ ප්‍රකාශන සංඛ්‍යාකකරණය කර ඇති අතර (http://harti.nsf.ac.lk/) මඟින් ඒ සඳහා ප්‍රවේශ විය හැකිය. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ආයතනික විද්‍යුත් ප්‍රකාශන එකතුවක් පවත්වාගෙන යාම හා මාර්ගගත ප්‍රවේශය මගින් ඉක්මනින් ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සැලසීමය.

| ආයතන ප්‍රකාශන | එකතුවේ නම | වර්ෂය තුළ භාවිතා කළ පිරිස |
|---|---|---|
| | වාර්ෂික වාර්තා | 78 |
| | වාර්ෂික වාර්තා (දෙමළ) | 48 |
| | පනත් | 44 |
| වාර ප්‍රකාශන | Sri Lanka Journal of Agrarian Studies | 72 |
| | ගොවි කටයුතු අධ්‍යයනය | 110 |
| | ගොවි ජනතා | 94 |
| | ගොවි ජනතා | 116 |
| පර්යේෂණ වාර්තා | පර්යේෂණ වාර්තා (ඉංග්‍රීසි) | 130 |
| | පර්යේෂණ වාර්තා (සිංහල) | 118 |

| රට | භාවිතා කළ පිරිස |
|---|---|
| ජපානය | 249 |
| ශ්‍රී ලංකාව | 478 |
| ඇමරිකාව | 224 |
| ජර්මනිය | 51 |
| රුසියාව | 137 |
| ප්‍රංශය | 41 |
| දකුණු කොරියාව | 24 |
| අයිවරි කෝස්ට් | 5 |
| යුරෝපා සංගමය | 22 |
| ඕස්ට්‍රේලියාව | 5 |
| ඉන්දියාව | 6 |
| ඉතාලිය | 5 |
| එක්සත් රාජධානිය | 8 |
| චීනය | 10 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 3 |
| ස්විස්ටර්ලන්තය | 3 |
| ජපානය | 249 |
| ශ්‍රී ලංකාව | 478 |

### පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන්

අප පුස්තකාලය පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝවක් සහ අත් පත්‍රිකාවක් විශ්වවිද්‍යාල සිසුන් අතර බෙදා හරිනු ලැබූ අතර ආයතන වෙබ් අඩවියට උඩුගත කරන ලදී.

### ප්‍රකාශන හුවමාරු වැඩසටහන

ආයතනික ප්‍රකාශන (පොත්/වාර ප්‍රකාශන) 58ක් හුවමාරු පදනම යටතේ පහත සඳහන් පුස්තකාල වෙත යවන ලදී.

1) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික මධ්‍යස්ථානය
2) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
3) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
4) ජාතික විද්‍යා පදනම
5) යාපනය මහජන පුස්තකාලය
6) අන්තර්ජාතික ජල කළමනාකරණ ආයතනය
7) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
8) කොළඹ විශ්වවිද්‍යාලය
9) කැලණිය විශ්වවිද්‍යාලය
10) රුහුණු විශ්වවිද්‍යාලය
11) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
12) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
13) යාපනය විශ්වවිද්‍යාලය
14) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
15) රජරට විශ්වවිද්‍යාලය
16) සබරගමුව විශ්වවිද්‍යාලය
17) නැගෙනහිර විශ්වවිද්‍යාලය
18) මොරටුව විශ්වවිද්‍යාලය
19) වයඹ විශ්වවිද්‍යාලය
20) අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලය
21) බෞද්ධ සහ පාලි විශ්වවිද්‍යාලය

ඉහත පුස්තකාලවලින් ප්‍රකාශන 42ක් අප වෙත ලැබී ඇත.

# 08

## ප්‍රකාශන ඒකකය

ප්‍රකාශන ඒකකය, අංශ ප්‍රධාන, සංඛ්‍යාන හා දත්ත සැකසුම් / ප්‍රකාශන / පුස්තකාල හා භූවිද්‍යා තොරතුරු පද්ධති ඒකකය යටතේ ක්‍රියාත්මක වේ. පර්යේෂණ වාර්තා, කාලීන වාර්තා, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, අත් පත්‍රිකා සහ අනෙකුත් ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ම සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීම සිදු කෙරෙන්නේ මෙම ඒකකයෙනි. එමෙන් ම, අදාළ විද්‍යුත් වැඩසටහන් සැකසීම හා සම්බන්ධීකරණය සිදු වේ.

මෙම වසර තුළ පර්යේෂණ වාර්තා 06ක් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් කර ඇති අතර ඉංග්‍රීසි භාෂාවෙන් කාර්ය පත්‍රිකා 02ක් ද ප්‍රකාශයට පත් කර තිබේ. ඊට අදාළ විස්තර පහත දැක් වේ.

**පර්යේෂණ වාර්තා**

1. ශ්‍රී ලංකාවේ ගිනිකොන දිග වියළි කලාපීය කුඩා පරිමාණ බඩඉරිඟු වගාවේ තිරසරභාවය ආශ්‍රිත ගැටලු සහ වැඩි දියුණු කිරීමේ අවස්ථා
2. Sustainability of Crop Production System in South East Dry Zone of Sri Lanka : With Special Reference to Groundnut Green Gram and Sugarcane
3. Potentials of Farmer Interactive Action to Remedy Vegetable Marketing Problems : Relevant to selected Locations
4. Home Garden Fruit Cultivation in Sri Lanka : Determinants and the Role of Government Intervention
5. A Review of the Fertilizer Cash Grant Programme in Sri Lanka
6. Study on Absorption of Agriculture Graduates and Diploma Holders into the Agricultural Sector of Sri Lanka

**කාර්ය පත්‍රිකා**

1. Potentials and Constraints of Bio Pesticides and Bio Fertilizer Usage in Sri Lankan Agriculture
2. Lessons to be Learnt From Ancient Water Management Techniques of Sri Lanka for the Development of Integrated Water Resources Management Concepts

මෙයට අමතරව, 2019 වර්ෂය තුළ පහත සඳහන් වාර ප්‍රකාශනයන් නිකුත් කරන ලදී.

1. ගොවිජනතා - 20 වෙළුම (සිංහල) 04 කලාපය 2018 ඔක්.- දෙසැ.
2. ගොවිජනතා - 21 වෙළුම (සිංහල) 01 කලාපය 2019
3. ගොවිජනතා - 21 වෙළුම (සිංහල) 02 කලාපය 2019
4. ගොවිජනතා - 21 වෙළුම (සිංහල) 03 කලාපය 2019
5. ගොවිජනතා - 21 වෙළුම (සිංහල) 04 කලාපය 2019
6. කමලනම් - 34 වෙළුම (දමිල) 03 සහ 04 කලාප 2018
7. ගොවිකටයුතු පුවත් හසුන 42 වෙළුම 03 කලාපය 2018

8. ගොවිකටයුතු පුවත් හසුන 42 වෙළුම 04 කලාපය 2018
9. ගොවිකටයුතු පුවත් හසුන 43 වෙළුම 01 කලාපය 2019
10. ගොවිකටයුතු පුවත් හසුන 43 වෙළුම 02 කලාපය 2019
11. ගොවිකටයුතු පුවත් හසුන 43 වෙළුම 03 කලාපය 2019

අදාළ කාල පරිච්ඡේදය තුළ ප්‍රකාශන ඒකකය පහත සඳහන් ප්‍රදර්ශන, වැඩමුළු, ජාතික ප්‍රදර්ශන ආදියට සහභාගී වෙමින් ආයතනය පිළිබඳ ප්‍රචාරක කටයුතු, පොත් අලෙවි කිරීම් ආදියෙහි නිරත විය.

**ඡායාරූපකරණය පිළිබඳ එක්දින ප්‍රායෝගික පුහුණු වැඩමුළුව**

දීප ව්‍යාප්ත ක්ෂේත්‍ර මට්ටමින් පර්යේෂණයන්ට අදාළ ක්‍රියාකාරකම් හි නිරත වන ආයතනයේ පර්යේෂණ කාර්යමණ්ඩලයට හා උනන්දුවක් දක්වන්නන්ට තම පර්යේෂණ ක්‍රියාකාරකම්වලට අදාළ ඡායාරූප කිසියම් ශිල්පීය දැනුමකින් යුතුව ලබා ගැනීමට පුහුණුවක් ලබා දීමේ අරමුණින් ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුවක් ප්‍රකාශන ඒකකය විසින් සංවිධානය කරනු ලැබිණි.

ක්ෂේත්‍ර ඡායාරූප වඩාත් වටිනා සහ තොරතුරුමය වැදගත්කමකින් යුතුව ලබා ගැනීමට පුහුණු කිරීම එහි අරමුණයි. ආයතනයේ පර්යේෂණ නිලධාරීන්, සංඛ්‍යාන නිලධාරීන්, සංඛ්‍යාන සහකාරවරුන් සහ අනියම් විමර්ශකයින්ට ඡායාරූපකරණය පිළිබඳ න්‍යායාත්මක දැනුමක් හා පුහුණුවක් මෙහිදී සපයන ලදී. ප්‍රවීණ ඡායාරූප ශිල්පී, දේශක ඉන්ද්‍රනාථ තේනුවර මහතා විසින් වැඩමුළුව මෙහෙය වූ අතර වැඩමුළුව 2019 දෙසැම්බර් මස 16 දින නව ශාලාවේ දී පැවැත්විණි.

# වෙනත් ක්‍රියාකාරකම්

**පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්**

1. පර්යේෂණ නිලධාරිනි ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන මහත්මිය විසින් 2019 සැප්තැම්බර් 9 සිට 11 දක්වා ස්කොට්ලන්තයේ එඩින්බරෝ හි නවවන පැන් පොදුරාජ්‍ය මණ්ඩලීය සංසදයේදී **'තෙත්බිම් කළමනාකරණයේ සහභාගීත්ව ප්‍රවේශයන්ගේ කාර්යභාරය: දකුණු ශ්‍රී ලංකාවේ බුන්දල තෙත්බිමෙන් සාක්ෂි'** යන මාතෘකාව යටතේ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළාය.

2. පර්යේෂණ නිලධාරිනි ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන මහත්මිය විසින් 2019 පෙබරවාරි 28 වන දින රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකර්ම හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී 'Economic Valuation of Wetland Attributes using a Choice Experiment: A Case of Bundala Wetland in Sri Lanka' යන මාතෘකාවෙන් යුත් පර්යේෂණ සාරාංශයක් ඉදිරිපත් කර ප්‍රකාශයට පත් කළාය.

3. පර්යේෂණ නිලධාරී ඩී.එම්.ජේ.සී. දිසානායක මහතා 2019 නොවැම්බර් 14 වන දින ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පැවති (ICSUSL 2019) හත්වන ජාත්‍යන්තර සමුළුවේදී 'ශ්‍රී ලංකා ගොවීන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබේද?' යන මාතෘකාවෙන් යුත් පර්යේෂණ පත්‍රිකාවත් ඉදිරිපත් කළේය.

4. පර්යේෂණ නිලධාරී ඩී.එම්.ජේ.සී. දිසානායක මහතා 'ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම අවම කිරීමේ පියවරක් ලෙස විදුලි වැටෙහි විභවතාවන් සහ අභියෝග: මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්ක පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්' යන මාතෘකාව යටතේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ පස්වන අන්තර්ජාතික (RUICHSS) සමුළුවට පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය. රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් 2019 සැප්තැම්බර් 26 දින එය සංවිධානයකරන ලදී.

5. පර්යේෂණ නිලධාරිනී ආර්.එම්.ඩී.එච්.රත්නායක මහත්මිය විසින් ලෝක කෘෂිකාර්මික පර්යේෂණ සඟරාවෙහි 2019 මාර්තු 05වන දින ප්‍රකාශයට පත් වෙළුම 7, අංක 3, 45-55 සඳහා 'Spacing and Fertilizer Levels on Physical and Chemical Yield of Different Parts of Pogostemon heyneanus Benth (Lamiaceae),' නමැති පර්යේෂණ ලිපිය ඉදිරිපත් කළාය.

6. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුචිනි විදානපතිරන මහත්මිය විසින් 'කෘෂිකර්ම, ආහාර සුරක්ෂිතතාව සහ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී (AgroFood 2019) ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු සැපයුම් දාමයන්හි ආරක්ෂිත ගැටලු: සමාලෝචනයක්' යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කොට ප්‍රකාශයට පත් කළාය. එම සමුළුව ගාලු මුවදොර හෝටලයේ දී 2019 නොවැම්බර් 07 සිට 08 දක්වා පැවැත්විණි.

**ප්‍රකාශන (පුවත්පත් හා වාර ප්‍රකාශ ලිපි)**

1. මොණරාගල දිස්ත්‍රික්කයේ තෙලුල්ල ප්‍රදේශයේ විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම පිණිස වූ ශක්‍යතා වාර්තාව ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරන මහත්මිය විසින් සකස් කරන ලදී. එය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය වෙනුවෙන් පිළියෙල කළ එකක් වූ අතර 2018 දෙසැම්බර් සිට 2019 මාර්තු දක්වා කාලය තුළ සිදු කරන ලදී.

2. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරන මහත්මිය විසින් කෘෂිකර්ම, ආහාර සුරක්ෂිතතාව සහ සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී (Agro Food 2019) පළ කල (ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු සැපයුම් දාමයන්හි ආරක්ෂිත ගැටලු: සමාලෝචනයක්) සාරාංශ ග්‍රන්ථයේ ලිපියක් පළ කරන ලදී.

3. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරන මහත්මිය විසින් 2019 අප්‍රියෙල් මස 05වන දින පළවූ ඩේලි නිව්ස් පුවත්පතට "Recent trends in milk production and consumption" යන ශීර්ෂයෙන් ලිපියක් සම්පාදනය කළාය. එහි අන්තර්ජාල දිගුව http://www.dailynews.lk/2019/04/05/features/182279/recent-trends-milk-production-and-consumption. වේ.

4. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරන මහත්මිය විසින් "රට කිරට හැඬීම නතර කිරීමට නම් ශීර්ෂයෙන් යුතු පුවත්පත් ලිපියක් 2019 අප්‍රියෙල් 17 දින දිනමිණ පුවත්පත සඳහා සම්පාදනය කළාය. එහි අන්තර්ජාල දිගුව http: //www.dinamina.lk//2019/04/17/.../රට-කිරට-හැඬීම-නතර-කිරීම.

5. පර්යේෂණ නිලධාරිනි නොරිකා අයෝමි මහත්මිය විසින් 2019 ජූලි- සැප්තැම්බර් ගොවිජනතා කලාපයේ 21 වෙළුම සඳහා උතුරු මැද පළාතේ සෞඛ්‍යාරක්ෂිත පානීය ජල මූලාශ්‍රයක් ලෙස වැසි ජලය භාවිතය පිළිබඳ ලිපියක් සම්පාදනය කළාය.

6. 2019 අගෝස්තු 27වන දින පළ වූ ඩේලි නිව්ස් පුවත්පතට පර්යේෂණ නිලධාරිනි නොරිකා අයෝමි මහත්මිය විසින් "Potential of Promoting Rainwater as a Source of Safe Water Consumption in North Central Province of Sri Lanka" යන ශීර්ෂයෙන් ලිපියක් සම්පාදනය කළාය.

**කමිටු, සමුළු සහ වැඩමුළු සඳහා දායකත්වය**

1. පර්යේෂණ නිලධාරී ඩී.එම්.ඒ.සී. දිසානායක මහතා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2019 දී සංවිධානය කරන ලද 'කෘෂිකාර්මික ක්ෂේත්‍රයට වන සතුන් විසින් සිදු කරන බෝග හානි කළමනාකරණය පිළිබඳ ජාතික කමිටුවට සහභාගී විය.

2. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝග පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විශේෂ පර්යේෂණ ඒකකයේ පර්යේෂකයින් සහ උසස් නිලධාරීන් සඳහා එක්දින වැඩමුළුවක් පැවැත්විය. එහි දී ඔහු සම්පත්දායකයෙකු ලෙස ද කටයුතු කළේය.

3. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා ජීවන වියදම පිළිබඳ සතිපතා කැබිනට් අනු කමිටුවට සහභාගී වී වෙළඳපොලේ අත්‍යවශ්‍ය ආහාර බෝග පිළිබඳ විශ්ලේෂණාත්මක සමාලෝචනයක් සපයන ලදී.

4. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ බඩ ඉරිඟු ආනයනය පිළිබඳ ජාතික වැඩසටහනේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.

5. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ වී සහ සහල් තොග කළමනාකරණය සඳහා වූ ජාතික කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය.

6. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධයක නිලධාරී ලෙස 2019 සැප්තැම්බර් 29 සිට 2020 ජනවාරි 29 දින දක්වා කටයුතු කළේය.

7. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී. ද. එල්.ඩබ්. සමරසිංහ මහත්මිය ශ්‍රී ලංකා ජල හවුල්කාරිත්වයේ මෙහෙයුම් කමිටුවේ (ලංකා ජලනි) සාමාජිකාවක කටයුතු කළාය.

8. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී. ද. එල්.ඩබ්. සමරසිංහ මහත්මිය දකුණු ආසියානු ධාරිතා වර්ධන, කෘෂිකාර්මික හා ජල දූෂණය පිළිබඳ ව්‍යාපෘතියේ උපදේශක කමිටුව සාමාජිකාවක් ලෙස කටයුතු කරයි. එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ අර්ථවර්යා පදනම, කරිටාස් ස්විට්සර්ලන්තය සහ එක්සත් ජනපද රජය ඒකාබද්ධව ක්‍රියාත්මක කරයි.

9. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයේ (CARP) ස්වාභාවික සම්පත් කළමනාකරණය, තිරසාර කෘෂිකර්මාන්තය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික කමිටුවේ කමිටු සාමාජිකාවක් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී. ද. එල්.ඩබ්. සමරසිංහ මහත්මිය කටයුතු කරයි.

10. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරන මහත්මිය ශ්‍රී ලංකාවේ මල් වගා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුවේ කමිටු සාමාජිකාවක් ලෙස සේවය කළාය.

**රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් සඳහා දායකත්වය**

1. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා සිරස ටීවී නාලිකාවේ විකාශය වූ "අස්වැන්න" සජීවී රූපවාහිනී වැඩසටහන් දෙකකට සහභාගී විය.

2. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, රංගිරි එෆ්.එම් හි විකාශය වන "බොරදිය මංකඩ" වැඩසටහනට සහ "කෘෂිකාර්මික නවෝදය" වැඩසටහන් හතරකට සහභාගී විය.

.

## 2019 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල තත්ත්වය

| | 31.12.2018 දිනට තත්ත්වය | වර්ෂය තුළ සේවය අත් හිටුවීම, සේවයෙන් ඉවත් වීම | පත්වීම් | 31.12.2019 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 1 | 1 | - | - |
| අතිරේක අධ්‍යක්ෂ | 1 | - | - | - |
| අංශ ප්‍රධානීන් | 6 | - | - | 6 |
| පර්යේෂණ කාර්යමණ්ඩලය | 30 | - | - | 30 |
| පරිපාලන කාර්යමණ්ඩලය | 8 | - | 1 | 9 |
| පුස්තකාල ජොෂ්ඨ කාර්යමණ්ඩලය | 2 | - | - | 2 |
| දත්ත බැංකුව | 2 | - | - | 2 |
| පරිගණක ඒකකය | 1 | - | - | 1 |
| ප්‍රකාශන ඒකකය | 5 | - | - | 5 |
| සංඛ්‍යාන කාර්යමණ්ඩලය | 29 | 7 | - | 22 |
| තාක්ෂණික කාර්යමණ්ඩලය | 5 | 2 | - | 3 |
| ලිපිකාර, ලේකම් සහ සමාන්තර ශ්‍රේණි | 49 | 3 | 2 | 48 |
| මෙහෙයුම් හා සමාන්තර ශ්‍රේණි | 46 | 1 | 1 | 46 |
| **එකතුව** | **185** | **15** | **4** | **174** |

# කාර්ය මණ්ඩල සංවර්ධනය

2019 වර්ෂයේ දී ආයතනය විසින් රු. මිලියන 2.1 ක මුදලක් කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා ආයෝජනය කළ අතර, එයින් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 45ක් සහ මාණ්ඩලික නොවන සාමාජිකයින් අට දෙනෙකු දේශීය පුහුණුව ලබා ගත්හ. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 9 දෙනෙකු විදේශ පුහුණුව සඳහා සහභාගී වූහ.

**පහත සඳහන් පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වූහ:**

| | | |
|---|---|---|
| එච්.ජේ.සී. ජයසූරිය මයා | - | පශ්චාත් උපාධි අධ්‍යයන (ශාස්ත්‍රපති) ඕස්ට්‍රේලියාව 2019 ජනවාරි 08 - 2020 දෙසැම්බර් 31 |
| පී.ඒ.ජේ. චම්පිකා මිය | - | පශ්චාත් උපාධි අධ්‍යයන (ශාස්ත්‍රපති) ඕස්ට්‍රේලියාව 2019 ජනවාරි 08 - 2020 දෙසැම්බර් 31 |
| පී.සී.ජේ. ද සිල්වා මයා | - | ප්‍රජා සංවර්ධනය පිළිබඳ ආචාර්ය උපාධිය, පිලිපීනයේ උපාධි විද්‍යාලයෙහි 2019 පෙබරවාරි 19 සිට 2022 පෙබරවාරි 01 දක්වා. |

**විදෙස් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම**

**වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළු/සම්මේලන/රැස්වීම් ආදිය**

1. 2019 ජනවාරි 21 සිට පෙබරවාරි 17 දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද් නුවර පැවති "ජාතික ග්‍රාම සංවර්ධන හා පංචායත් රාජ් ආයතන (NIRD-PR) " පුහුණු වැඩසටහනට ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි එම්.ඩී සුසිලා ලූර්දු මහත්මිය සහභාගී වූවාය.

2. 2019 පෙබරවාරි 18 සිට මාර්තු 17 දක්වා ඉන්දියාවේ පැවති "දරිද්‍රතාවය අවම කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සහභාගීත්ව සැලසුම් කිරීම" යන පුහුණු වැඩසටහනට පර්යේෂණ නිලධාරි අයි.කේ එදිරිසිංහ මහත්මිය සහභාගී වූවාය.

3. අතිරේක අධ්‍යක්ෂ ආර්.එල්.එන්. ජයතිස්ස මහතා 2019 මාර්තු 01 සිට මාර්තු 10 දක්වා වියට්නාමයේ පැවති "Food Waste to Wealth: Post – Harvest to Market" යන CIRDAP - NIRD සහ සහයෝගී ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

4. අධි පර්යේෂක පී.ආර්. වීරක්කොඩි මහත්මිය ආසියා හා ශාන්තිකර කලාපයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානයේ (CIRDAP) 34 වෙනි තාක්ෂණික කමිටු රැස්වීමට සහභාගී වූවාය. එය 2019 ජුනි 25 දින සිට ජුනි 28 දක්වා ඉන්දියාවේ දී පැවැත්විණි.

5. 2019 අගෝස්තු 19 සිට අගෝස්තු 24 දක්වා චීනයේ පැවති "ජෛව පොහොර හා ජෛව පළිබෝධනාශක: ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය" පිළිබඳ 04 වන ජාත්‍යන්තර සමුළුවට ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි තිලානි පද්මජානි මහත්මිය සහභාගී වූවාය.

6. නේපාලයේ ලිබර්ඩ් සහ ඉන්දියාවේ DHAN පදනම ඒකාබද්ධව සංවිධානය කරන ලද "කෘෂිකාර්මික, පශු සම්පත් හා වන කළමනාකරණයේ ජල දූෂණය පිළිබඳ පුහුණු කරන්නන් පුහුණු කිරීමේ කලාපීය වැඩසටහනට" ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි සිදත් බණ්ඩාර මහතා සහභාගී විය. මෙම වැඩසටහන නේපාලයේ පොහරා හිදී 2019 අගෝස්තු 28 සිට අගෝස්තු 30 දක්වා පැවැත්විණි.

7. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා, 2019 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 4 දක්වා ඉන්දුනීසියාවේ බාලි හි පැවති "කෘෂිකාර්මික පරිවර්තනය" පිළිබඳ වැඩමුළුවට සහභාගී විය.

8. අධි පර්යේෂක එච්.එම්.ජේ.කේ. හේරත් මහතා 2019 නොවැම්බර් 20 සිට නොවැම්බර් 29 දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද්හි පැවති "සැලසුම් හා කළමනාකරණය සඳහා භූ තොරතුරු හා නවීන සමීක්ෂණ ක්‍රම" පිළිබඳ CIRDAP - NIRD ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

## දේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම් – මාණ්ඩලික නිලධාරීන්

1. පර්යේෂණ නිලධාරීන් වන එස්.පී. ප්‍රනාන්දු මහතා සහ ජී.වී.එන්. අයෝමි මහත්මිය 2019 මාර්තු 14 සිට 16 දක්වා වැසිජල රැස් කරන්නනගේ සංසදයේ පැවති "වැසි ජලය එක්රැස් කිරීම සහ භූගත ජල ප්‍රතිපෝෂණය " පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවට සහභාගී වූහ.

2. පර්යේෂණ නිලධාරිනි ජේ.ඒ.යූ.පී. ජයසිංහ මහත්මිය 2019 ජුනි මස 20 වන දින ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනයේ පැවති "කලා ඔයා ද්‍රෝණියේ රාජාංගනේ ජලාශයේ විෂ සහිත ඇල්ගී මතුවීම" පිළිබඳ එක් දින වැඩමුළුවකට සහභාගී වූවාය.

3. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා 2019 ජුනි 6 සිට 7 දක්වා ජෙට්විං බ්ලූ හෝටලයේ පැවති "ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පාසල් පෝෂණ ක්‍රමය" වැඩසටහනට සහභාගී විය.

4. පර්යේෂණ නිලධාරිනි ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන මහත්මිය 2019 ජූලි 23 සිට 24 දක්වා බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ පැවති වගකීම්සහගත මූල්‍ය අන්තර්ග්‍රහණය (Responsible Financial Inclusion) පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවට සහභාගී වූවාය.

5. පුස්තකාලයාධිපතිනි එච්.එම්.ටී.ජී.එල්. හේරත් මහත්මිය 2019 අගෝස්තු 07 වන දින බන්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන කේන්ද්‍රයේ පැවති "දැනුම් සමාජයක පුස්තකාලවල කාර්යභාරය" නමැති සම්මන්ත්‍රණයට සහභාගී වූවාය.

6. දත්ත විශ්ලේෂක එන්.පී. ජයනෙත්ති මහත්මිය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පැවති "ජනගහන හා නිවාස සංගණනය - 2021" යන සම්මන්ත්‍රණයට 2019 සැප්තැම්බර් 17 දින සහභාගී වූවාය.

7. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීනියන් වන රුවිනි විදානපතිරන මහත්මිය සහ ආර්.එන්.කේ. රඹුක්වැල්ල මහත්මිය 2019 සැප්තැම්බර් 17 වන දින ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ පැවති "ආහාරවල ගුණාත්මකභාවය, සමාජය හා රෙගුලාසි" පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

8. පර්යේෂණ නිලධාරිනි ඒ.කේ.ඒ. දිසානායක මෙනෙවිය 2019 නොවැම්බර් 7 සිට 8 දක්වා ගාලු මුවදොර හෝටලයේ පැවති "කෘෂිකර්මාන්තය, ආහාර සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව" පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගී වූවාය.

9. අතිරේක අධ්‍යක්ෂ (ආවරණ) ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. වික්‍රමසිංහ මහතා සහ සහකාර ලේඛකාධිකාරී (වැඩසටහන්) චන්ද්‍රිකා දහනයක මහත්මිය 2019 සැප්තැම්බර් 24 වන දින ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පැවති "රාජ්‍ය සේවකයාගේ කාර්යභාරය වෙනස් කිරීම" පිළිබඳ දේශනයට සහභාගී වූහ.

10. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීනියන් වන සාගරිකා හිටිහාමු මහත්මිය, සුසිලා ලූර්දු මහත්මිය, දිලූපා බමුණුආරච්චි මහත්මිය සහ පර්යේෂණ නිලධාරිනියන් වන මාලතී රම්බොඩගෙදර, නොරිකා අයෝමි සහ ආර්.ඩී.විජේසිංහ යන මහත්මීන් "පොලොන්නරුව ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ ජාතික වෘත්තීය පුහුණු ආයතනයක් පිහිටුවීම" පිළිබඳ වැඩමුළුවට සහභාගී වූහ. 2019 සැප්තැම්බර් 26 සිට 27 දක්වා ජානකී හෝටලයේ දී මෙය පැවැත්වුණි.

11. පර්යේෂණ නිලධාරිනි ඒ.කේ.ඒ. දිසානායක මහත්මිය 2019 ඔක්තෝම්බර් 03 වන දින කොළඹ හිල්ටන් හෝටලයෙහි පැවති "විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය පිළිබඳ සමාජ හා සංස්කෘතික සම්බන්ධතාවය" පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගී වූවාය.

12. පර්යේෂණ නිලධාරීන් වන අයි.කේ. එදිරිසිංහ දිනූෂා රත්නායක මහත්මිය හා ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි එස්.ඒ.සී.යූ සේනානායක මහතා 2019 දෙසැම්බර් 10 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පැවති "පර්යේෂණ පත්‍රිකා ලිවීම" පිළිබඳ වැඩසටහනට සහභාගී වූහ.

13. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ටී.පී මුණවීරගේ මහත්මිය යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා 2019 දෙසැම්බර් 13 සිට 15 දක්වා මෙම ආයතනයේ දී පැවති 'කෘෂි ව්‍යාපාර සංකල්ප හා අලෙවිකරණ ව්‍යාප්තිය' පිළිබඳ වැඩමුළුවේ සම්පත්දායකයෙකු ලෙස කටයුතු කළාය.

14. 2019 දෙසැම්බර් 16 වන දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිදී පැවති කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්ය ඉන්ද්‍රනාත තේනුවර මහතා විසින් පවත්වන ලද 'ක්ෂේත්‍ර ඡායාරූපකරණය' පිළිබඳ පුහුණු වැඩසටහනට පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ සංඛ්‍යාන කාර්ය මණ්ඩලය සහභාගී වූහ.

15. 2019 දෙසැම්බර් 19 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති කවුන්සිලය (CARP) විසින් සංවිධානය කළ "පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම" පිළිබඳ පුහුණු වැඩමුළුවට අතිරේක අධ්‍යක්ෂ (ආවරණ) ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන ආචාර්ය ඊ.ඒ.සී. ප්‍රියංකර සහ ජී.ජී.ඩී එල්.ඩබ්ලිව්. සමරසිංහ මිය, සහකාර ලේඛකාධිකාරී (වැඩසටහන්) එල්.ඒ.කේ.සී. දහනායක මිය, ගණකාධිකාරිනි ජී. ඩබ්ලිව්. තුෂාරි සහ පරිපාලන නිලධාරිනි ආර්.ඒ.ඩී.එන්. රූපසිංහ මිය ඇතුළු පිරිස සහභාගී වූහ.

16. 2019 ජූලි 09 වන දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සංවිධානය කරන ලද 'මාර්ගගත දත්ත ඇතුළත් කිරීම' පිළිබඳ පුහුණු වැඩසටහනට ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන, ඩී.එම්.ඒ.සී. දිසානායක, ආර්.එම්.ඩී.එච්. රත්නායක සහ එම්.බී.එෆ්. රිෆානා යන පර්යේෂණ නිලධාරීන් සහභාගී වූහ.

17. පර්යේෂණ නිලධාරිනි ආර්.එම්.ඩී.එච්.රත්නායක මහත්මිය 2019 ඔක්තෝම්බර් 24 වන දින එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර නයිට්‍රජන් කළමනාකරණ පද්ධතිය විසින් සංවිධානය කරන ලද 'තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ගෝලීය ව්‍යාපාරය' යන වැඩසටහනට සහභාගී වූවාය.

18. 2019 දෙසැම්බර් 17 සහ 18 යන දෙදින තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පැවති 'සංස්කරණයේ මූලික ක්‍රම' පිළිබඳ දෙදින වැඩමුළුවකට ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි එස්.ඒ.සී.යූ සේනානායක මහතා සහ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනි වසන්ති රාජපක්ෂ මහත්මිය සහභාගී වූහ.

**දේශීය පුහුණුවීම් - මාණ්ඩලික නොවන**

1. 2019 පෙබරවාරි 28 සිට 2019 මාර්තු 01 දක්වා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පැවති "ප්‍රවාහන කළමනාකරණය" පිළිබඳ වැඩසටහනට ප්‍රවාහන සහකාර ඒ.ඩී.ජයාන් මහතා සහභාගී විය.

2. 2019 මාර්තු 11 සිට මාර්තු 12 දක්වා නිපුණතා සංවර්ධන අරමුදලෙහි පැවති "රාජ්‍ය නිලධාරීන් සඳහා නිවාඩු" පිළිබඳ වැඩමුළුවට කළමනාකරණ සහකාර කවීෂා සත්සරණි මහත්මිය සහභාගී වූවාය.

3. 2019 මාර්තු 14 වන දින PRAG හි පැවති "නිල බැංකු ගිණුම් සහ චෙක්පත්" පිළිබඳ එක්දින වැඩසටහනට පොත් තබන්නා මංගලනි ජයලත් මහත්මිය සහභාගී වූවාය.

4. 2019 ජුනි 29 වන දින නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අයත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පැවති "රියදුරන් සඳහා ආරක්ෂිත රිය පැදවීම" වැඩමුළුව සඳහා රියදුරු සමන් පෙතලියගොඩ මහතා සහභාගී විය.

5. 2019 ඔක්තෝබර් 24 වන දින PRAG හි පැවති "අවසාන ගිණුම් සකස් කිරීම" පිළිබඳ එක්දින වැඩසටහනට පොත් තබන්නා මංගලනි ජයලත් මහත්මිය සහභාගී වූවාය.

6. 2019 දෙසැම්බර් 10 වන දින PRAG හි පැවති "පිරිවැය සහ ගෙවීම් ක්‍රියා පටිපාටි සහ මූල්‍ය රෙගුලාසි වැඩිදියුණු කිරීම" පිළිබඳ වැඩසටහනට කළමනාකරණ සහකාර පුබුදු නිරෝෂන් මහතා සහභාගී විය.

7. 2019 දෙසැම්බර් 24 වන දින PRAG හි පැවති "කාර්යාල පද්ධති සහ කාර්යක්ෂමතාව" පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනකට කළමනාකරණ සහකාර සාලිය ධර්මදාස මහතා සහ නිරෝෂා දිසානායක මහත්මිය සහභාගී වූහ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය රුපියල්

| වත්කම් | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 | 15,616,183.49 | 15,595,046.24 |
| ලැබිය යුතු - ණයගැතියෝ | 3 | 32,520,745.31 | 31,356,972.15 |
| ලැබිය යුතු - තැන්පත් | 4 | 613,070.00 | 613,070.00 |
| අවසන් තොග | 5 | 5,229,254.96 | 6,698,505.97 |
| පූර්ව ගෙවීම් | 6 | 35,067.01 | 24,559.73 |
| අනෙකුත් ජංගම වත්කම් | 7 | 23,500.00 | 224,312.40 |
| | | **54,037,820.77** | **54,512,466.49** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 8 | 3,900,922.99 | 3,691,021.00 |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 9 | 22,573,958.85 | 23,651,616.46 |
| ඉඩම් හා ගොඩනැගිලිඉඩම් හා ගොඩනැගිලිඉඩම් හා ගොඩනැගිලි | 10 | 37,697,130.51 | 39,294,336.79 |
| නොනිමි වැඩ | 11 | 1,539,951.30 | 386,568.36 |
| | | **65,711,963.65** | **67,023,542.61** |
| **මුළු වත්කම්** | | **119,749,784.42** | **121,536,009.10** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවියයුතු | 12 | **19,063,151.63** | **17,334,089.64** |
| | | **19,063,151.63** | **17,334,089.64** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 13 | 57,562,752.50 | 52,241,966.50 |
| | | **57,562,752.50** | **52,241,966.50** |
| **මුළු වගකීම්** | | **76,625,904.13** | **69,576,056.14** |
| **ශුද්ධ වත්කම්** | | **43,123,880.29** | **51,959,952.96** |
| **ශුද්ධ වත්කම් හා හිමිකම්** | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 14 | 44,971,154.73 | 51,821,985.57 |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දායකත්වය | | | - |
| සංචිත | 15 | 3,376,906.90 | 3,342,461.37 |
| ප්‍රත්‍යාගණිත සංචිත | | 26,450.20 | 26,450.20 |
| දිරි දීමනා හා පුහුණු අරමුදල | 16 | 8,611.38 | - |
| සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | 17 | (5,259,242.92) | (3,230,944.18) |
| | | | |
| **මුළු වත්කම්/හිමිකම්** | | **43,123,880.29** | **51,959,952.96** |

පිටු අංක 5 සිට 8 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 9 සිට 14 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අදාල කොටස්ය. රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව සහතික කරමි.

........................ ..................................

**තුෂාරි වෙදගේ** **මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා**

**ගණකාධිකාරිණී** **අධ්‍යක්ෂ**

දිනය ............................

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

............................................... ...............................

**නීල් බණ්ඩාර හපුඉන්න** පාලක මණ්ඩල සාමාජික

**සභාපති**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය වාර්තාව රුපියල්

| **ආදායම** | සටහන් | **2019** | **2018** |
|---|---|---|---|
| මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | | 175,000,000.00 | 157,730,000.00 |
| පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා බාහිර ආයතන වලින් ලද අරමුදල් | | 9,014,545.91 | 8,370,512.07 |
| පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන | | 15,694,578.53 | 17,134,027.29 |
| අනෙකුත් ආදායම් | 18 | 32,082,932.97 | 31,708,971.91 |
| බොල් ණය අධි වෙන්කිරීම් | | 332,395.78 | 291,988.43 |
| **මුළු ආදායම** | | **232,124,453.19** | **215,235,499.70** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන හා සේවක දීමනා | 19 | (168,108,417.15) | (154,888,834.37) |
| පර්යේෂණ හා පුහුණු කටයුතු | | (15,694,578.53) | (17,134,027.29) |
| පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා බාහිර ආයතන වලින් ලද අරමුදල් වලට අදාල වියදම | | (9,014,545.91) | (8,370,512.07) |
| ක්ෂය | 9, 10 | - | (971,637.00) |
| වෙනත් වියදම් | 20 | (41,274,563.20) | (36,084,825.77) |
| බැංකු ගාස්තු | | (97,700.00) | (86,795.00) |
| **මුළු වියදම** | | **(234,189,804.79)** | **(217,536,631.50)** |
| **අදාළ කාලය සඳහා අතිරික්තය/හිඟය** | | **(2,065,351.60)** | **(2,301,131.80)** |

........................ ........................

**ගණකාධිකාරිණී** **අධ්‍යක්ෂ**

## 2019දෙසැම්බර් 31 න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| 2018 | | සටහන් | 2019 (රුපියල්) | |
|---|---|---|---|---|
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| (2,301,131.80) | වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/හිග | | | (2,065,351.60) |
| | **ගැලපීම්** | | | |
| 20,162,404.00 | වත්කම් ක්ෂයවීම් | | 8,741,252.31 | |
| (19,190,767.00) | ක්‍රමක්ෂය | | (8,741,252.31) | |
| 10,533,630.50 | පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 10,802,680.00 | |
| (1,237,847.79) | ආයෝජන ආදායම් | | (1,190,841.12) | |
| (688,635.19) | පෙර වර්ෂයේ ගැලපීම් | | 37,052.86 | |
| (47,865.00) | අබලි ද්‍රව්‍ය අපහරණයෙන් ලද ලාභය | | 308,502.09 | |
| | බොල් ණය වෙන් කිරීම් | | (332,395.78) | 9,624,998.05 |
| **7,229,787.72** | **කාරක ප්‍රාග්ධන ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය** | | | **7,559,646.45** |
| | | | | |
| | **කාරක ප්‍රාග්ධන ගැලපීම** | | | |
| (5,026,074.21) | ණය ගැතියෝ | | (1,163,773.16) | |
| (671,235.81) | අවසන් තොගය | | 1,469,251.01 | |
| (105.86) | පෙර ගෙවීම් | | (10,507.28) | |
| (25,486.90) | අනෙකුත් ජංගම වත්කම් | | 200,812.40 | |
| 7,090,737.95 | ගෙවිය යුතු දෑ | | 1,729,061.99 | 2,224,844.96 |
| **8,597,622.89** | **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් භාවිතය** | | | **9,784,491.41** |
| | | | | |
| **(3,954,919.50)** | **පාරිතෝෂික ගෙවීම්** | | | (5,481,894.00) |
| | | | | |
| **4,642,703.39** | **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | | | **4,302,597.41** |
| | | | | |
| | **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| 4,029,389.58 | අනෙකුත් මූල්‍ය වත්කම් | | (209,901.99) | |
| (7,424,820.07) | දේපල පිරියත හා උපකරණ | | (6,391,287.37) | |
| (2,050,973.21) | ඉඩම් හා ගොඩනැගිලි | | (1,637,646.71) | |
| | පැල්වෙහෙර සංචාරක නිවාසය | | 1,962,545.66 | |
| 1,237,847.79 | ආයෝජන අදායම | | 1,190,841.12 | |
| (254,068.36) | නොනිම් වැඩ | | (1,153,382.94) | |
| **(4,462,624.27)** | **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | **(6,238,832.23)** |
| | | | | |
| | **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| 25,200,000.00 | රජයේ ප්‍රධාන - ප්‍රාග්ධන ලැබීම් | | 17,585,000.00 | |
| (17,134,027.29) | පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා ප්‍රාග්ධන ලැබීම් | | (15,694,578.53) | |
| (915,614.55) | දිරි දීමනා අරමුදල ආයතනික කොටස- 40% | | 34,445.53 | |
| 47,865.00 | අබලි ද්‍රව්‍ය අපහරණය | | (308,502.09) | |
| (151,098.25) | දිරි දීමනා අරමුදල - 10% | | 8,611.38 | |
| | බොල් ණය වෙන් කිරීම් | | 332,395.78 | |
| **7,047,124.91** | **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | **1,957,372.07** |
| | | | | |
| 7,227,204.03 | **මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම** | | | 21,137.25 |
| 8,367,842.21 | **කාලච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | **I** | | 15,595,046.24 |
| **15,595,046.24** | **කාලච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **II** | | **15,616,183.49** |
| | | | | |
| | **සටහන්:** | | | |
| | **මුදල් හා මුදල් සමාන අයිතමයන්** | | **1** | **11** |
| | | | **01.01.2019** | **31.12.2019** |
| 15,487,296.20 | බැංකු ශේෂය | | 15,487,296.20 | 15,595,513.49 |
| 107,750.04 | අතැති මුදල් | | 107,750.04 | 20,670.00 |
| **15,595,046.24** | එකතුව | | **15,595,046.24** | **15,616,183.49** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම්/වගකීම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

රුපියල්

| | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | දිරි දීමනා හා පුහුණු අරමුදල | සමුච්චිත අතිරික්තය (හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 51,821,985.57 | 3,342,461.37 | 26,450.20 | - | (3,230,944.18) | 51,959,952.96 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් - ප්‍රාග්ධන | 17,585,000.00 | | | | | 17,585,000.00 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (8,741,252.31) | | | | | (8,741,252.31) |
| ආයතන දායකත්වය 40% සහ 10% | | 34,445.53 | | 8,611.38 | | 43,056.91 |
| පෙර වර්ෂයට ගැලපීම | | | | | 37,052.86 | 37,052.86 |
| පර්යේෂණ හා පුහුණු කිරීමේ කටයුතු සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන | (15,694,578.53) | | | | | (15,694,578.53) |
| ආදායම් හා වියදම් | | | | | (2,065,351.60) | (2,065,351.60) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | **44,971,154.73** | **3,376,906.90** | **26,450.20** | **8,611.38** | **(5,259,242.92)** | **43,123,880.29** |

**මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්**
**2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**

**1. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1 පොදු**

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුතු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානයන්ට අදාළව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නැත. උපචිත පදනම මත ගණකාධිකරණ මූලධර්ම නිරන්තරයෙන් භාවිතා කර තිබේ.

**1.2** සන්සන්දනාත්මක තොරතුරු

පසුගිය වසරේ උපයෝගී කරගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුරූපීව මෙම වසරේද එම ප්‍රතිපත්තීන් යොදාගෙන ඇත. අවශ්‍ය සෑම අවස්ථාවකදීම පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පසුගිය වර්ෂයේ අගයන් නැවත සකසා ඉදිරිපත් කර ඇත.

**1.3** ශේෂ පත්‍ර දිනයට පසුව හටගන්නා සිද්ධි

ශේෂපත්‍ර දිනෙන් පසු හට ගන්නා ප්‍රමාණවත් සිද්ධීන් සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාවල අදාල හෙළිදරව්‌ හා ගැලපීම් සිදු කර ඇත.

**1.4 වත්කම් තක්සේරු**

**(i) දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට වැයවූ වියදම එහි පිරිවැය ලෙස සැලකේ. ආයතනයේ පැවැත්මට හෝ ආයතනයේ ධාරිතාවය වැඩි කිරීමට යම් වත්කමක් මිලදී ගැනීමක් හෝ පවතින වත්කමක් වැඩි දියුණු කිරීමට යම් වියදමක් දරන්නේ නම් එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකේ. අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය පුනරාවර්තන වියදමක් ලෙස සැලකේ. දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පිරිවැයෙන් හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කර ඉදිරිපත් කරනු ලබන අතර එය පහත පරිදි වේ.

a) පහත සඳහන් වාර්ෂික ක්ෂය අනුපාත යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර තිබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වාර්ෂික 2 ½% |
| උපකරණ/ගෘහ භාණ්ඩ | වාර්ෂික 10% |
| පරිගණක | වාර්ෂික 20% |
| සුභ සාධක උපකරණ | වාර්ෂික 10% |
| පොත් | වාර්ෂික 10% |
| වාහන | වාර්ෂික 20% |

මිල දී ගත් වර්ෂයේ දී සමස්ත වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

b) ක්‍රමක්ෂය වටිනාකම හඳුනාගැනීම හා ගිණුම් තැබීම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක (LKAS - 20) විකල්ප ක්‍රමය අනුව සිදුකර ඇත.

c) පැල්වෙහෙර සංචාරක බංගලා ගොඩනැගිල්ල

පාලක මණ්ඩල අනුමැතිය මත දඹුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත පැල්වෙහෙර සංචාරක බංගලාවේ අයිතිය පවරන ලදී.

**1.5** ණය ගැතියෝ

**i)** විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ

වර්තමානයේ විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 07 දෙනෙකුගේ ශේෂයන් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරණ ප්‍රමිත අංක - 08 අනුව පවතින්නා වූ අවදානම හා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගනිමින් අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රතිශතය මෙම වර්ෂයේදී තීරණය කර ඇත.

**ii)** අනෙකුත් ණයගැතියෝ

උපලබ්ධි වේ යැයි අපේක්ෂිත අගය ණයගැති වටිනාකම ලෙස සඳහන් කර ඇත. බොල් සහ අඩමාණ ණය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත. එහ පහත පරිදි වේ.

1. අවුරුදු 5 වැඩි ණයගැති ශේෂය මත 100%
2. අවුරුදු 1 වැඩි අවුරුදු 05 අඩු ණයගැති ශේෂය මත 5%

iii) ගිණුම්ගත නොකල නේවාසිකාගාර ආදායම.

වාර්තාගත නොකල නේවාසිකාගාර ආදායම රු.8,895,470/- වන අතර මෙම වටිනාකම 2015 මැයි මස සිට 2018 ජූලි මස දක්වා නේවාසිකාගාර ක්‍රියාකාරකම් වලින් ජනනය වී ඇත. මෙම වටිනාකම හඳුනාගැනීම අධ්‍යක්ෂවරයා විසින් පත්කළ කමිටුවක් මගින් සිදුකර ඇත.

**1.6** තොගය

පාරිභෝජන තොගය පිරිවැය මත අගය කොට ඇත. අනෙකුත් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත අගය කර ඇත. තොගයෙහි පිරිවැය ගණනයේදී පළමු ලැබීම් පළමු නිකුතු FIFO ක්‍රමය යොදා ගනී.

**1.7** ආයෝජන

ස්ථාවර තැන්පතු එම බැංකුවලම නැවත ආයෝජනය කර ඇත.

**1.8** වගකීම් හා වෙන්කිරීම්

**1.8.1** පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂක පනතට අනුව , පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත.

2019 වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන සකස් කර ඇත.

**1.8.2** අසම්භාව්‍ය බැරකම්

තීන්දු ලැබීමට නියමිත නඩු සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන් කර ඇත. මෙම කාර්යය අවසන් වනවිට මොණරාගල දිස්ත්‍රික් උසාවියේ විභාගවෙමින් පවතිනු ලබන්නේ ජේ. චන්ද්‍රවංශ මහතාට එරෙහි නඩුව පමණි.

**1.8.3** අසම්භාව්‍ය වත්කම්

ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් අයකර ගැනීමට සඳහා තීන්දු ලැබීමට නියමිත නඩු මත අසම්භාව්‍ය වත්කම් අගය සැකසී ඇත. එම තොරතුරු පහත පරිදි වේ.

පී.ඩී.ජේ. ආනන්ද මහතා

පදිංචි ලිපිනය සොයාගැනීමට නොහැකි වීම මත මෙම නඩුව බහාතබා ඇත. රු.1,250,000/- මුදලක් ඇපකරුවන්ගෙන් මේ වන විට අයකර ගෙන ඇත. රු.2,759,754.28 ක ශේෂය පී.ඩී.ජේ. ආනන්ද මහතාගෙන් අයකර ගතයුතුව ඇත.

එම්.එස්. ගෞරි ශංකර් මහතා

එන්තරවාසි යැවීම සඳහා ඔහුගේ ලිපිනය සොයාගත නොහැකි වී ඇත. කෙසේ නමුත් ඇපකරුවන්ගෙන් මේ වනවිට රු.1,250,000/- වටිනාකමක් අයකර ගෙන ඇත. රු.3,634,110.07 ශේෂය එම්.එස්. ගෞරි ශංකර් මහතාගෙන් අයකර ගත යුතුව ඇත.

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා

ඔහු දෙවරක් ලබාදුන් නඩු තීන්දු සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇත. නමුත් ආයතනයට වාසිදායක ලෙස නඩු තීන්දු ලබාදී ඇත. රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා නීතිපති වෙත ලිපියක් යොමුකර ඇත. පිස්කල් ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

එම්.ජේ.එස්.ඩී. අබේරත්න මිය

රු.501.392/-ක ශේෂයක් අයකර ගැනීමට පවතින නමුත් මෙ නඩුකටයුතු ඉදිරියට ගෙනයාමට ඇයගේ ලිපිනය සොයාගත නොහැකිවී ඇත.

ආර්. අතුකෝරල මිය

අතුකෝරල මහත්මියගේ ඇප බැඳුම්කරයේ වටිනාකම රු.2,181,521/- විය. ඇපකරුවන් විසින් රු.1,250,000/- මේ වනවිට ගෙවා ඇත. ඇයගෙන් අයකරගැනීමට පවතින ශේෂය රු.931,521/- වේ. ඇයට එන්තරවාසි යැවීම සඳහා ලිපිනය සොයා ගැනීමට නොහැකි වී ඇත.

පී.ඩී.ආර්. කුමාරසිරි මයා

පී.ඩී.ආර්. කුමාරසිරි මහතාගේ ඇප බැඳුම්කරයේ වටිනාකම රු.499,302/- වේ. එක් ඇපකරුවෙකුගෙන් රු.166,436/- අයකර ගෙන ඇත. ශේෂ මුදල වන රු.332,866.98 අනෙක් ඇපකරුවන් දෙදෙනාගෙන් අයකර ගන්නා ලෙස උසාවිය තින්දුව ලබාදී ඇත. කෙසේ නමුත් එක් ඇපකරුවෙකුගේ ලිපිනය සොයාගැනීමට නොහැකි වී ඇත.

ඒ.සී.කේ. සේපාල මිය

සේපාල මහත්මියගේ ඇප බැඳුම්කරය රු.1,249,641.11 වේ. නමුත් උසාවියේ තීන්දුව අනුව රු.1,200,000/- ඇයගෙන් අයවිය යුතුය. ඇය මේ වනවිට රු.9000,000/- ගෙවා ඇත.

### 1.8.4 අනිවාර්ය දායකත්ව සැලසුම

සේවකයින්ගේ මාසික වැටුපෙන් පිළිවෙළින් 15% සහ 3% බැගින් සේවක අර්ථසාධක අරමුදලට (**EPF**) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (**ETF**) ආයතනය විසින් දායකත්වය දරනු ලබයි. මෙම දායකත්වයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 1.9 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධනය පහත ගැළපීම් සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

a. බොල් හා අඩමාණ ණය සහ වෙන් කිරීම් සිදු කිරීම සහ ආයතනයේ එදිනෙදා මෙහෙයුම් වෙනුවෙන් වන අනාගත අසම්භාව්‍යන් වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර තිබේ.ආයතනයේ දේපොළ , පිරියත සහ උපකරණ එලදායී ලෙස නඩත්තු කෙරෙයි.

b. ආදායම් යන්නට ඇතුළත් වන්නේ රජයේ භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්, නේවාසිකාගාර ආදායම්, ශ්‍රවණාගාර ආදායම් සහ අනෙකුත් ආදායම්ය.

### 2.0 ප්‍රවාහන හා මුද්‍රණ වියදම්

පර්යේෂණ හා පුහුණු අංශ ද ඇතුළුව සියලුම අංශ සඳහා ප්‍රවාහන හා මුද්‍රණ වියදම් ගිණුම්ගත කිරීමට සිදුවේ. එබැවින් එම වියදම් අනුමත අනුපාතයකට ගණනය කොට එම වියදම එකී අදාළ වියදම් අතර ප්‍රතිශතයකට ගළපා ඇත.

### 2.1 පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම.

පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ ලබාදී ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 38 (LKAS - 38) අනුව පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය හැක. නමුත් අප ආයතනයේ පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය නොහැක. මන්දයත් අප ආයතනයේ පර්යේෂණවල අවසාන නිමැවුම ගිණුම්කරණ ප්‍රමිතියෙ සඳහන්කර ඇති අවශ්‍යතා සම්පූර්ණ නොකරන බැවිනි. එමනිසා මෙම පර්යේෂණ හා පුහුණු මුළු පිරිවැය මූල්‍ය තත්ත්ව වාර්තාව හරකරමින් එම වියදම පුනරාවර්තන වියදමක් ලෙස සලකනු ලබයි. මෙම ක්‍රියාකාරකම් සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමද මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි ආදයමක් ලෙස සටහන් කර මෙම වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර ඇත.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රුපියල්

**2 මුදල් හා මුදල් සමාන අයිතමයන්**

| | 2019 | 2018 |
|---|---|---|
| අතැති මුදල් | 20,670.00 | 107,750.04 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323292 | 8,463,976.86 | 6,704,465.78 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323293 | 2,446,820.21 | 2,004,324.49 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323315 | 203,895.78 | 107,518.91 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323317 | 4,480,820.64 | 6,670,987.02 |
| | **15,616,183.49** | **15,595,046.24** |

**3 ලැබිය යුතු මුදල්**

**කාර්ය මණ්ඩල ණයගැතියෝ**

| | | |
|---|---|---|
| නිවාස ණය | 401,321.55 | 521,526.93 |
| ඒකාබද්ධ ණය | 22,894,203.34 | 22,877,445.15 |
| උත්සව අත්තිකාරම් | 6,675.12 | 12,042.71 |
| ලැබිය යුතු ශ්‍රවණාගාර ආදායම් | 509,875.00 | 787,625.00 |
| ලැබිය යුතු නේවාසිකාගාර ආදායම් | 907,145.07 | 591,617.75 |
| ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ | 13,486,273.49 | 15,387,897.86 |
| වැටුප් අත්තිකාරම් | - | 282,860.09 |
| | **38,205,493.57** | **40,461,015.49** |
| **වෙනත් ණයගැතියෝ** | | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | 50,612.38 | 53,743.26 |
| බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මහත්මියගෙන් අයවිය යුතු | 48,000.00 | 160,000.00 |
| ඉවත් වූ සේවකයන්ගෙන් අය කර ගත යුතු | 564,378.12 | 574,515.55 |
| වෛද්‍ය රක්ෂණයෙන් අය කර ගත යුතු | 100.00 | - |
| ණයගැති- මොබිටෙල් (පුද්) ආයතනය | 250,002.51 | 129,801.74 |
| G-97- දේශගුණික සුහුරු බෝග සහ යාන්ත්‍රීකරණ පරිමාණ | 325,924.33 | - |
| ඩිජි හවුස් වෙතින් අයවිය යුතු | 230.00 | - |
| මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්) සමාගම වෙතින් අයකර ගත යුතු | 70.00 | - |
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 117,800.00 | 117,800.00 |
| R-481 යාපනය කලපුවෙන් සපයන පරිසර පද්ධතිය සේවාවන්හි වටිනාකම සහ අවට ගම්වාසීන්ගේ | 111,921.59 | 111,921.59 |
| රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු | 47,028.07 | 53,617.28 |
| දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1,962,545.66 | - |
| R-540 එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීම' ප්‍රවේශය (Save and Grow Approach) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම ගොඩනැංවීම | 809,686.06 | - |
| | **4,288,298.72** | **1,201,399.42** |
| | | |
| | **42,493,792.29** | **41,662,414.91** |
| **අඩු කලා :** | | |
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම | (519,542.01) | (305,134.51) |
| ශිෂ්‍යත්වලාභීන් සඳහා වෙන් කිරීම | (9,453,504.97) | (10,000,308.25) |
| | **32,520,745.31** | **31,356,972.15** |

**4 ලැබිය යුතු**

**තැන්පතු**

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - භෝජනාගාර භාරකරු | 70,000.00 | 70,000.00 |
| විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්) | 3,125.00 | 3,125.00 |
| විවිධ - තැපැල්පති | 24,945.00 | 24,945.00 |
| විවිධ - කොළඹ ගෑස් සහ ජල සමාගම | 4,750.00 | 4,750.00 |
| විවිධ - ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 500.00 | 500.00 |
| විවිධ - සී/ස සෙල්ටෙල් ලංකා සමාගම | 3,500.00 | 3,500.00 |
| විවිධ - ලංකා විදුලිබල මණ්ඩලය | 406,250.00 | 406,250.00 |
| විවිධ - ඉන්ධන තැන්පතු | 100,000.00 | 100,000.00 |
| | **613,070.00** | **613,070.00** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රුපියල්

**5 තොගය**

| | 2019 | 2018 |
|---|---|---|
| ප්‍රකාශන සහ සහරා | 2,758,249.00 | 2,746,259.00 |
| පරිභෝජන භාණ්ඩ | 1,538,084.96 | 3,000,271.97 |
| පොත් අලෙවි සැල | 932,921.00 | 951,975.00 |
| | **5,229,254.96** | **6,698,505.97** |

**6 පූර්ව ගෙවීම්**

| | | |
|---|---|---|
| සේවා ගිවිසුම- ෆොටෝකොපි | 10,500.00 | - |
| ගොඩනැගිලි රක්ෂණය | 24,567.01 | 24,559.73 |
| | **35,067.01** | **24,559.73** |

**7 අනෙකුත් ජංගම වත්කම්**

| | | |
|---|---|---|
| මිලදී ගැනීම් අත්තිකාරම් | 23,500.00 | 224,312.40 |
| | **23,500.00** | **224,312.40** |

**8 අනෙකුත් මූල්‍ය වත්කම්**

| | | |
|---|---|---|
| ඇමතුම් තැන්පතු | 1,500.00 | 1,500.00 |
| ස්ථාවර තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 1,500,000.00 | 1,500,000.00 |
| ස්ථාවර තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ණය යෝජනා ක්‍රමය | 2,399,422.99 | 2,189,521.00 |
| | **3,900,922.99** | **3,691,021.00** |

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රුපියල්

| | ණයහිමියෝ | 2019 | 2018 |
|---|---|---|---|
| **12** | උපචිත වියදම් | 8,621,848.58 | 9,380,068.54 |
| | ගෙවිය යුතු පර්යේෂණ හා පුහුණු වියදම් | 1,216,781.39 | 2,999,702.29 |
| | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 133,462.20 | 133,462.20 |
| | ආපසු ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු - උපතිස්ස පරණමාන | 50,000.00 | 50,000.00 |
| | වැටුප් අත්තිකාරම් | - | - |
| | නොගෙවූ වියදම් | 267,135.56 | 97,215.00 |
| | ඉවත් වූ සේවකයන් සඳහා ගෙවිය යුතු මුදල් | 189,150.61 | 220,725.04 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 16,225.00 | 17,600.00 |
| | රඳවාගත් මුදල | 136,526.06 | 22,769.79 |
| | ණය හිමියෝ | 1,720,160.05 | 1,078,781.48 |
| | සුභසාධක සංගමය | - | 3,197.00 |
| | ගෙවිය යුතු පාරිතෝෂික මුදල් | 126,912.50 | 126,912.50 |
| | අමාත්‍යාංශයට ගෙවිය යුතු | 94,358.05 | 94,358.05 |
| | Management Development Book | 10,000.00 | - |
| | විශේෂ අත්තිකාරම් | - | 400.00 |
| | තේ පර්යේෂණායතනයට ගෙවිය යුතු | 84,000.00 | - |
| | නාරායනසාමි මහතාට ගෙවිය යුතු | 9,000.00 | - |
| | කලින් ලද නේවාසිකාගාර ආදායම් | 43,528.00 | |
| | **<u>ව්‍යාපෘති ණය හිමියෝ</u>** | | |
| | කඩිනම් ආහාර සුරක්ෂිතතාවය සහ අවශ්‍යතා ඇගයුම | 7,774.28 | 7,774.28 |
| | R-512ගෝලීය විචලතා හා තිරසාරබව පිළිබඳ කෘෂිකාර්මික පර්යේෂණ තාක්ෂණික නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | 22,831.18 | 22,831.18 |
| | R-530 ශ්‍රී ලංකාවේ තෝරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි බෝග සඳහා අගය දාමය ශක්තිමත් කිරීම සඳහා වූ පාදක අධ්‍යයනය | 2,716,082.09 | 1,973,590.33 |
| | R-535 මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත්වන ආන්තික ගොවිප්‍රජාව මුහුණ දෙන දේශගුණික විපර්යාසමය බලපෑම්වලට විසඳුම් සෙවීම | 440,981.34 | 440,981.34 |
| | R-540 එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීම' ප්‍රවේශය (Save and Grow Approach) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම ගොඩනැංවීම | - | 417,818.74 |
| | සේවා ගිවිසුම 03-2017 | 245,901.88 | 245,901.88 |
| | R-559 ශ්‍රී ලංකාවේ විවිධ බෝග සඳහා බිංදු ජල සම්පාදනය භාවිතා කිරීමේ බලශක්ති/ජල පාදක තක්සේරුව | 695,062.86 | - |
| | R-561 2. අනුරාධපුර දිස්ත්‍රිකක්කයේ වී නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවල බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම | 1,799,880.00 | - |
| | සේවා ගිවිසුම 01-2019 | 415,550.00 | - |
| | | **19,063,151.63** | **17,334,089.64** |

**සේවක ප්‍රතිලාභ**

| | | | |
|---|---|---|---|
| **13** | ජනවාරි 01 දිනට ශේෂය | 52,241,966.50 | 45,663,255.50 |
| | වර්ෂය තුල ගෙවීම් | 5,481,894.00 | 3,954,919.50 |
| | වර්ෂය සඳහා වෙන් කිරීම් | 10,802,680.00 | 10,533,630.50 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **57,562,752.50** | **52,241,966.50** |

**රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන**

| | | | |
|---|---|---|---|
| 14 | ජනවාරි 01 දිනට ශේෂය | 51,821,985.57 | 58,021,062.86 |
| | වර්ෂය තුළ ප්‍රාග්ධන දායකත්වය | 17,585,000.00 | 25,200,000.00 |
| | පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | (15,694,578.53) | (17,134,027.29) |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (8,741,252.31) | (11,360,926.00) |
| | ප්‍රත්‍යාගණිත සංචිත මත ගැලපුම් වාහන මිලදී ගැනීම | - | (2,904,124.00) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **44,971,154.73** | **51,821,985.57** |

**සංචිත**

| | | | |
|---|---|---|---|
| 15 | ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | - | - |
| | ප්‍රාග්ධන සංචිත | 1,675,000.00 | 1,675,000.00 |
| | දීමනා අරමුදල - ආයතනික කොටස | 1,701,906.90 | 1,667,461.37 |
| | | **3,376,906.90** | **3,342,461.37** |

**දීමනා හා පුහුණු අරමුදල**

| | | | |
|---|---|---|---|
| 16 | දීමනා අරමුදල ව්‍යාපෘති - 10% | 8,611.38 | - |
| | | **8,611.38** | **-** |

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

**2019දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

රුපියල්

| | **සමුච්චිත ඌනතා ගිණුම** | **2019** | **2018** |
|---|---|---|---|
| 17 | ජනවාරි 01 දිනට ශේෂය | (3,230,944.18) | 9,927,540.39 |
| | ආයතනික අරමුදලින් මිලිදී ගත් වාහන සඳහා ප්‍රත්‍යාගණිත සංචිත ගැලපීම | - | (2,586,363.20) |
| | භාණ්ඩාගාර අරමුදලින් 2014 මිලදී ගත් වාහන සඳහා ප්‍රත්‍යාගණිත සංචිත ගැලපීම | - | (7,100,000.00) |
| | පුහුණු අරමුදලේ ශේෂය මාරුකිරීම | - | 0.01 |
| | පෙර වර්ෂ ගැලපීම් | 37,052.86 | 688,635.18 |
| | දෙසැම්බර් 31 දිනට ආදායම ඉක්ම වූ වියදම | (2,065,351.60) | 2,301,131.80 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **(5,259,242.92)** | **3,230,944.18** |

| | **අනෙකුත් අදායම්** | | |
|---|---|---|---|
| **18** | නේවාසිකාගාර ගාස්තු | 13,303,731.02 | 14,266,583.83 |
| | සම්මන්ත්‍රණශාලා ගාස්තු | 15,997,250.00 | 13,791,868.75 |
| | ආදායම් - මොබිටෙල් පාරිභෝගික සේවාවෙන් | 120,200.77 | 110,821.63 |
| | ප්‍රකාශන විකිණීමෙන් ලද ආදායම් | 80,309.00 | 146,151.00 |
| | ආයෝජන පොළී | 256,888.99 | 337,963.68 |
| | කාර්ය මණ්ඩල ණය පොළී | 933,952.13 | 899,884.11 |
| | ව්‍යාපෘතිවලින් ලද පුනරාවර්තන දායකත්වය | 846,932.77 | 1,567,814.13 |
| | සංචාරක බංගලා ගාස්තු සහ කාමර කුලී | 91,619.95 | 172,099.64 |
| | පැල්වෙහෙර නවාතැන් ගාස්තු | 28,950.00 | 70,500.00 |
| | පරිගණක ආදායම | - | 2,002.00 |
| | ටෙන්ඩර් ගාස්තු | - | 2,000.00 |
| | මිනිස් බල ආදායම | 64,002.43 | 6,173.34 |
| | අනෙකුත් ආදායම් | 129,975.91 | 83,244.80 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචිය | 177,000.00 | 175,000.00 |
| | වෙළඳ දැන්වීම් ආදායම් | 32,250.00 | 29,000.00 |
| | තොග අතිරික්තය | 19,870.00 | - |
| | අබලි භාණ්ඩ විකිණීම | - | 47,865.00 |
| | | **32,082,932.97** | **31,708,971.91** |

| | **වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ** | | |
|---|---|---|---|
| **19** | වැටුප් - ස්ථිර කාර්ය මණ්ඩලය | 86,888,993.04 | 76,921,443.04 |
| | වැටුප් - අනියම් විමර්ශක | 12,932,062.53 | 8,913,439.37 |
| | ජීවන වියදම් දීමනාව, විශේෂ දීමනාව හා වෙනත් දීමනා | 31,451,303.22 | 36,484,917.91 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 17,485,167.32 | 15,640,443.47 |
| | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 3,497,032.27 | 3,139,553.66 |
| | අතිකාල දීමනා | 5,051,178.77 | 3,255,406.42 |
| | පාරිතෝෂික | 10,802,680.00 | 10,533,630.50 |
| | | **168,108,417.15** | **154,888,834.37** |

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

රුපියල්

| | **අනෙකුත් වියදම්** | **2019** | **2018** |
|---|---|---|---|
| **20** | ගමන් වියදම් හා යැපීම් දීමනා | 1,746,142.18 | 1,163,236.16 |
| | විදේශීය ගමන් වියදම් | 67,772.77 | 382,218.00 |
| | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3,034,873.17 | 1,952,737.17 |
| | ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,212,026.39 | 1,493,393.50 |
| | නිල ඇඳුම් | 415,708.42 | 509,134.31 |
| | වාහන අළුත් වැඩියා | 1,553,772.54 | 1,749,011.14 |
| | ගොඩනැගිලි නඩත්තු කටයුතු | 2,048,644.33 | 1,885,429.98 |
| | යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා | 1,835,323.58 | 1,984,938.14 |
| | දුරකථන ගාස්තු | 3,295,188.47 | 2,640,531.75 |
| | විදුලිය | 5,162,274.02 | 5,264,241.90 |
| | ජල බිල්පත් | 1,156,255.88 | 1,140,656.40 |
| | බදු සහ වරිපණම් | 579,456.00 | 354,913.20 |
| | තැපැල් ගාස්තු | 609,870.00 | 413,870.00 |
| | ප්‍රවාහන | 594,560.00 | 570,110.00 |
| | වාහන සඳහා කාර්මික උපදෙස් | 90,000.00 | 90,000.00 |
| | ඉදිකිරීම් සඳහා කාර්මික උපදෙස් | 90,000.00 | 60,000.00 |
| | පුවත්පත් | 271,796.00 | 197,960.00 |
| | බලපත්‍ර සහ රක්ෂණය | 1,061,870.63 | 1,198,986.99 |
| | ආරක්ෂක ගාස්තු | 3,036,000.00 | 3,050,650.00 |
| | පිරිසිදු කිරීමේ ගාස්තු | 1,240,080.49 | 975,319.47 |
| | රෙදි සේදීම | 435,520.00 | 527,330.00 |
| | විගණන ගාස්තු | 986,000.00 | 900,000.00 |
| | වෛද්‍ය ගාස්තු | 1,015,500.00 | 957,000.00 |
| | ආපනශාලා ගාස්තු | 109,034.00 | 102,762.00 |
| | විවිධ වියදම් - අනෙකුත් | 368,447.00 | 174,768.00 |
| | නීති ගාස්තු | 591,716.00 | 8,970.00 |
| | සුභසාධක | 200,475.00 | 388,325.00 |
| | දැන්වීම් | 1,908,253.01 | 877,565.00 |
| | සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 68,801.00 | 51,027.00 |
| | පාලක මණ්ඩලය | 608,435.00 | 559,068.00 |
| | මුද්‍රණ හා ප්‍රකාශන | 1,915,540.02 | 1,374,437.90 |
| | විනෝදාත්මක | - | 16,232.00 |
| | තොරතුරු බෙදාහැරීම | 669,675.00 | 454,242.50 |
| | අලෙවි වියදම - ප්‍රකාශන | 80,059.00 | 146,366.00 |
| | රඳවාගැනීමේ බදු | 13,881.79 | 21,871.07 |
| | විගණන හා කළමනාකරණ කමිටු | 63,721.00 | 68,150.00 |
| | කාර්ය මණ්ඩල සංවර්ධනය | 2,101,080.92 | 1,829,373.19 |
| | කාර්යක්ෂමතා කඩඉම් විභාග ගාස්තු | 478,500.00 | - |
| | සේවක වන්දි | - | 550,000.00 |
| | පරිවර්තන ගාස්තු | 150,547.50 | - |
| | උපකරණ හා අනෙකුත් දෑ සඳහා තාක්ෂණික උපදෙස් | 89,500.00 | - |
| | මුද්‍රිත පොත් මත අලාභය | 1,560.00 | - |
| | තොග ඌනතා | 8,200.00 | - |
| | අබලි භාණ්ඩ විකිණීම | 308,502.09 | - |
| | | **41,274,563.20** | **36,084,825.77** |

මගේ අංකය / எனது இல. / My No. ඒපීඑල්/ඩී/එච්ජ්ආර්/01/19/16 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 අගෝස්තු 13 දින

සභාපති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

(අ) සංචාරක නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් දීර්ඝකාලීන බදු පදනම මත පවරාගෙන තිබුණු පැල්වෙහෙර සංචාරක නිකේතනය සඳහා 2011 දෙසැම්බර් 12 දින සිට 2019 දෙසැම්බර් 12 දින දක්වා ගෙවිය යුතු රු. 1,000,000 ක බදු කුලිය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

(ආ) ද්‍රව්‍ය අපහරණය කිරීමෙන් ලැබී තිබුණු මුදල රු. 5,900 වුවද ද්‍රව්‍ය අපහරණ විකුණුම් අලාභය වූ රු. 308,502 ක මුදල මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) පැල්වෙහෙර සංචාරක නිකේතනයේ නඩත්තු වියදම් වෙනුවෙන් ආයතනය දරා තිබුණු රු. 1,962,545 ක මුදල දඹුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් අයවිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණද එම මුදල ආයතනය වෙත ලැබී නොතිබුණි. එසේ වුවත් එම මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනයට සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මු.රෙ. 756 | 2019 වර්ෂය සඳහා පුස්තකාල පොත් සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි |
| ii. මු.රෙ. 757(2)(අ) | සමීක්ෂණ වාර්තාව අනුව වෙනස්කම් කිසිවක් තිබේනම් වගකිව යුතු නිලධාරීන්ගෙන් හෝ ඒවා සම්බන්ධ 2011, 2017 සහ 2018 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද අතිරික්තතා සහ ඌනතා සම්බන්ධයෙන් මෙකී මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | අංක PED 55 හා 2010 දෙසැම්බර් 14 දිනැති දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් මාස 03 කට වරක් පැවැත්විය යුතු වුවද ආයතනය විසින් 2017, 2018 සහ 2019 වර්ෂවල රැස්වීම් 03 ක් බැගින් පමණක් පවත්වා තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ශිෂ්‍යත්ව ලබාගෙන විදේශ රටවලට ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් නැවත මෙරටට නොපැමිණීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම වූ රු. 13,486,273 ක මුදල අය කර ගැනීමට ඵලදායී පියවරක් ගෙන නොතිබුණි.

(ආ) ආයතනය සතු නේවාසිකාගාරයේ කාමර 05 ක 2015 මැයි මස සිට 2018 ජූලි දක්වා කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් නවාතැන් ගෙන තිබුණද ඊට අදාළ කුලිය වන රු. 8,895,470 ක මුදල අය කරගෙන නොතිබුණි.

(ඇ) ණයගැති ශේෂය තුළ වර්ෂ 05 කට අධික කාලයක සිට අයවිය යුතුව තිබුණු රු. 484,529 ක පුස්තකාල පොත්, සහරාවලට අදාළ ලැබීම්, ආයතනයෙන් ලබාගත් භාණ්ඩවලට ලැබිය යුතු මුදල් සහ වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා යනාදී ශේෂ 05ක් පැවති අතර එම ශේෂය ආයතනයේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව පැවතුණි.

(ඈ) 2012 - 2015 කාල පරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියාවිරහිතව පැවති අතර, එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රිය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

(ඉ) කෘෂිකාර්මික සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා වෙනත් අදාළ පාර්ශවයන්ට පර්යේෂණ ව්‍යාපෘතිවල සොයාගැනීම් හා නිර්දේශ සම්ප්‍රේෂණය කිරීම සඳහා 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ප්‍රකාශන (Publications) සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 2.73 ක ප්‍රතිපාදනවලින් 2019 වර්ෂය තුළදී රු. මිලියන 0.775 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර මාධ්‍ය කාර්යයන් හා ප්‍රදර්ශන සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදනය යොදාගෙන කිසිදු කාර්යයක් කර නොතිබුණි.

(ඊ) ආයතනයේ ප්‍රමුඛතම කාර්යයක් වන පර්යේෂණ වැඩසටහන් සිදු කිරීමෙන් ජනනය වන පර්යේෂණ සොයා ගැනීම් හා නව දැනුම අවශ්‍ය පාර්ශවයන් වෙත (Stake Holders) ලබාදීම සඳහා හඳුනාගත් වැඩසටහන් වාර්ෂිකව හෝ යම් කාලසීමාවකට වරක් විධිමත්ව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ අතර 2017, 2018 හා 2019 වර්ෂවලදී පර්යේෂණ වාර්තා එළි දැක්වීමේ කාර්යය සඳහා ක්‍රියාකාරී සැලසුම් මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. එසේම, 2016 වර්ෂයේ රු. 1,801,264 ක් වැය කර ආයතනය විසින් ආරම්භ කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති 02 ක් 2017 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කළ යුතුව තිබුණද එම කාර්යයන් අවසන් කර නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් කාලීන අවශ්‍යතා මත සිදුකරන පර්යේෂණ වැඩසටහන් තුළින් ලබාදෙන නිර්දේශ නියමිත කාලසීමාව තුළ අදාළ පාර්ශව වෙත ලැබී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

Fin/Aud/Qry/2019 ඒජීඑල්/ඩී/එච්ඒආර්/01/19/16 2020-12-15

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**<u>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

2020-08-13 දිනැතිව යොමුකරන ලද උක්ත වාර්තාවට අදාල කරුණු පැහැදිලි කිරීම මේ සමග ඉදිරිපත් කරමි.

1.2

(අ) එකඟවෙමි.

ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් එළිදරවු කිරීමට කටයුතු කරමි.

(ආ) එකඟවේ.

මෙය ස්ථාවර වත්කම් අපහරණ විකුණුම් අලාභය නොවන අතර පරිභෝජන භාණ්ඩ විකුණුම් අලාභය වේ. මෙම අලාභය වන රු.308,502/- මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දක්වා ඇත්තේ මෙම ගණුදෙනුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර ඇති බැවිනි. ඉදිරියේදී පෙන්වාදී ඇති පරිදි මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ තොරතුරු ඉදිරිපත් කරමි.

(ඇ) පැල්වෙහෙර සංචාරක නිකේතනය වෙනුවෙන් මුදල් ලැබී නොතිබුණද එම මුදල අයවියයුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල අයවීම පැල්වෙහෙර සංචාරක නිකේතනය යන වත්කමේ ක්ෂය කපාහල පසු අගය වන බැවින් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කර ඇත.

2.(අ) i. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශන චක්‍ර ලේඛ අංක 2004/පු.ස./01 අනුව අස්ථානගතවූ පොත් වර්ෂ 2කට වරක් ගණනය කළ යුතුවේ. නමුත් ඉදිරියේදී මු.රෙ. 756 ප්‍රකාරව වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණය සිදු කරමි. නමුත් 2019 වර්ෂයේ මුදල් අංශය හා පුස්තකාල අංශය ඒකාබද්ධවී පුස්තකාලයේ ඇති පොත් අසුරා ඇති රාක්ක වශයෙන් තොරතුරු ගෙන එය වෙන වෙනම පහසුවෙන් හඳුනාගත හැකි පරිදි පරිගණක ගත කරන ලදී.

**ii.** ආයතනය විසින් පුස්තකාල පොත් සමීක්ෂණයක් කර තිබුනද පොත් අතිරික්ත හා ඌනතා වෙනුවෙන් කටයුතු කර නොතිබුණි. නමුත් 2019 වර්ෂයේ සිට එම අතිරික්ත හා ඌනතා පැහැදිලිව හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතී. 2020 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණය සිදුකිරීමෙන් අනතුරුව මෙම සියලුම ගැටළු නිරාකරණය කිරීමට පියවර ගනිමින් සිටී.

**(ආ)** 2019 වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් 03ක් පැවැත්වූ අතර අවසාන කමිටු රැස්වීම එම වර්ෂයේ දෙසැම්බර් මස මුල් සතියේ පැවැත්වීමට කටයුතු යොදා තිබුණු අතර 2019 නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් පසුව ඇති වූ නව රජය බලයට පත්වීමත් සමඟ අධ්‍යක්ෂ මණ්ඩල අහෝසි වූ අතර එකී හේතුවෙන් විගණන කමිටු රැස්වීම සඳහා පාලක මණ්ඩල සාමාජිකයින් පත් කර ගැනීමට නොහැකි විය.

2017 සහ 2018 වර්ෂ සඳහා ආයතනයේ ස්ථිරව ලේඛකාධිකාරී වරයෙකු නොසිටි බැවින් එවකට සිටි අධ්‍යක්ෂවරුන් විසින් විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට අතපසු වී ඇති බව පෙනී ගොස් ඇත.

3. (අ) 2019 වර්ෂය ආරම්භයේදී විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය රු. 15,387,897.91 ක් පැවති අතර 2019 වර්ෂය තුළ රු. 1.901,629.37 ක් අයකරගෙන ඇත. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය රු. 13,486,273.54 වේ. 2019 වර්ෂයතුළ මෙම අයකරගැනීම සිදුකරනු ලබන්නේ ආයතනය විසින් ගනු ලැබූ උපායශීලී ක්‍රියාමාර්ග හේතුවෙනි. මෙම පවතින ශේෂයද අයකර ගැනීමට විධිමත් පියවර ආයතනය විසින් ක්‍රියාත්මක කරමින් පවතී. තවද 2020 වර්ෂය තුළ රු. 596,392/- අයකර ගෙන ඇත. මේ වනවිට විදේශ ශිෂ්‍යත්වලභී ණයගැති ශේෂය රු. 12,889,881.54 ක් වේ.

(ආ) උක්ත කරුණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශ ඇතුලත් වාර්තාවක් අංක 379 දරණ පාලක මණ්ඩලය වෙත යොමුකර ඇත. පාලක මණ්ඩලය විසින් විගණන කළමනාකරණ කමිටුවේ නිර්දේශවලට යටත්ව ගිණුම්ගත කිරීමට අනුමතකර ඇත. නමුත් මෙම වාර්තාව ගැඹුරින් අධ්‍යයනය කළ විගණන හා කළමනාකරණ කමිටුව ගිණුම් ගත කිරීමට ප්‍රථමයෙන් පාලක මණ්ඩලයට නැවත යොමුකර මෙම ආදායම අයකර ගැනීම පිළිබඳව ඉදිරි කටයුතු පිළිබඳ සුදුසු තීරණයක් සඳහා අනුමැතියක් ලබා ගන්නා ලෙස උපදෙස් ලබාදෙන ලදී.

මේ අනුව ඉදිරියේදී පැවැත්වෙන පාලක මණ්ඩලය වෙත මෙම වාර්තා යොමුකර අදාල අනුමැතියන්ට අනුකූලව ගිණුම්ගත කිරීමට හා අදාල අයකර ගැනීම් සිදුකිරීමට කටයුතු කරමි.

(ඇ) ආයතනයේ සේවයකර විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවියයුතු වර්ෂ 05කට වඩා වැඩි ශේෂය රු. 484,529.87 වේ. එම ශේෂය සැකසී ඇති ආකාරය පහත පරිදි වේ.

(1) **එම්.ජී.එම්. රශාක් මහතා - රු. 212,819.90**

මෙම රශාක් මහතා විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෙකුගේ ඇපකරුවකු වන අතර ඔහුගේ ලිපිනය සොයාගැනීමට නොමැත. ඔහුටද විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් යටතේ නීති කටයුතු සිදුකරමින් පවතී.

(2) **එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතා - රු. 26,382.35**

එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතාගෙන් 2011-09-03 දිනට සේවය හැරයාමේදී අයවියයුතු මුදල රු. 152,525.25 වේ. නමුත් මෙම ශේෂය අන්තර්ගතවී ඇති ආපදා ණය මුදල ආයතනයේ දැනට සේවය කරන ඇපකරුවන්ගෙන් අයකරමින් පවතී. එබැවින් මොහුගෙන් 2019-12-31 දිනට අයවිය යුතු ශේෂය රු. 26,382.35 වේ. නීතිමය කටයුතු සඳහා යොමුකර ඇත.

(3) **එල්.කේ. ජයසේකර මහතා**

ආයතනයේ සේවකල අධ්‍යක්ෂවරයෙක් වේ. 2015-01-09 දිනට ජයසේකර මහතාගෙන් අයවියයුතු ශේෂය රු. 29,086.38 වේ. නීතිමය කටයුතු සඳහා යොමුකර ඇත.

(4) **රංගන අතුකෝරල මහතා - රු.19,474.50**

2014-06-03 දිනට සේවය හැරගිය මොහුගෙන් ආයතනයට අයවියයුතු ශේෂය රු. 19,474.50 වේ. මෙම මුදල මොහුගෙන් අයකර ගැනීමට නීතිමය කටයුතු සඳහා යොමුකර ඇත.

(5) **ඒ.එම්.ඩී.එන්. තෙන්නකෝන් මහතා**

ඒ.එම්.ඩී.එන්. තෙන්නකෝන් මහතාගෙන් රු. 196,767.29 අයවීමට පවතී. මෙම ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඈ) 2019 මාර්තු 04 දින ආයතනයේ අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකුගෙන් සැදුම්ලත් කමිටු ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් සිදු කර මෙය පවත්වාගෙන යාම ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන බවත් එම පද්ධතිය තුළ නැවතත් ආයෝජනයක් නොකිරීමටත් තීරණය කර තිබුණි. එමෙන් ම එවක (2012) ආපනශාලාවෙන් දිනපතා ඉවත් වන ආහාරමය කාබනික අපද්‍රව්‍ය කළමනාකරණයේ ගැටළු පැවතිය ද වර්ථමානයේ එම කාබනික අපද්‍රව්‍ය සත්ත්ව ආහාර ලෙස ලබා දී ආපනශාලාව විසින් වැඩි මුදලක් උපයා ගනී. එම තත්ත්වය තුළ ජීව වායු නිපදවීම සඳහා කාබනික අපද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රමාණවත් නොවීම හා ජීව වායු ඒකකය පවත්වා ගෙන යාම සඳහා පෙළඹවීම අවම වී ඇත. එමෙන් ම පද්ධතිය කාලයක් සමඟ ක්ෂය වීම තුළ නැවත එය යථා තත්ත්වයට පත් කිරීමටත් දැනට පවතින නව තාක්ෂණික ක්‍රමවේද වලට පද්ධතීන් යාවත්කාලීන කිරීමත් ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන තත්ත්වයක පවතී. මේ වන විට මෙම පද්ධතියට වසර 8ක ආයු කාලයක් ඇත.

(ඉ) 2019 වර්ෂය සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු, මහජන දේශන යන වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 0.75 වෙන් කළද 2019 දෙසැම්බර් 31 දින වැය කර ඇති මුදල රු.මිලියන 0.253කි.

මෙයට ප්‍රධාන හේතුව වන්නේ අනපේක්ෂිත ලෙස සිදු වූ පාස්කු ප්‍රහාරය සමඟ සම්මන්ත්‍රණ සහ වැඩමුළු වැනි ජනයා ඒකරාශි කරන වැඩසටහන් මාස කීහිපයක කාලයක් නොපැවැත්වීම නිසා සැලසුම් කරන ලද කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

(ඊ) පර්යේෂණ ග්‍රන්ථ එළිදැක්වීමේ සම්මන්ත්‍රණ 2017 සිට 2019 කාලය තුළ සැලසුම් කර නොමැත. මේ සඳහා අදාල ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවත්වීම සඳහා කටයුතු කරනු ඇත.

R- 513 පර්යේෂණ වාර්තාව

2016 වසරේ ආරම්භ කරන ලද මෙම පර්යේෂණ වාර්තාව අවසන් අදියරේ පවතී. එසේම මෙම අධ්‍යයනයේ පර්යේෂණ වාර්තාව Working paper එකක් ලෙස 2019 ජුනි මස අවසන් වන විට අවසන් කරන මෙන් දැනුම් දී තිබුණි. නමුත් පර්යේෂණය

සම්බන්ධීකරණය කළ පර්යේෂණ නිලධාරියාට තිබූ අධික කාර්ය බහුලකම නිසා මෙම වැඩ අතපසු වි ඇති අතර, එය කඩිනම් කිරීමට පියවර ගන්නා බව දන්වමි.

R- 511 මෙම පර්යේෂණ යෝජනාව 2016 වර්ෂයේදී පර්යේෂණ වැඩ සටහනට ඇතුලත් කළද 2016.09.15 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී තනි වැවක් වෙනුවට එල්ලංගා පද්ධතියම අධ්‍යනය කිරීමට සහ වැව් පතුල ගොඩවීම සම්බන්ධ ඉංජිනේරු සහ පාංශු සමීක්ෂණයන් සිදු කිරීමට උපදෙස් ලබාදුනි. එම නිසා පර්යේෂණ යෝජනාව සහ ක්‍රමවේදය වෙනස් කිරීමට සිදු වී ඇත.

සමාජ ආර්ථික අධ්‍යයනය අප ආයතනයෙන් සිදුකරන අතර අදාල තාක්ෂණික දැනුම බාහිර පාර්ශවයකගේ සහයෝගයෙන් කිරීමට සිදු විය. එහිදී සැලකිය යුතු ප්‍රමාදයක් සිදු විය.

එසේම මෙම පර්යේෂණ ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන නොමැති කම හේතුවෙන් අවශ්‍ය තොරතුරු ලබාගැනීම ඩිජිටල් දත්ත මඟින් සිදුකර අධ්‍යයනය අවසන් කර මේ වන විට ඉංග්‍රිසි භාෂා සංස්කරණය සඳහා සුදානම් කොට ඇත. ඉන් පසු මුද්‍රණය කිරීමට ඇත. පර්යේෂණයේ සොයාගැනිම් ප්‍රතිපත්ති සම්පාදන කිරීමේ වැඩමුළු වලදී අදාල පාර්ශවයන් වෙත ලබා දී ඇත.

තවද වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් වාරි පනත සංශෝධනය කිරීමේ දී අප ආයතනයේ සහභාගීත්වයද ලබාදුන් අතර මෙම අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු ද ඊට දායක විය. මෙයට අමතරව මෙම අධ්‍යයනය පදනම් කරගෙන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය පත්‍රිකාවක් මුදල් රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි

පිටපත්: ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැ:ස:
ලේකම්, මුදල් අමාත්‍යාංශය - කාරුණික දැ:ස: